# බස්නාහිර පළාතේ පළාත් සභාව

மேல் மாகாண மாகாண சபை

WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2014** ජුනි **03** වන අඟහරුවාදා

2014 ஆணி 03 செவ்வாய்க்கிழமை

Tuesday 03rd June 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல. 204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.56 ට පළාත් සභාව රැස් විය.**

மு.ப. 09.56 க்கு சபை கூடியது

The Provincial Council met at 09.56 a.m.

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**

*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*

*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

## සභාපතිවරයාගේ නිවේදනය

## ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

*"බස්නාහිර පළාත් සභාවේ VI වන පළාත් සභාව සඳහා තේරී පත් වූ සියලුම ගරු මන්ත්‍රීවරුන් සඳහා පළාත් සභා ක්‍රමය, පළාත් සභාවේ ව්‍යවස්ථාදායක කාර්යභාරය, කාර්යපටිපාටි රීති සහ පළාතේ සංවර්ධන සැලැස්ම යන ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි පුහුණු වැඩමුළුවක් 2014 ජුනි මස 20, 21 හා 22 යන දිනවලදී හලාවත අනන්තය රිසෝට් ඇන්ඩ් ස්පාහි දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. එම පුහුණු වැඩමුළුව සඳහා සහභාගි වන මෙන් ඔබතුමන්ලා සියලුදෙනා වෙත ගෞරවයෙන් ඇරයුම් කරනවා.*

*මෙම පුහුණු වැඩ මුළුවේ කටයුතු සංවිධානය කිරීමේ පහසුව සඳහා ඔබතුමන්ලාගේ සහභාගීත්වය සනාථ කරගත යුතු බැවින් සභා ලේකම්ගේ 2014.06.02 වැනි දින ලිපිය සමඟ වන ආකෘති පත්‍රය සම්පූර්ණ කර සභා ලේකම්තුමාට භාර දෙන ලෙස ඉතාමත්ම කාරුණිකව ඉල්ලා සිටිනවා."*

## කාරක සභා වාර්තා

## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම පිළිගන්වනවා.

i. 2014.05.20 වන දින පැවැති සභා කටයුතු කාරක සභා රැස්වීම් වාර්තාව සහ ගෘහ කාරක සභා රැස්වීම් වාර්තාව

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

## පෙත්සම්

## PETITIONS

**ගරු ඇස්.කේ. කිඳෙල්පිටිය**

Hon. S.K. Kindelpitiya

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම මම ඉදිරිපත් කරනවා.

i. මාකොළ, මාකොළ උතුර, අංක 1/28 හි පදිංචි ජේ.කේ.ජේ.ඒ. පෙරේරා යන අයගේ පෙත්සම සහ

ii. කොළොන්නාව, ශ්‍රී ආනන්දාරාම මාවතේ, අංක 13/6 හි පදිංචි සරත් කරුණාතිලක යන අයගේ පෙත්සම.

**ගරු රෝහණ ප්‍රියංකර අබේගුණවර්ධන**

Hon. Rohana Priyankara Abeygunawardhane

ගරු සභාපතිතුමනි, අගලවත්ත, උඩවෙල, විතානවත්ත හි පදිංචි ඩී.ඒ. සමන් ප්‍රසන්න යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න කැමැතියි. ඔබතුමා දන්නවා, මේ වනකොට ඇති වෙලා තිබෙන ජල ගැලීම් තත්ත්වය හා ජනයාගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීමට ලක් වෙලා තිබෙන කාරණය. වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට මට ඉදිරිපත් කරන්න හැකි වෙලා තිබෙන්නේ, මාත් එනකොට මගේ ගමන් මාර්ගය මට වෙනස් කරන්න සිද්ධ වුණා. ඊට හේතුව ගංවතුරට යට වීමේ ස්වභාවය නිසාම. අනික් පැත්තෙන් ගෙවල් දොරවල්වලට ගස් කඩා වැටීම වාගේ දේවල් සිද්ධ වෙලා අද විශාල ජනතාවක් ඉතාම අසීරු අමාරු තත්ත්වයකට පත් වෙලා ඉන්නවා. මම හිතන්නේ, මේ වනකොට විවිධ අනතුරුවලට ලක් වෙලා මිය ගිය සංඛ්‍යාව 20, 25 දක්වා වැඩි වෙමින් තිබෙනවා. අනාථ වුණු පුද්ගලයන්ට සමහර වේලාවට අවශ්‍ය ආහාර පාන, වෙනත් පහසුකම් ලබා දීමට නොහැකි තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, අපි ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයට ඉඩ දෙනවා. අනිවාර්යයෙන්ම ඉඩ දෙනවා. නමුත් මේ අවස්ථාවේදී ඔබතුමා ගංවතුර පිළිබඳ ප්‍රකාශයක් කරන්නේ. ඒ පිළිබඳව අපි න්‍යාය පත්‍රයේ -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සඳහා ඔබතුමාට අවස්ථාව පසුව ලබා දෙනවා. අපි -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසාම මම මේ කියන්නේ, බස්නාහිර පළාත් සභාව හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරලා, ඒ වාගේම අමාත්‍යාංශ සියල්ලම ඒකාබද්ධ කරලා, ඒකාබද්ධ වැඩ සටහනක් සකස් කරලා මේ තත්ත්වයට මුහුණ දීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළක් යොදන්නය කියලා ඉල්ලා සිටිනවා. පළාත් සභාවේ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරලා, අද දවසේ රැස්වීම වුණත් අත්හිටුවලා මේ ජනයාගේ අවශ්‍යතා සම්පූර්ණ කරන්න, අවශ්‍ය පහසුකම් සපයන්න විපක්ෂයක් විධියට අපි සම්පූර්ණ සහයෝගය මේ වෙනුවෙන් ලබා දෙනවාය කියන එක මතක් කරමින් යෝජනාවක් විධියට මම මෙය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම යෝජනා ඔබතුමාට දැනට ඉදිරිපත් කරන්න බැහැ. ඔබතුමා නැඟී සිටියේ, වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න. එතුමා අන්තිමට යෝජනාවක් ඉදිරිපත් කළා. නමුත් මේ ප්‍රශ්නය පිළිබඳව අපිත් අවධානය යොමු කරනවා. මොකද, මේ වන විට රජය සහ බස්නාහිර පළාත් සභාව විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ මැති ඇමැතිවරු හැම කෙනෙක්ම මේ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. ඉදිරියේදී න්‍යාය පත්‍රය යන අතරතුරේ ඒ මන්ත්‍රීතුමන්ලාට අදහස් ප්‍රකාශ කරන්න අපි අවස්ථාව ලබා දෙනවා. ඒ නිසා අපි මේ න්‍යාය පත්‍රයට ගිහිල්ලා ඒ සඳහා අවස්ථාවක් ඉදිරියේදී ලබා දෙනවා.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 01. අජන්ත නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා )
Hon. Upali Kodikara (Electricity and Power, Provincial Roads, Housing and Construction, Water Supplies and Drainage, Social Welfare and Urban and Estate Infrastructure Facilities and Acting Chief Minister)

ගරු සභාපතිතුමනි, ප්‍රශ්න අංක 01 සඳහා සති දෙකක කාලයක් කල් ඉල්ලනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ගියවර සභාවේදී එම ප්‍රශ්නයට උත්තර ලැහැස්ති වෙලා ආවා කියලා කිව්වා. උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා උත්තරේ දෙන්න ලැහැස්ති වෙලා හිටියා කියලා එදා කිව්වා. අද වැඩ බලන මහ ඇමැතිවරයාට ඒක දීලා නැද්ද දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඒ පිළිබඳව මොනවා හරි දැනුවත් කිරීමක් තිබෙනවාද?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතුමා ඒ පිළිබඳව දැනුවත්වීමක් නැහැ. ගරු මහ ඇමැතිතුමා සුමාන දෙකකින් එනවා. එතකොට පිළිතුරු ඉදිරිපත් කරයි.

ප්‍රශ්න අංක 02. ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

ප්‍රශ්න අංක 02 ට සති දෙකක කාලයක් කල් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 03. ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස ඉදිකිරීම්, ජලසම්පාදන, ජලප්‍රවාහන, සමාජ සුභසාධන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

ගරු සභාපතිතුමනි, නිශ්චිත ස්ථාන සඳහන් කරන්නේ නම් පිළිතුරු දිය හැකියි. එතුමා තිබෙන ප්‍රශ්නය අනුව, අහලා තිබෙනවා පාරවල්වලට වන්දි ලබා ගැනීමකින් තොරව තම ප්‍රමාණයන් පාර සංවර්ධනයට නිදහස් කළ ස්ථාන ඇතිද යන්න. පාරවල් පවරාගෙන තිබෙනවා. පළල් කරලා තිබෙනවා. වන්දි දෙන්නේ කොහොමද කියලා ඒ ප්‍රශ්නය අහලා තිබෙනවා. ඊළඟ එක අහලා තිබෙනවා, ලයිට් කණු ගලවන්නේ කොහොමද? ඉවත් කරන්නේ කොහොමද කියලා ටෙලිෆෝන් කණු. එතකොට මට ඒකට එකපාරම උත්තරයක් දෙන්න බැහැ. ඒ ප්‍රශ්නය නිවැරැදිව අහලා නැහැ. මගෙන් නිවැරැදිව ප්‍රශ්නය ඇහුවොත් එහෙම කොයි පාරේද? කොයි කොයි ස්ථානවලද? සැතපුමේද කියලා ඇහුවොත් මට පුළුවන් මේකට නිවැරැදිව පිළිතුරක් දෙන්න. ඒ නිසා දැනට ඒ අනුව මම මේක ගරු සභාපතිතුමා මඟින් සභාවට ඉදිරිපත් කරනවා. එවැනි ස්ථාන වේ නම් කරුණාකර සඳහන් කරන්න. නිශ්චිත ස්ථාන සඳහන් කරන්නේ නම් පිළිතුරු දිය හැකිය. මාසයකින් දෙනවා.

ඒ එක්කම 'ඇ' ප්‍රශ්නය නිශ්චිත ස්ථාන සඳහන් කරන්නේ නම් පිළිතුරු දිය හැකිය. තුනම තිබෙන්නේ එකයි. 'ඇ' යන්න ප්‍රශ්නය පැන නොනගී. 'ඉ' ප්‍රශ්නය පැන නොනගී.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, දැන් මේ ප්‍රශ්නයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අතුරු ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්. තුනයි.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

දැන් අතුරු ප්‍රශ්න අහන්න, අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න එපැයි ගරු සභාපතිතුමනි. ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැතිව මට අතුරු ප්‍රශ්න අහන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ. බැහැ. පැහැදිලියි.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

එතකොට මේ ප්‍රශ්නය න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා තිබෙන්නේ මම අහලා තිබෙන ප්‍රශ්නය නිවැරැදි නිසා. මම අහලා තිබෙන ප්‍රශ්නය වැරැදි නම් මේ ප්‍රශ්නය න්‍යාය පත්‍රයට දාන්න බැහැ. න්‍යාය පත්‍රයට දැම්මාට පස්සේ, ඊට පිළිගැනීම තිබෙන්නේ මේකට උත්තරයක් තිබෙනවා කියලා. එතකොට මේකේ පැහැදිලිව අ, ආ, ඇ, ඈ, ඉ කියලා තිබෙනවා. එතකොට මම අහනවා මේක පිළිගන්නේද? නැත්නම් 'අ' යන්නට කියන්න ඕනෑ, නැත කියලා. ඉන් පසුව තමයි මට අතුරු ප්‍රශ්න තිබෙන්නේ. දැන් මේක හරියට නිකන් පැහැදිලි නැති, මීටරය හරියට අහුවුණේ නැති රේඩියෝ චැනල් තිබෙන්නේ. ඒ වාගේ මේක. මට පැහැදිලි නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි ගරු මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

107.6 එකට 107.55 වුණාට පස්සේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දිගින් දිගටම අවස්ථාව දෙන්න බැහැ, ඔබතුමාට. වැඩ බලන ගරු මහ ඇමැතිතුමා -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ මට නොවෙයි. කමිටුවට. එතකොට මමයි ඇමැතිවරයා. එතකොට මේ ප්‍රශ්න මොකක්ද කියලා මට තේරුම් ගන්න බැරුව ඇමැතිවරයා හැටියට මට උත්තරේ දෙන්න බැහැ. එතකොට මේ ප්‍රශ්නයක් -

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

මට ඒකට ඔළුවක් දෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම එය කොමිටියට යොමු කරලා න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා. මගේ යුතුකමක් තිබෙනවා, මෙතුමාට පිළිතුරක් අවශ්‍ය නම් ඒක ලබා දෙන්න. නිවැරැදි කරලා මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කියන එකයි මම කියන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

ගරු සභාපතිතුමා එහෙමනම් කමිටුව වගකියන්න වෙනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

ඒක මගේ යුතුකම.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

මේක නිවැරැදි කරන්න දෙයක් නැහැ. මේක නිවැරැදි කරන්න කියලා මෙම ප්‍රශ්නයෙහි වැරැද්දක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

ඒක මගේ වරදක් නොවෙයි. ඒ නිසා තමුන්නාන්සේට මේ සම්බන්ධව තේරුම් නැති වුණාට මම කනගාටු වෙනවා. තමුන්නාන්සේ මීට වඩා තේරුම් කරගන්න. වගකීමක් තිබෙන දේශපාලන පක්ෂයක් හැටියට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්. වැඩ බලන ගරු මහ ඇමැතිතුමා, මෙතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්න මාලාව අපි සභා කටයුතු කාරක සභාවට ඉදිරිපත් කරලා, සභා කටයුතු කාරක සභාවෙන් තීන්දුවක් අරගෙන තමයි අපි න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නේ. ඒ ප්‍රශ්නය

පිළිගත්ත නිසා අපි ඒක ඔබතුමාට ඉදිරිපත් කළේ. ඔබතුමා ඒ ප්‍රශ්නයට නිවැරැදි උත්තරයක් ලබා දෙන්න. එතුමා අහලා තිබෙන ප්‍රශ්නවලට. නැත්නම් කල් ඉල්ලා ගන්න. ඔබතුමා මේ වන විට ඒ සම්බන්ධයෙන් දැනුවත් භාවයක් නැත්නම් ඒ ප්‍රශ්නයට කල් ඉල්ලා ගන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

ගරු සභාපතිතුමනි, පැහැදිලි ප්‍රශ්නයක් එන්න ඕනෑ, ප්‍රශ්නයකට උත්තරයක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. ඒ නිසා ඔබතුමා ඒ සම්බන්ධයෙන් කල් ඉල්ලා ගන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

ඒක තමයි නිවැරැදි කරලා නැවත ඉදිරිපත් කරන්න කියලා කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි, සභා කටයුතු කාරක සභාවෙන් නිවැරැදි කිරීම් කරලා තිබෙනවා. අදාළ නිවැරැදි කිරීම් කටයුතු කරලා තිබෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කල් ඉල්ලා ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කල් ඉල්ලා ගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

මට ඔබතුමාගෙන් උත්තරයක් ඕනෑ, මේ සභාව -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

යළිත් ප්‍රශ්නය ඉදිරිපත් කළාම මම මාසයක් ඇතුළත උත්තර දෙනවා .

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ඉතින් එහෙම කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මාසයක් එතුමා කල් ඉල්ලා සිටිනවා.

හතරවැනි ප්‍රශ්නයත් ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් වැඩ බලන ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමේ අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

ගරු සභාපතිතුමනි, මම ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

හතරවැනි ප්‍රශ්නයට සති දෙකක කාලයක් කල් ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පස්වැනි ප්‍රශ්නය යූ. ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

වැඩ බලන ගරු මහ ඇමැතිතුමාට ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

පස්වැනි ප්‍රශ්නයටත් සති දෙකක කාලයක් කල් ඉල්ලනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු සභාපතිතුමනි, ඒක කාලීන ප්‍රශ්නයක්. මේ වේලාවේ අපට උත්තර ඕනෑ. ව්‍යූහ කමිටුවත් තවම පවත්වලා නැහැ. මේවාට උත්තර දෙන්න මේ වැඩ බලන මහ ඇමැතිට වැඩ පවරලා නැද්ද මම දන්නේ නැහැ. මම අහලා තිබෙන්නේ

[ ගරු යූ. ජෝර්ජ් පෙරේරා ]

කාලීන, මේ පළාත් සභාව ගෙනියන්න ඕනෑ ප්‍රශ්නයි. අධ්‍යාපනයේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න බැහැ. එතුමා වැඩ බලන මහ ඇමැති -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

බලය පවරලා නැහැ. බොරුවට නිකන් කොළයක් අත්සන් කරලා වැඩ භාර දීලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙනම දෙයක්.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

මම ඊයේ වැඩ භාර ගත්තේ. මට එහෙම උත්තරයක් දෙන්න බැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මේක කාලීන අවශ්‍යතාවයක්. ඔබතුමාත් අධ්‍යාපන අධ්‍යක්ෂ -

***අනතුරුව ප්‍රශ්නය අදාළ සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*Later, Hon. Chairman ordered to refer the question to the relevamt Council sitting.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හයවන ප්‍රශ්නය. අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමා විසින් වැඩ බලන ගරු ප්‍රධාන ඇමැතිතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව.

**ගරු අශෝක දයාරත්න**
Mr. Ashoka Dayarathne

ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්නය මම යොමු කරනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

හයවැනි ප්‍රශ්නයටත් සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

***අනතුරුව ප්‍රශ්නය ඊළඟ සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*Later, Hon. Chairman ordered to refer the question to the next Council sitting.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හත්වැනි ප්‍රශ්නය සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමේ අවස්ථාව.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

හත්වැනි ප්‍රශ්නයටත් සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මෙම ප්‍රශ්නය මේ පළාත් සභාවට ඉතාම අත්‍යවශ්‍ය සහ වැදගත් ප්‍රශ්නයක් වෙනවා. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව එකතු කරන ලද මුදල් නීත්‍යානුකූල වනවාද නැද්ද කියන කාරණය තීරණය වන ප්‍රශ්නයක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මීළඟ වාරයේ අනිවාර්යයෙන් පිළිතුරු දීමට ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අටවැනි ප්‍රශ්නය මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමේ අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

අට වැනි ප්‍රශ්නයටත් සති දෙකක් කල් ඉල්ලනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මම ගිය සභා වාරයේදීත් මගේ කථාවේදී අවධාරණය කළා බස්නාහිර පළාතේ වැඩ බලන විදුහල්පතිවරුන් ගැන. මොකද මේ ප්‍රශ්නය ඉතාම වැදගත්. මේ වන විට කොළඹ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මේ අවස්ථාවේදී ඒ ගැන අදහස් ප්‍රකාශ කරන්න දෙන්න අමාරුයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයටත් එතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කල් ඉල්ලා තිබෙනවා. නමුත් ඔබතුමාට ඒ සම්බන්ධයෙන් කාලය දෙන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කොළඹ අසෝක විද්‍යාලය මේ වන විට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි පස්සේ කථා කරමු.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගුරුවරු 27 කට වැඩිය මාරු කරලා තිබෙනවා. සම්පූර්ණයෙන් අධ්‍යාපනය කඩා වැටිලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී අදහස් ප්‍රකාශ කරන්න දෙන්න මට අමාරුයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ ප්‍රශ්නය නිසා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වැඩ බලන විෂයය භාර ඇමැතිතුමා කල් ඉල්ලා තිබෙනවා. ඒ නිසා මට කාලයක් දෙන්න බැහැ.

## මීගමුව බසියාවත්ත තලාහේන මාතෘ නිවාසය
## THALAHENA MATERNAL HOME AT BASIYAWATTE, NEGOMBO

**09.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂණ සේවා සහ සභා කටයුතු ගරු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/14/02)**

අ. මීගමු ඡන්ද කොට්ඨාශයේ බසියාවත්ත තලාහේන වසර 70 වකට වඩා පැරණි මාතෘ නිවාසයක් තිබෙන බව ඔබ දන්නේද?

ආ. එම ප්‍රදේශයේ පවුල් 5000 කට වැඩි ප්‍රමාණයකට මෙම මාතෘ නිවාසය මගින් විශාල සේවාවක් වූ බව ඔබ දන්නේද?

ඇ. මෙම ප්‍රදේශයේ ජීවත් වන මෙම ජනතාවට කි.මී. 9 දුරබැහැර පමුනුගම රෝහලට හා කි.මී. 10 දුරබැහැර මීගමුව රෝහලට ප්‍රතිකාර ලබා ගැනීමට යා යුතු බව ඔබ දන්නේද?

ඈ. ඉතිහාසයේ සිට ප්‍රදේශයේ ජනතාවට සුවිශාල සේවාවක් ඉටු වූ අක්කර දෙකකට වැඩි භූමි භාගයක් සහිත මෙම මාතෘ නිවාසය මේ වන විට කිසිදු නඩත්තුවක් නොකිරීම නිසා ගරා වැටී ඇති බව ඔබ දන්නේද?

ඉ. එසේ නම් එය අලුත්වැඩියා නොකරන්නේ මන්ද? එය යළි ප්‍රතිසංස්කරණය කරන්නේ නම් කවදා සිටද?

ඊ. තලාහේන ප්‍රජාමූල සංවිධානය මගින් මෙය අලුත්වැඩියා කිරීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව ඔබ දන්නේද?

උ. එසේනම් ඒ පිළිබඳ තොරතුරු මේ සභාවට ඉදිරිපත් කරන්නේද?

ඌ. මෙම මාතෘ නිවාසය සඳහා ස්ථිර වෛද්‍යවරයකු ලබා නොදෙන්නේ මන්ද?

එ. ස්ථිර වෛද්‍යවරයකු ලබා දෙන්නේ නම් කවදා සිටද? එතෙක් දැනට සිටින වෛද්‍යවරියගේ සේවා වේලාවන් නිශ්චිත කරන්නේද?

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)

Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

අ. පිළිතුර

දනිමි. නමුත් මෙම මාතෘ නිවාසය වසර 70 කට වඩා පැරණි නොමැත.

**පසුබිම් වාර්තාව**

මෙම ස්ථානයේ පිහිටි මධ්‍යම බෙහෙත් ශාලාව හා මාතෘ නිවාසය වසර 67 කට පෙර ආරම්භ කර ඇත. මෙය විවෘත කර ඇත්තේ 1947 ජූලි 12 වන දින එවකට සෞඛ්‍ය අමාත්‍යව සිටි ගරු ජෝර්ජ් ඊ ද සිල්වා මැතිතුමා විසිනි.

ආ. පිළිතුර

දනිමි. නමුත් දැනට පවුල් 5000 කට වැඩි ප්‍රමාණයකට මෙහි පිහිටි මධ්‍යම බෙහෙත් ශාලාව මගින් සැලකිය යුතු සේවාවක් සිදුවේ.

**පසුබිම් වාර්තාව**

එම ප්‍රදේශයට අයිති ග්‍රාම නිලධාරි වසම් 04 වන එනම් බසියාවත්ත, අළුත්කුරුව, තලාහේන හා කැපුම්ගොඩ යන කොට්ඨාශවල ජනතාවට මෙම මධ්‍යම බෙහෙත් ශාලාව හා මාතෘ සායනය මගින් සැලකිය යුතු සේවාවක් මීට දශකයකට පමණ පෙර ලබා දී ඇත. නමුත් කි.මී 10 ආසන්නව පිහිටි මීගමුව රෝහල 2005 වර්ෂයේදී දිස්ත්‍රික් මහ රෝහලක් තත්ත්වයට උසස් කර ඇති අතර එමගින් විශේෂඥ ප්‍රසව හා මාතෘ සේවාවන් සපයනු ලබයි. එබැවින් ගැබිනි මව්වරුන්හට දරු ප්‍රසූතියේදී වඩා ගුණාත්මක සේවාවක් නාරි හා ප්‍රසව විශේෂඥ වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු සේවය කරන මීගමුව රෝහල මගින් සැලසේ. එනිසා මෙහි පිහිටි මාතෘ නිවාසය තුළ මව්වරුන් සඳහා පෙර ප්‍රසව සායන පමණක් පවත්වාගෙන යනු ලබන අතර මධ්‍යම බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යමින් බාහිර රෝගී අංශයට පැමිණෙන රෝගීන්ට ප්‍රතිකාර ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සලසා ඇත.

ඇ. පිළිතුර

දනිමි. පමුනුගම රෝහල මෙම මධ්‍යම බෙහෙත් ශාලාවට කි.මී. 09 ක් ආසන්නව පිහිටා ඇති අතර මීට වඩා වෛද්‍ය නිලධාරීන් වැඩි ප්‍රමාණයක් සේවය කරන පර්යන්ත රෝහලකි. මීගමුව දිස්ත්‍රික් මහ රෝහල ද්විතියික රෝගී සත්කාර සපයන අතර කි.මී. 10 ක් ආසනයේ පිහිටා ඇත. ප්‍රාථමික මට්ටමේ සිට ඊට වඩා ඉහළ මට්ටම්වල පිහිටි රෝහල් සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට ජනතාව යායුතු බව සියලුදෙනා අවබෝධ කරගත යුතු තත්ත්වයකි.

**පසුබිම් වාර්තාව**

රජයට අයත් සියළුම රෝහල් ප්‍රාථමික, ද්විතියික හා තෘතියික මට්ටමේ රෝහල් ලෙස වර්ග කර ඇත. රෝගී ජනතාවටද තම අවශ්‍යතා සඳහා ඕනෑම රෝහලකින් ප්‍රතිකාර ලබා ගැනීමට සෘජුවම සලසා තිබීම රජය විසින් දෙනු ලබන නිදහස් සෞඛ්‍ය සේවා ප්‍රතිපත්තියේද අඩංගු වී ඇත. එබැවින් සමහර රෝගීන් රාගම ශික්ෂණ රෝහලටද තම කැමැත්තෙන් යන අවස්ථාවන් මෙම ස්ථානීය පරීක්ෂාවේදී පැමිණ සිටි රෝගීන් මා වෙත ප්‍රකාශ කරන ලදී. ප්‍රායෝගික තත්ත්වය සියළු දෙනා විසින් නිවැරදිව අවබෝධ කර ගත යුතුව ඇත.

ඈ. පිළිතුර

දනිමි. මෙම භූමි භාගය අක්කර 2 ¼ කි. මෙම මාතෘ නිවාසයේ වහළය ප්‍රතිසංස්කරණය කිරීම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් පසුගිය අවුරුද්දේ සිදු කර ඇත. කිසිදු නඩත්තුවක් නොකිරීම නිසා මෙම රෝහල ගරා වැටී නොමැත. ගරා වැටීමට හේතු පහතින් සඳහන් කරමි. මේ ප්‍රශ්නයෙන් පස්සේ ඇහුවොත් සඳහන් කරන්නට කැමැතියි.

**පසුබිම් වාර්තාව**

මෙම රෝහල වසර 67 පැරණි බැවින් නිරායාසයෙන්ම සිදුවන ගරාවැටීම් මාගේ අවධානයට යොමුවිය. දොරවල්වලට ඉහළින් බිත්ති පුපුරා ඇත්තේ එම කොන්ක්‍රීට් ලින්ටනය තුළ ඇති යකඩ දිරාපත් වීම නිසාය. මුහුදට ඉතා ආසන්නව පිහිටි බැවින් ලවණ මිශ්‍ර වාතය නිසා යකඩවල බැඳීම පහසුවෙන් සිදුවේ. මෙම නිවාසය ඉතා පැරණි බැවින් තවදුරටත් නඩත්තු කටයුතු කිරීම ඵලදායි නොවන බව පෙනී යයි. අළුත් මාතෘ නිවාසයක් ඉදිකිරීම සඳහා සැලසුම් කිරීම සඳහා පළාත් ඉංජිනේරු (බ.ප) නිර්දේශය ලබා ගැනීම සුදුසු වනු ඇත.

ඉ. **පිළිතුර**

ඉහත පිළිතුර අනුව මෙහි පැරණි ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කිරීම ඉංජිනේරු කාර්ය මණ්ඩලය විසින් නිර්දේශ කර නොමැත. එසේම නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මීට වසර 04 කට පෙර මෙම පරිශ්‍රයේ මුල්ගලක්ද ප්‍රාදේශීය දේශපාලන අධිකාරිය හා මහජන නියෝජිතයින් විසින් සිදුකර ඇත. මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවට නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සුදුසු බව මවිසින්ද නිර්දේශ කරන අතර ඒ සඳහා නෛතික ගැටළුවක් ඇත්නම් ප්‍රාදේශීය ලේකම් අමතා දැන ගැනීමට මීගමුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හට උපදෙස් දුනිමි.

**පසුබිම් වාර්තාව**

රෝගී ජනතාව පවසා සිටියේ මෙම ස්ථානයේ මුල්ගල තබා ඇතිමුත් මෙතෙක් එම කාර්යය සිදුවී නොමැති බැවින් එම ස්ථානය වල්බිහි වී ඇති බවය. ඒ බව මගේ ස්ථානීය පරීක්ෂාවේදී තහවුරු විය.

ඊ. **පිළිතුර**

දනිමි. තලාහේන ප්‍රජාමූල සංවිධානය ඉල්ලා සිටින්නේ මෙම ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම නොව නව ගොඩනැගිල්ලක් තනා දෙන ලෙසයි.

**පසුබිම් වාර්තාව**

නව ගොඩනැගිල්ලක් තනාදෙන ලෙස තලාහේන ප්‍රජාමූල සංවිධානය නියෝජනය කරමින් පැමිණ සිටි 18 දෙනෙකුගෙන් යුත්ත පිරිස ඉදිරිපත් කර ඇති ලිපිය මේ සමහ අමුණා ඇත. ලියාපදිංචි වෛද්‍ය නිලධාරි මා සමහ කළ සාකච්ඡාවේදී මධ්‍යම බෙහෙත් ශාලාවේ සායනය අළුත්වැඩියා කිරීම වෙනුවට රැස්ව සිටි පිරිස යෝජනා කළ ඉහත අදහස ක්‍රියාත්මක කිරීම වඩා සුදුසු බව පෙනේ.

උ. **පිළිතුර**

ඔව්. පසුබිම් වාර්තාවේ තොරතුරු දැක්වේ.

**පසුබිම් වාර්තාව**

මුල්ගල තබා ඇති ස්ථානයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සැලසීමේදී ඉංජිනේරු නිර්දේශ ලබා ගත යුතුව ඇත. මෙම ඉඩම අක්කර 2 ¼ ක් වන අතර යාබදව පිහිටි මහා මාර්ගයේ මට්ටමට වඩා පහතින් පිහිටා ඇත. එබැවින් වර්ෂා සමයේදී ජලයෙන් යටවේ. නව ගොඩනැගිල්ලක් ඉදිකරන්නේ නම් එය වඩා උස් මට්ටමක ඉදි කළ යුතු බව රැස්ව සිටි පිරිසගේ අදහසයි. එසේම මෙම ඉඩම එඩ්වඩ් මහතා විසින් පරිත්‍යාගයක් ලෙස ලබා දී ඇත. මේ පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් ප්‍රාදේශිය ලේකම්ගෙන් වාචිකව විමසා ඇති අතර ගම්පහ මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් මෙම ඉඩමේ අයිතිය පිළිබඳව තොරතුරු තවදුරටත් ලබා ගැනීමෙන් පසු සභාවට ඉදිරිපත් කර තීරණයක් ලබා ගැනීම වඩා සුදුසුය.

ඌ. **පිළිතුර**

මේ සඳහා ස්ථිර ලියාපදිංචි වෛද්‍ය නිලධාරිනියක ලබාදී ඇත. මෙම මධ්‍යම බෙහෙත් ශාලාව සඳහා බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගීන් සංඛ්‍යාව 25-30 අතර බැවින් දැනට එහි ස්ථිරව සේවය කරන ලියාපදිංචි වෛද්‍ය නිලධාරිනිය සෑහේ.

**පසුබිම් වාර්තාව**

මෙම ලියාපදිංචි වෛද්‍ය නිලධාරිනිය අඟහරුවාදා දින දකුණු පිටිපන පිහිටි ජංගම මධ්‍යම බෙහෙත් ශාලාවේදී ප්‍රතිකාර ලබාදේ. මීට අමතරව සෑම මසකම පළමු හා තුන්වෙනි බ්‍රහස්පතින්දා මෙම

[ ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා ]

ස්ථානයේ පවත්වනු ලබන මාතෘ සායනයට තලාහේන හා කැපුම්ගොඩ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ද සහභාගි වන අතර පෙර ප්‍රසව සායනයක්ද, ප්‍රතිශක්තිකරණ සායනයක්ද, ළදරු සායනයක්ද, පවුල් සැලසුම් සායනයක්ද පවත්වාගෙන යනු ලබයි. මෙය ලංකාවේ සියළුම පළාත්වල පිහිටි අනෙකුත් මධ්‍යම බෙහෙත් ශාලාවලද සිදුවන ප්‍රායෝගික තත්ත්වයකි.

**එ. පිළිතුර**

මෙම මධ්‍යම බෙහෙත් ශාලාව හා මාතෘ නිවාසයට ස්ථිර ලියාපදිංචි වෛද්‍ය නිලධාරිනියක ලබාදී ඇති බැවින් දැනට සිටින වෛද්‍ය නිලධාරිනියගේ සේවා වේලාවන් නිශ්චිතව මෙම රෝහලේ ප්‍රදර්ශනය කර ඇත. තවදුරටත් අමතර වෛද්‍යවරයෙකු ලබා ගැනීමට අවශ්‍ය නම් ඒ පිළිබඳව ඉදිරියේදී තීරණය කිරීම සුදුසු වන අතර ඒ සඳහා අවශ්‍ය තොරතුරු පසුබිම් වාර්තාවේ දැක්වේ.

**පසුබිම් වාර්තාව**

මෙම මධ්‍යම බෙහෙත් ශාලාවට පැමිණෙන රෝගීන් සංඛ්‍යාව දිනකට 25-30 පමණ වන අතර දැනට තවත් අමතර වෛද්‍යවරයෙකු අනුයුක්ත කිරීම සුදුසු නොවේ. එසේ අනුයුක්ත කිරීමෙන් මානව සම්පත නිකරුණේ නාස්ති වීම සිදුවන බව පැහැදිලි කරුණකි. එසේම මෙම ගොඩනැගිල්ලේ පැරණි ස්වභාවය හා ගරා වැටීම් තවදුරටත් අධ්‍යයනය කරගත යුතු අතර යෝජිත නව ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් පසුව අවශ්‍ය අමතර වෛද්‍යවරයෙකු ඇතුළු කාර්ය මණ්ඩලය ලබාදීම සුදුසු බව කාරුණිකව පෙන්වා දෙමි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අදාළ උත්තරය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමාට ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්. එක එක ඔබතුමා අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් ඔබතුමා දීපු පිළිතුරුවලින් මට සෑහීමකට පත් වෙන්න බැහැ. මොකද, ඔබතුමා මේ මාතෘ නිවාසය අලුත්වැඩියා කළ බවට ප්‍රකාශ කළා. ඔබතුමා මේක ඔබතුමාගේ දෑසින් දැකලා තිබෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඇත්ත වශයෙන්ම මම දෑසින් දැකලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඒ ඇති. උත්තරය පැහැදිලියි. ඔබතුමාගේ දෙවැනි ප්‍රශ්නය අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දෙවැනි ප්‍රශ්නය තමයි, මේ මාතෘ නිවාසයේ දැනට ඉන්න වෛද්‍යවරිය, ඇය ස්ථිර ලෙස එතැන ඉන්න කෙනෙක් නොවෙයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ස්ථිර ලෙස ඉන්නවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ස්ථිර ලෙස ඉන්න කෙනෙක් නොවෙයි. මොකද මම එහෙම කියන්නේ, ඇය අඟහරුවාදා සහ සෙනසුරාදා පමණයි මෙහි සේවයට පැමිණෙන්නේ. සමහර අවස්ථාවලදී හිටපු ගමන් හදිසියේ දැනුම් දෙනවා, සේවයට එන්න වෙන්නේ නැහැ. ඊට පස්සේ මේ රෝගීන් සියලුදෙනා අසරණ වෙනවා, බෙහෙත් ගන්න විධියක් නැතිව. ඒ නිසා ඔබතුමා ඒ සම්බන්ධයෙන් ගන්නා වූ ක්‍රියාමාර්ගය කුමක්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ස්ථිර ලෙස ඇය ඉන්නවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. ඇය ස්ථිර ලෙස නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න දෙන්න බැහැ. ඔබතුමා දෙවැනි ප්‍රශ්නය ඇහුවා නේ? උත්තර දෙයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට අවශ්‍ය වෙන්නේ ඇය ස්ථිර සේවයක් ලබා දීම සඳහා ඔබතුමා විසින් ගන්නා පියවර කුමක්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේ අහන්න කෝ. ඇය ස්ථිර ලෙස ඉන්නවා. ඇයට වෙනත් රාජකාරී පවරලා තිබෙනවා. විශේෂයෙන් අපි සංචාරක බෙහෙත් ශාලාව, පිටිපන.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එතකොට ඔබතුමා කොහොමද ඇය ස්ථිර ලෙස මේ බෙහෙත් ශාලාවට ඉන්නවා කියලා කියන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉන්න කෝ කියන්න. ඔබතුමා ඒ මධ්‍යම බෙහෙත් ශාලාව බලන්න ගියාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම ගිහිල්ලා දෑසින් දැකලා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ බෝඩ් එක කියෙව්වාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අවශ්‍ය නම් මා ළඟ තිබෙනවා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ බෝඩ් එක කියෙව්වද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බෝඩ් එක කියවන්න වුණේ නැහැ. එදා වහලා තිබුණේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒක තමයි ප්‍රශ්නය මේ තිබෙන්නේ. මේ බෝඩ් එකේ සඳහන් කරලා තිබෙනවා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මා ළඟ ඡායාරූප තිබෙනවා. මේ සියලු ඡායාරූප මා ළඟ තිබෙනවා. ඡායාරූප සහිතව, විස්තර සහිතව මම කථා කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, මේ විවාදයක් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න දෙන්න බැහැ. සංවාදයකට යන්න දෙන්න බැහැ. ඔබතුමා ප්‍රශ්නය යොමු කළා. ගරු ඇමැතිතුමා උත්තර දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේක අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, කෙටියෙන් උත්තර දෙන්න. කෙටියෙන් උත්තර දෙන්න කෝ. වැඩියෙන් දීර්ඝ පැහැදිලි කිරීම් අවශ්‍ය නැහැ. එතුමා අහපු ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම මේ ප්‍රශ්නය අහන්නේ පන්දහසකට වැඩි ජනතාව වෙනුවෙන්. එතකොට මම අහන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම වෛද්‍යවරිය ස්ථිරද කියලා අහන්නේ. එච්චර නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තැන් තැන්වල සේවය කරන කෙනෙක් නොවෙයි. මම අහන්නේ ස්ථිරව ඒ ස්ථානයට අවශ්‍ය වෛද්‍යවරියක් හෝ වෛද්‍යවරයෙක් ලබා දෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට කෙටි උත්තරයක් ලබා දෙන්නම් සභාපතිතුමා. ගරු මන්ත්‍රීතුමා, ඒ මාතෘ නිවාසයට දැනට දෛනිකව 25 ත්, 30 ත් අතර රෝගීන් තමයි පැමිණෙන්නේ. ඒකෙදී අපි ඇයව යොදවලා තිබෙනවා. ළදරු මාතෘ සායන සහ බාහිර රෝගී අංශ, මාතෘ සායන සඳහා දින වෙන් කරලා තිබෙන්නේ. දිනපතාම අම්මලා, පුංචි බබාලා ඒ සායනයට එන්නේ නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ මේක -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඉන්න කෝ. ඔබතුමා නොවෙයි. මමයි උත්තර දෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට දෙන්නටම ඔය විධියට ඉඩ දෙන්න බැහැ. විවාදයකට යන්න දෙන්න බැහැ. ප්‍රශ්න අහන වේලාවේ. ප්‍රශ්නයක් ඇහුවොත් ඔබතුමා උත්තර දෙන්න. එච්චරයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

උත්තරේ දෙන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා උත්තරේ කියන්න කෝ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වටේ යනකොට මට අහන්න වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා උත්තරෙන් සෑහීමකට පත් වෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම කියන උත්තරේ පිළිගන්නේ නැත්නම් මම සභාගත කරනවා. ඊළඟ එක අහන්න. ඊළඟ එක අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා තුන්වැනි ප්‍රශ්නය අහන්න කෝ. අවසාන ප්‍රශ්නය.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. මේ මාතෘ නිවාසය, දැන් ඔබතුමා කිව්ව විධියට අලුත් ගොඩනැගිල්ලක් හදන්න සූදානමින් ඉන්නවා. ඒක කවදාද ආරම්භ කරන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ආරම්භ කරන දිනය කියන්න බැහැ. නමුත් සම්පූර්ණ තොරතුරු මම ඉතාම ඕනෑකමින් ලබා ගත්තා. මමත් එය අලුතෙන් ආරම්භ කරන්න ඕනෑ කියලා පිළි අරගන්නවා. ඒ සඳහා සාකච්ඡා පවත්වා සුදුසු තීන්දුවක් ගන්නවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තුතියි.

## අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

MINISTRIE'S ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ දවස්වල ඇති වූ ස්වභාවික විපත් නිසාවෙන් - විශේෂයෙන්ම අපි ඉතාම කනගාටුදායක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මා දුටුවා අවබෝධයක් ඇති පැරණි මන්ත්‍රීවරයෙක් වුණත්, විපක්ෂ නායකවරයෙක්

වුණත් මම හිතන්නේ රීතිය හරියට අවබෝධ කර නොගෙන මේ ප්‍රකාශය කළා. එතුමාටත් අවස්ථාව දෙන්න අපි කැමැතියි. මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන් ගංවතුර ගැන විපක්ෂ නායකතුමනි කථා කරන්නේ. එම නිසා බරපතළ ගංවතුර තත්ත්වයක් ඇති වෙලා, අද බස්නාහිර පළාතේ ජනතාව ඉතාම පීඩාවට හා හානියට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කය. කළුතර දිස්ත්‍රික්කයේ මරණ 16 යි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අද මාධ්‍යයේ කිව්වා, 17 යි කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එකක් ගම්පහ. එතකොට එකක් අතුරුදහන්. දැන් මට කියන්න දෙන්න කෝ. ඒ කියන්නේ පුද්ගලිකවත් මම සොයා බැලුවා. දිසාපතිතුමන්ලාටයි, විශේෂයෙන් අපේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානවලට අද උදේත් මම කථා කළා. ගම්පහත් තිබෙනවා. තමන්ගේ ගවගාල - ඒ මරණය තවම හම්බ වෙලා නැහැ. එහෙම තිබෙනවා. නමුත් අපට දැනට වාර්තා වෙලා තිබෙන්නේ මරණ සංඛ්‍යාව 17 යි. සත්‍ය තත්ත්වය. මේ වනකොට කළුතර දිස්ත්‍රික්කයේ නම් පවුල් 1250 ක් පීඩාවට පත් වෙලා තිබෙනවා. පුද්ගලයින් හැටියට තුන්දහස් ගණනක්. මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අද දවසේත්, ඊයේ රාත්‍රියේත් ඉතාම දැඩි වර්ෂාපතනයක් පතිත වෙනවා.

මම ස්තුතිවන්ත වෙනවා. අපට හොඳට ගංවතුර හුරුපුරුදු අය. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාත්, මමත්, අප කවුරුත් හොඳට මේ ගංවතුරට මුහුණ දීපු අය. පෙරට වඩා ඉතාම සක්‍රීයව අපට දායකත්වයක් අතිගරු ජනාධිපතිතුමාගෙන් ලැබුණා. ඊයේ පාන්දර තුනට මහින්ද සමරසිංහ ගරු ඇමැතිතුමා ජනාධිපතිතුමාට කථා කළා. ඒ වාගේම එතුමාගේ උපදෙස් පරිදි අපට ගුවන් යානා, ඒ වාගේම නාවික හමුදාව, ශ්‍රී ලංකා යුධ හමුදාව, අවශ්‍ය උපකරණ, බෝට්ටු, බෝරා ගැනීම්, උපකරණ මේ සියලු දේවල් ලැබුණා. ඒ වාගේම වෙනදා වාගේ නොවෙයි. අපට පළමුවැනි ආහාර වේලේ සිට ලැබුණා, ගරු සභාපතිතුමනි. නීති රීති, චක්‍රලේඛ කොපමණ තිබුණත් මහින්ද අමරවීර ගරු ඇමැතිතුමා අපට දුරකථනයෙන් කථා කරලා බලන්න ආවා, මළගෙවල් වුණු තැන්. බලන්න, එතුමා ඒ චක්‍රලේඛ පැත්තකින් තියලා, අපට එනකොටත් කිව්වා, කැමැති ඕනෑම තැනකින් බඩු මිලදී ගන්න කියලා ප්‍රාදේශීය ලේකම්ට උපදෙස් දුන්නා. මේ වේලාවේ බලන්න එපා. එක වේලක්වත් බඩගින්නේ තියන්න එපා. ඒ අනුව අපි කවුරුත් මැදිහත් වෙලා ඉක්මණින් ඉක්මණින් ඒවා සකස් කරලා ලබා දුන්නා. ඒ වාගේම මිල මුදල් දුන්නා. යන්ත්‍ර සූත්‍ර අරගෙන ඒ පාරවල් සුද්ධ කරලා ගමනා ගමන තත්ත්වය හදලා දෙන්න කටයුතු කරනවා. ඒ වාගේම හානියට පත් වුණු පවුල්වලට විශේෂයෙන් උදව් උපකාර කළා. මහින්ද අමරවීර ගරු ඇමැතිතුමාම පැමිණිලා අවසන් කටයුතු කරන්න උදව් උපකාර කළා. අවසන් කටයුතු කරන්න ප්‍රදේශයේ මහජන නියෝජිතයින්ගේ උදව් උපකාර ලැබුණා. අපි කවුරුත් සහයෝගයෙන් මේ අවස්ථාවේදී වැඩ කරන්නේ. මම විශේෂ ස්තුතියක් කරනවා.

ගංවතුර අත්දැකීම් තිබෙන අය හැටියට අපි ඉස්සර හරි අමාරුවක වැටෙනවා. දැන් එහෙම නොවෙයි. ජනාධිපතිතුමා ඒ රාත්‍රියේම ගුවන් යානා එවලා, රාත්‍රියේම කණ්ඩායම් එවලා, වාහන එවලා සම්පූර්ණයෙන්ම නිදහස් කරලා ගත්තා අපේ අසරණ වුණු අය. ඒ නිසා විශේෂයෙන් ස්තුතියක් කරනවා එතුමාටත්, මහින්ද අමරවීර ගරු ඇමැතිතුමාටත්.

මම විශේෂ ඉල්ලීමක් කරනවා. දැන් අපේ පළාත් සභාවේ සමාජ සේවා අමාත්‍යාංශයේ තිබුණු යම් යම් බලයන් මධ්‍යම රජයට ගිහිල්ලා තිබෙනවා. සමාජ සේවා අමාත්‍යාංශය හරහා අපට ආධාර උපකාර ගැනීමේ ක්‍රමවේදයක් තිබුණා. ඒක දැන් මධ්‍යම රජයට ගිහිල්ලා. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හැටියට, මධ්‍යම රජයේ සමාජ සේවා අමාත්‍යාංශය හැටියට, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හැටියට -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

තිබුණු ඒවා එහෙම යන්න දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒකට සමාජ සේවා අමාත්‍යාංශ -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

Hundred present devolved subject එකක්.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

ඇයි රත්නසිරි ඇමැතිතුමා උසාවි ගියේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

සමාජ සේවා අමාත්‍යාංශ දෙකක් තිබෙනවා. ඒ නිසාවෙන් ද්විත්ව සම්බන්ධතාවයන් ඇති වෙලා සමහර තැන්වල සමහර පවුල් මධ්‍යම රජයෙනුත් අරගන්නවා. පළාත් සභාවෙනුත් අරගන්නවා. අපේ රටේ එහෙම නේ? අපේ මිනිස්සු එහෙම තමයි. නීතියට අවනත නැති, තමන් ගැන හිතන, අනුන් ගැන නොහිතන.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රටේ නීතියක් නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ කාලයේත් නීතිය තිබුණාද නැද්ද කියලා පසුබිම් වාර්තාව මම පස්සේ දවසක දෙන්නම්. දැන් ඕනෑ නැහැ. ඒ නිසා විශේෂයෙන් මම ඉල්ලීමක් කරනවා, ගරු සභාපතිතුමා හරහා අපේ ගරු ඇමැතිතුමාගෙන්. මේ බස්නාහිර පළාතේ ව්‍යසනයට, කරදරයට පත් වුණු අයට සහනදායී දීමනාවක් හෝ ආධාර උපකාර කිරීමක් -ඔවුන්ගේ ගෙවල් දොරවල් කැඩිලා බිඳිලා තිබෙනවා. විශාල හානිදායක තත්ත්වයක් තිබෙනවා. අපි වාර්තාව පස්සේ සපයන්න බලාපොරොත්තු වෙනවා. විශේෂ සහන වැඩ පිළිවෙළක් ඇති කරන්න කියලා. බොහොම ස්තූතියි.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් මම පොඩි ප්‍රකාශයක් කිරීම, වැඩ බලන මහ ඇමැතිතුමා හැටියටත්, සමාජ සේවා ඇමැතිතුමා හැටියටත්, මහා මාර්ග ඇමැතිතුමා හැටියටත් මගේ යුතුකමක් වෙනවා. දැනට මට වාර්තා වෙලා තිබෙන හැටියට පාසල් 126 ක් - මේ ගංවතුර තර්ජනය නිසා අපේ මතුගම අධ්‍යාපන කලාපයේ පාසල් 115 ක්, ඒ වාගේම හොරණ අධ්‍යාපන කලාපයේ පාසල 10 ක්, ඒ වාගේම කළුතර කලාපයේ පාසල් 01 ක් වශයෙන් පාසල් 126 ක් දැනට අපි වහලා තිබෙනවා. අද, මේ වන කොටත් මම අපේ ලේකම්වරු එක්ක කථා කරලා සමාජ සේවා අමාත්‍යාංශයේ වෙන් වෙලා තිබෙන මුදලක් අපි වෙනම අරගෙන - අපේ වෙනම මුදලක් තිබෙනවා. ඒ මුදලින් මේ ප්‍රදේශවල සියලුම ජනතාවට, අපේ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කය පමණක් නොවෙයි. අපි අවිස්සාවෙල්ල ආසනය. ඒ වාගේම හංවැල්ල ප්‍රදේශය. කළුඅග්ගල ප්‍රදේශය. එවැනි ප්‍රදේශත්, අනිකුත් ගම්පහ දිස්ත්‍රික්කයේත් තිබෙනවා නම් ඒ සියලුම ප්‍රදේශ අපි ඒකාබද්ධ කරලා මේ සමාජ සේවා අමාත්‍යාංශය යටතේ අපි මේකට පියවර ගන්න ඒකාබද්ධව කණ්ඩායමක් හදන්න අපි කටයුතු කරනවා. නිවාස අධිකාරියත්, මහාමාර්ග අමාත්‍යාංශයේත් වාහන ඔක්කෝම අපි යොදවලා ඒ පාරවල් සුද්ධ කරන්න, කැඩුණු තැන්වල නිවාසවල සුන්බුන් ඉවත් කරන්න, අපි නාවික හමුදාවත්, ගුවන් හමුදාවත් ඒකාබද්ධව, ජනාධිපතිතුමාගේත් උපදෙස් පරිදි අපි දැන් මේ කටයුත්ත කරන්න සූදානම් වෙනවා. විශේෂයෙන් මේ පළාත් සභාව අවසන් වුණු පසු අපි Meeting එකක් කැඳවලා කටයුතු කරන්න සූදානම් කරනවා කියන එක මේ අවස්ථාවේ මම තමුන්නාන්සේ මඟින් අපේ සභාවට දැනුම් දෙන්න කැමැතියි. බොහොම ස්තූතියි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ දිනවල තිබෙන ඩෙංගු සම්බන්ධවත් මට සහයෝගය ප්‍රාර්ථනා කරන අදහසක් මගේ තිබෙන්නේ. මොකද, මේ ඩෙංගු සම්බන්ධයෙන් ලොකු අවාසනාවන්ත තත්ත්වයක් ගොඩනැගිලා තිබෙනවා. ඉතින් රජයටවත්, කාටවත් ඇඟිල්ල දික් කරලා වැඩක් නැහැ. තමන් තමන්ටම හෘද සාක්ෂියෙන් වගකිවයුතු කාරණාවක්. විශේෂයෙන් මම සඳහන් කරන්න ඕනෑ, කොළඹ 3057 ක්. වර්තමාන තත්ත්වය. ඒ වාගේම ගම්පහ 1973 ක්. කළුතර 632 ක්. සියල්ල 5672 ක්. විශේෂයෙන් ඩෙංගු මරණ 30 ක්. කොළඹ නගර සීමාව තුළ විතරක් ඩෙංගු රෝගීන් 1113 ක්. මගේ අමාත්‍ය ධූරය භාරගත්ත ගමන් මට යන්න ඉඩකඩ ලැබුණා, හංවැල්ල ප්‍රදේශයට. විශේෂයෙන් පාසල් වැහිලා. අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් මට සහයෝගය දුන්නා. අපි විශේෂිත වැඩ

පිළිවෙළක් මේ ඩෙංගු මර්දනය සඳහා ක්‍රියාත්මක කළ යුතුයි කියලා විශ්වාස කළා. ඒ නිසා අපේ අතිගරු ජනාධිපතිතුමාගේ ජනාධිපති කාර්යසාධක බලකාය පිහිටුවලා තිබෙනවා. ගරු මෛත්‍රීපාල සිරිසේන මධ්‍යම රජයේ සෞඛ්‍ය ඇමැතිතුමා මටත් දුරකථනයෙන් කථා කළා. ගරු මහ ඇමැතිතුමාටත් දුරකථනයෙක් කථා කළා. ඒ අනුව අපි පළාත් සභාවේ ශ්‍රවණාගාරයේ විශේෂ සාකච්ඡාවක් පවත්වලා එතුමාගේ උපදෙස් බලාපොරොත්තු වුණා. එතුමා ඒ වාගේම අපට උපදෙස් දුන්නා. ඒ සාකච්ඡාවට ගරු ආණ්ඩුකාරතුමාත්, ගරු මහ ඇමැතිතුමාත්, අපේ අමාත්‍යතුමන්ලා, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා, ඒ වාගේම වෛද්‍යවරු සහ පළාත් පාලන නියෝජිතයෝ ඉතාම ඉහළ සංඛ්‍යාවක් සහභාගි වුණා.

ඒ වාගේම මම පුද්ගලිකව මගේ අමාත්‍යාංශයේත් සාකච්ඡාවක් පැවැත් වූවා. ඊට පස්සෙත් සාකච්ඡාවක් පවත්වලා, ප්‍රධාන ලේකම්තුමියත් එක්කත් සාකච්ඡා පවත්වලා අපි සෑහෙන පියවරයන් කිහිපයකට ගියා. විශේෂයෙන් රෝගී වුණු, අපහසුවට පත් වුණු ස්ථාන රාශියකට මම පුද්ගලිකව ගියා. ඒ ගියේ දිරිමත් කරන්න. කළුබෝවිල, ඒ වාගේම බොරලැස්ගමුව, ඒ වාගේම ශාන්ත ජෝන් විද්‍යාලය, කැලණිය, මේ ආදී වශයෙන් - මට මතකයි යූ. ජෝර්ජ් පෙරේරා අපේ ගරු මන්ත්‍රීතුමා මට දුරකථනයෙන් කථා කළා. මම එවලේම එතුමාට අවශ්‍ය සහයෝගය මට පුළුවන් විධියට ලබා දුන්නා. තවත් මට එහෙම කථා කරපු හැමෝටම මම උදව් කළා. මේක සහයෝගයෙන් කළ යුතු දෙයක්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මේ අවස්ථාවේදී මම සෞඛ්‍ය ගරු ඇමැතිතුමාට යොමු කරනවා. එතුමාගේ කථාව කියවාගෙන යද්දී -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මගේ කථාවෙන් පස්සේ ඉදිරිපත් කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

36(1) යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා වාඩි වෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මගේ කථාව නවත්වන්න බැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක්. බලමු මොකක්ද කියලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉදිරිපත් කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මා වෙත ලිපියක් ලැබුණා, ඉතා වැදගත් කියලා. ප්‍රධාන අමාත්‍ය ලේකම් - ජයන්ති විජේතුංග මහත්මිය වෙතින් ඩෙංගු මර්දන වැඩ සටහන කියලා. එතකොට එම ආරාධනා පත්‍රය තුළ මන්ත්‍රීවරුන් හැටියට අපට ආරාධනාවක් තිබෙනවා. නමුත් ගරු සභාපතිතුමනි, අපේ ගරු සෞඛ්‍ය ඇමැතිතුමාට මේ ලිපිය අස්සේ ආරාධනාවක් නැහැ. එතකොට මේ මෛත්‍රීපාල සිරිසේන ගරු ඇමැතිතුමා ඉන්නවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉන්නවා. අපේ බස්නාහිර පළාතේ සෞඛ්‍ය ඇමැතිතුමා නැහැ. මෙතුමා කොපමණ මේ පුරසාරම් දෙඩුවත් මෙතුමාට අඩුම ගණනේ මේ සාකච්ඡාවටවත් එන්න ආරාධනාවක් නැහැ. ඒ සම්බන්ධයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙන ප්‍රශ්නයක් ගරු මන්ත්‍රීතුමා. ඒක වෙනම දෙයක්. ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් එතැන වෙලා නැහැ. එතුමාගේ ප්‍රශ්නයක් තිබෙන්නේ. ඔබතුමා ඒ ගැන පැහැදිලි කිරීම් කරන්න යන්න අවශ්‍ය නැහැ ගරු ඇමැතිතුමා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට එහෙම ලකුණු දාගන්න මානසිකත්වයක් නැහැ. මට ඕනෑ වැඩේ කෙරෙන්න විතරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සෞඛ්‍ය ගරු ඇමැතිතුමා, ඔබතුමා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම පිළිගන්නවා. සුනිල් වටගල මන්ත්‍රීතුමා හෝ අපේ පක්ෂයේ නොවන ඕනෑම මන්ත්‍රීතුමෙකුට මේ කථාව අතරතුර කියන්න ඕනෑ සෞඛ්‍ය අමාත්‍යාංශයට අවශ්‍ය මහ පෙන්වීම, අදහස් ඉතා නිහතමානීව පිළිගන්නවා. ඕනෑම වේලාවක ඉදිරිපත් කරන්න. ඕනෑම වේලාවක පිළිගන්නවා. විශේෂයෙන්ම අපි ඊයේ සාකච්ඡාවක් පැවැත් වූවා. මම සන්තෝෂ වෙනවා. මේ තත්ත්වය සමනය කරන්න අපට හොඳ තීන්දු කිහිපයක් ගන්න පුළුවන්කම ලැබුණා. මට ඒකයි කියන්න ඕනෑකම තිබෙන්නේ. ඒකට සහයෝගය ඉල්ලන්න ඕනෑ. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු අපට දෙසිය ගණනක් අඩුයි. අපි ඊයේ බඳවාගන්න තීන්දු කළා. ඒකට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන ඊයේ සාකච්ඡා කළා. ඒ නිසා අපි ඒ ගැන සන්තෝෂ වෙනවා.

ඒ වාගේම වාහන සම්බන්ධයෙනුත් තිබෙනවා. ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරී කාර්යාලවල. ඒ සඳහාත් අවශ්‍ය පියවරයන් ගන්න අපි ඊයේ කථා කළා. ඒ වාගේම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සහ විශේෂයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මහත්වරුන්ට ලොකු ගැටලු ටිකක් තිබුණා. ඒ ගැටලු ටිකට අපි හොඳ ශක්තියක් දෙනවා. අපි ඩෙංගු කමිටු හදන්න තීන්දු කළා. ගෙවල් 20, 30 වාගේ ඩෙංගු කමිටු හදලා, මේ ඩෙංගු ක්ෂණික විහිදුම් බලකායට අමතරව තවත් බලකායක් අපි හදනවා. අපට සහයෝගය දෙන්න කියලා අපි මේ මන්ත්‍රීතුමන්ලාට ආරාධනා කරනවා. ඒ සහභාගි වන සෑම කෙනෙක්ටම අපි දීමනාවක් - වැටුපක් දෙනවා නොවෙයි. පුංචි සහයෝගයක් දෙනවා. මොකද, දෛනිකව බස් එකේ, අරහේ මෙහේ යන්නත් ඕනෑ නේ ළමයි. රුපියල් 500/- ක විතර පොඩි සහනදායි තත්ත්වයක් ඇති කරන්න මම අපේ අමාත්‍යාංශයේ සහ ප්‍රධාන ලේකම්තුමිය, අපේ අමාත්‍යාංශයේ නිලධාරීනුත් සාකච්ඡා කරලා තීන්දුවකට ආවා. ඒ නිසා ඉදිරි දවස්වල අපි ඉතාම සක්‍රියව ඩෙංගු මර්දන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න තීන්දු කරනවා. හැම පැත්තෙන්ම අපි සහෝගය ඉල්ලනවා. විශේෂයෙන්ම පළාත් පාලන ආයතවලින් සම්පූර්ණ සහයෝගය මෙතෙක් කල් ලැබුණා. ඉදිරියටත් සහයෝගය ඉල්ලනවා. ඒ වාගේම මතක් කරන්නට ඕනෑ. විපක්ෂයේ වුවත් අපට ලැබෙන මහ පෙන්වීම් සහ අදහස් අපි ඉතා නිහතමානීව බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි. විශේෂයෙන්ම අපේ ගරු ඇමැතිතුමාගේ ප්‍රකාශයත් සමඟම කථා කරන්න ලැබීම ගැන සතුටු වෙනවා. අද මේ වන විට බස්නාහිර පළාතේ ඩෙංගු රෝගීන් 6000 කට වඩා වැඩි ප්‍රමාණයක් රෝගාතුර වෙලා තිබෙනවා. මම හිතන්නේ අපට මාධ්‍යයෙන් දැනගන්න ලැබුණු ආකාරයට මේ ඉකුත් මාස 05 තුළ 10,818 දෙනෙකු -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ලංකාවේ?

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ලංකාවේ. බස්නාහිර පළාතේ. ලංකාවේ 10,818 දෙනෙකු. ඒ වාගේම මේ වන විට 33 දෙනෙකු මිය ගිහිල්ලා තිබෙනවා. මේවායින් බහුතරයක් අපි නියෝජනය කරන බස්නාහිර පළාත. කොළඹ, ගම්පහ, කළුතර කියන මේ දිස්ත්‍රික්කවල. මේ වන විට බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල, ගල්කිස්ස, රත්මලාන, මොරටුව, කොළොන්නාව, පිළියන්දල, මහරගම, බොරලැස්ගමුවද, ගම්පහ දිස්ත්‍රිකයේ වත්තල, මහර, කැලණිය, බියගම සහ ජා-ඇළ ද, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර සහ හොරණ යන කලාප සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ මේ වන විට අවධානම් කලාප ලෙස නම් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ගත වූ මාස 05 තුළ කොළඹින් 3985 ක් ද, ගම්පහින් 1723 ක්ද, කළුතරින් 758 ක්ද මේ වනවිට ඩෙංගු රෝගීන් හඳුනාගෙන තිබෙනවා.

දැන් මෙතුමාම කියනවා, ජනාධිපතිතුමා වෙනම ඒකකයක් පත් කරලා තිබෙනවා කියලා. සෞඛ්‍ය ඇමැතිතුමා තවත්

ඒකක පත් කරලා තිබෙනවා කියලා. පළාත් සභාවේ ඇමැතිවරුන් තව තව ඒකක පත් කරලා තිබෙනවා කියලා. නමුත් මේ මාස 05 තුළ ඇති වෙලා තිබෙන තත්ත්වය මම හිතන්නේ, අපේ මේ කිසිම කෙනෙක්ට Control කරගන්න බැරි තත්ත්වයක් බවට පත් වෙලා තිබෙනවා. ඉතින් මේක කාගේ වැරැද්ද කියන එක නොවෙයි. අපි සියලුදෙනාම සහයෝගය දෙන්න ඕනෑ. නමුත් ඔබ තමුන්නාන්සේලා ආණ්ඩු පක්ෂයේ ඉන්න පිරිස හැටියට විශාල වගකීමක් ගන්න ඕනෑ. අද ඇමැතිවරුන්ට කෝටි ප්‍රකෝටි ගණනක් වියදම් කරනවා. WHO එකේ තනතුරු ගන්නවා කියලා පෝස්ටර් ගහනවා. නමුත් අද රට ඇතුළත ඩෙංගු අවධානම් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ මාධ්‍යයෙන් දැනගත්ත ආකාරයට ජාතික ඩෙංගු මර්දන වැඩ සටහන යටතේ සේවය කරන්නේ කීට විද්‍යා සහකාර නිලධාරීන් දෙදෙනෙකු පමණයි. මෙතුමා කියනවා, සෞඛ්‍ය නිලධාරීන්ගේ අඩුපාඩුවක් - 225 දෙනෙකුගේ අවශ්‍යතාවක් තිබෙනවා කියලා. දැන් මාස 05 ක් ගත වෙලා තිබෙනවා. අපි මේ පළාත් සභාවට පැමිණි දවසේ සිට ඩෙංගු ගැන කථා කරනවා. එතකොට මේ 225 දෙනා අද ද ගන්න මතක් වෙලා තිබෙන්නේ. මෙතැන වසර ගණනාවක් කියුබාවෙන් අපි ප්‍රතිකාර ගේනවා කියනවා. නැත්නම් වෙනත් රටවලින් ප්‍රතිකාර ගේනවා කියනවා. නමුත් අද ලංකාවේ ඉන්න ජනතාවට ඩෙංගුවලින් මැරෙන්න වෙලා තිබෙන්නේ. එහෙමනම් මම මේ ආණ්ඩු පක්ෂයේ අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම අපේ සෞඛ්‍ය ඇමැතිතුමාට. හදිසි අවශ්‍යතා තත්ත්වයක් හරි ප්‍රකාශ කරලා, මේ ඩෙංගු වසංගත රෝගයට, මේ ව්‍යසනයට පුළුවන්තරම් ඉක්මණට පිළිතුරක් ලබා දෙන්න කියලා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. දැන් ඔබතුමා කථා කළා. මම ඔබතුමාට පස්සේ අවස්ථාවක් දෙන්නම්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

උත්තරයක් දෙන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

උත්තර දෙන්න බැහැ. පැහැදිලි කිරීම්වලට.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, අද පෞද්ගලික පැහැදිලි කිරීම් තිබෙන්නේ හතරයි. ඒ හතරම ඩෙංගු සම්බන්ධව තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

සෞඛ්‍ය ගරු ඇමැතිතුමා, පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ මට ඉදිරිපත් කරලා තිබෙනවා අදහස් ප්‍රකාශ කිරීම් හතරක්. ඒ හතරම විපක්ෂයෙන් ලබා දීලා තිබෙනවා. ඒ හතරම ඩෙංගු සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්න මගෙන් ඉල්ලා තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමාට අවස්ථාවක් දෙනවා. මේ හතරම අදහස් ප්‍රකාශ කළාට පසුව ඔබතුමා විෂයය භාර ඇමැතිවරයා වශයෙන් මම අවස්ථාවක් දෙනවා. ඒ ගැන කෙටියෙන් පැහැදිලි කිරීමක් කරන්න.

ඇස්.කේ. කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාත් මේ ඩෙංගු සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්න ඉල්ලීමක් කරලා තිබෙන්නේ. ඔබතුමාට අවස්ථාව.

**ගරු ඇස්.කේ. කිඳෙල්පිටිය**
Hon. S.K. Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ විෂයය භාර අමාත්‍යවරයා හැටියට රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමාත් ඒ වාගේම අපේ විපක්ෂයේ හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත් කාරණා කිහිපයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට විනාඩි තුනයි තිබෙන්නේ.

**ගරු ඇස්.කේ. කිඳෙල්පිටිය**
Hon. S.K. Kindelpitiya

ගරු සභාපතිතුමනි, දැන් මේ සභාවේදී විවිධ අංක කියැවුණා. රෝගීන් ප්‍රමාණයන්, එක එක පළාත්වල මෙතරම් රෝගීන් ඉන්නවා. නමුත් ගරු සභාපතිතුමනි, අපි ඉදිරියේ තිබෙන අභියෝගය මේක නොවෙයි. අපි දන්නවා මේ අවුරුද්දේ මුල් මාස 05 තුළ පමණක් ඩෙංගු රෝගීන් 11,106 ක් වාර්තා වෙලා තිබෙනවා. මේ වනකොට 7000 ක් පමණ - විශේෂයෙන් බස්නාහිර පළාතේ මේ රෝගීන්ගෙන් 65% ක් වෙනවා. ගරු සභාපතිතුමනි, බොහොම හොඳයි, මම හිතන්නේ ඔබතුමා මේ අංක පිළිබඳව දැනගෙන සිටීම ඉතා වැදගත්. හැබැයි, ඔබතුමා ඉදිරිපත් කරපු කාරණා මට මතකයි. පසුගිය දවසක සෞඛ්‍ය අමාත්‍යවරයා ප්‍රකාශයක් කළා, පාසල් වහලා හරි මේ ක්‍රියාමාර්ග ගන්න කියලා.

ගරු සභාපතිතුමනි, අපේ විෂයය භාර අමාත්‍යතුමා කිව්වා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් බඳවා ගැනීම. වාහන සම්බන්ධයෙන් ප්‍රශ්නය. අපි දන්නවා. විශේෂයෙන් රෝහල් භූමිවල පවා ඩෙංගු පැතිර යනවා. අපි දන්නවා. මම ජීවත් වන IDH රෝහලේ සියයකට අධික පිරිසක් ඉන්නවා, ගරු සභාපතිතුමනි. ඒ වාගේම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාත් ඩෙංගු හැදිලා රෝහලේ ඉන්නවා. ඔහුගේ කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකුත් ඩෙංගු හැදිලා ඉන්නවා. වෛද්‍යවරු කිහිප දෙනෙක් ඉන්නවා. ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයේ තීව්‍රතාවය අවබෝධ කර ගන්න මේ හොඳටම ඇති. ඒ නිසා මෙතුමා ප්‍රකාශ කළේ, දිගු කාලීන විසඳුම්. සෞඛ්‍ය පරීක්ෂකවරු බඳවා ගැනීම කෙටි කාලීන සිදුවන දෙයක් නොවෙයි. ඒවා දිගු කාලීන වශයෙන් කල් ගත වන කාරණා ගරු සභාපතිතුමනි. ඒ නිසා කරුණාකරලා මේ පවතින තත්ත්වයට - සෞඛ්‍ය අංශ කියනවා මේක වසංගත තත්ත්වයක් දක්වා බරපතළ ලෙස පැතිර යනවා කියලා. අපි දන්නවා, විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, වසංගත තත්ත්වයක් තිබෙන අවස්ථාවකදී හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම තමයි සෞඛ්‍ය අංශවලින් කරන්නේ. එහෙම නම් මේ දිගු කාලීන වැඩ පිළිවෙළ ගැන කථා කරනවාට වඩා කෙටි කාලීන ක්‍රියාකාරී සැලැස්මක් වහාම ක්‍රියාත්මක කරන්න මොකක්ද ගන්න ක්‍රියා මාර්ගය කියලා මම හිතන්නේ මේ සභාවට හෙළි කිරීම වැදගත්. මොකද, අපේ ප්‍රදේශයේ ඩෙංගු රෝගය හැදිලා ගිය සතියේ එක මවක් මියගියා. මවගේ මිනිය ගෙදර තියෙනකොට දරුවාත් මිය ගියා. අවුරුදු 09 ක දරුවා ගරු සභාපතිතුමනි. ඉතාම ඛේදජනක තත්ත්වයක්. මොකද, මම විශේෂයෙන්ම මුහුණ දෙනවා. කොලොන්නාවේ මේ තත්ත්වය ඉතාම බරපතළයි. ඒ නිසා කරුණාකරලා අපි ඉල්ලීමක් කරනවා, අපේ දිස්ත්‍රික්ක තුනේම ජීවත් වන නියෝජිතයින්ව මා මේ පිළිබඳව දැනුවත් කළා. වහාම හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කර හෝ - අපි උපරිම සහයෝගය දෙනවා. කරුණාකරලා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන්න. එහෙම නැත්නම් දිගු කාලීන වැඩ පිළිවෙළවල්වලින් මේකට විසඳුමක් ලැබෙන්නේ නැහැයි කියලා මම සභාව හමුවේ කියනවා. ස්තුතියි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මමත් මේ ඩෙංගු රෝගයට අදාළව කරුණු කිහිපයක් තමයි කියන්නේ. විශේෂයෙන් දැන් මේ වුණු සාකච්ඡාව අස්සේ නොකියැවුණු එක කාරණයක් තිබෙනවා. ඒ කාරණය තමයි මේ ආණ්ඩුව, එහෙම නැත්නම් මේ පළාත් සභාව ඩෙංගු මර්දනය කරනවා වෙනුවට ඩෙංගු පෙන්වලා ආදායම් හොයන තත්ත්වයට ගිහිල්ලා තිබෙනවා. අද PHI මහත්මයා ගෙදර ඇවිල්ලා අල්ලගෙන මොකක් හරි අතපසුවීමකින්, එහෙම නැත්නම් තමන්ගේ රාජකාරී අස්සේ කිසියම් අතපසුවීමක් වුණා නම්, වතුර ටිකක් තිබුණා නම්, ඩෙංගු කීටයන් හිටියා නම් අල්ලාගෙන ගිහිල්ලා අද ඒකෙන් ආදායමක් උපයන තත්ත්වයට මේ ආණ්ඩුව පත් කරගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඉතාම කනගාටුයි කියන්න. අද කොලොන්නාවේ ඇති වෙලා තිබෙන තත්ත්වය. කොලොන්නාවේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා තමන්ගේ වගකීම් අත්හැරලා තිබෙන්නේ. කොලොන්නාවේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා දේශපාලනය ගැන කලකිරිලා විදේශගත වෙන්න හදන්නේ. හැබැයි, විදේශගත වෙද්දී එක දවසක් ඇතුළත තුන් දෙනෙක් මිය ගියා. අවුරුදු 11 ක් වයසැති දරුවෙක් මිය ගියා ඩෙංගුවලින්. අද කොලොන්නාව ආසනය තුළ සමස්ත කාණු පද්ධතිය වැහිලා, ඒවා නඩත්තු නොකරන තත්ත්වයට ගිහිල්ලා. කොලොන්නාව ආසනයේ විතරක් නොවෙයි. දෙහිවල ගල්කිස්සත් මේ හා සමානමයි. සමස්ත කොළඹ දිස්ත්‍රික්කය තුළ මේ ආදර්ශය තිබෙනවා. මේක ඉතාත්ම කනගාටුදායකයි ගරු සභාපතිතුමනි.

මේකට විශේෂ හේතුවක් තිබෙනවා. මේ හේතුව තමයි මධ්‍යම රජයත්, පළාත් රජයත්, පළාත් පාලන ආයතනයත් අතර මේ ඩෙංගු උවදුර මර්දනය කිරීමට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් හරියාකාර නැති එක. අද එක එක්කෙනා පොර වෙන්න - මධ්‍යම රජයේ සිරිසේන ඇමැතිවරයාගේ Program එකට මේ පළාත් සභාව, පළාත් සභාවක් හැටියට සහයෝගය දෙන්නේ නැහැ. මහ ලොකුවට පනතක් තියාගෙන ඉන්නවා. 2012 අංක 03 දරන මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය. ගරු සෞඛ්‍ය ඇමැතිතුමනි, ඕක දැන් හමස් පෙට්ටියෙන් එළියට ගන්න. ඇදලා අරගෙන මේක කියවලා මදුරුවෝ මර්දනය කරන විධිය මේ පනත අස්සේ කියලා තිබෙනවා නම් ඒක ආදර්ශයට ගන්න. දැන් ඒක ප්‍රයෝජනයට ගන්න. හැබැයි, මධ්‍යම රජයේ සෞඛ්‍ය ඇමැතිවරයා එන රැස්වීමට අද පළාත් සභාවේ සෞඛ්‍ය ඇමැතිවරයාට ආරාධනාවක් නැහැ. පුළුවන් නම් තමුන්නාන්සේගේ වෙලාවේ උත්තර දෙන්න. මෙන්න 2014.05.23 දිනැති ලිපිය. 2014.05.27 පෙ.ව. 11.30 ට රැස්වීමක් තිබෙනවා, බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේ. මේකට හැමෝටම ආරාධනා තිබෙනවා. සෞඛ්‍ය ඇමැතිවරයාට ආරාධනා නැහැ. එතකොට හංවැල්ලේ ගිහිල්ලා මෙතුමා අවශ්‍ය ප්‍රතිකාරය කරන්නේ කොහොමද? කළුතර දිස්ත්‍රික්කය අද සම්පූර්ණයෙන්ම යට වෙලා. ඒවාට අදාළ තත්ත්වයන් සාකච්ඡා කර ගන්නේ කොහොමද මධ්‍යම රජය නැතුව? මෙන්න මේකයි ගරු සභාපතිතුමනි, අද මේ ආයතන පිරිහිලා. මේ ආයතනය කැඩිලා, වැටිලා. අද මහජනතාවට ඒකේ ආනිශංසෙ විඳින්න සිද්ධ වෙලා තිබෙන තත්ත්වයක් තිබෙන්නේ.

එහෙම නම් මෙන්න මේ තත්ත්වය මත අද මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? මේ තත්ත්වය මත මේ ආණ්ඩුවත්, පළාත් ආණ්ඩුවත් අද කරන්නේ ඩෙංගු රෝගය මර්දනය කරනවා වෙනුවට වර්ධනය කිරීමයි ගරු සභාපතිතුමනි. අද ඒක පැහැදිලිවම ඔප්පු කරලා තිබෙන්නේ. මේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අන්න ඕනෑ නම් ගිහිල්ලා බලන්න ආදර්ශය. වැල්ලම්පිටියේ තිබෙනවා කුණු කන්ද. කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සමස්ත කාණු පද්ධතිය පිරිහිලා, ගරා වැටිලා නඩත්තු නොකරන තත්ත්වයට ගිහිල්ලා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මීතොටමුල්ල.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මීතොටමුල්ලේ. ආසනයක් තුළ දවසකට තුන් දෙනෙක් මැරෙන්න වැටෙනවා නම් ගරු සභාපතිතුමනි, මේක ඛේදජනකයි. මේක පළාත් සභාවක් විධියට වගකීම භාර ගත යුතුයි. අවසාන වශයෙන් 2012 අංක 03 දරන මහජන සෞඛ්‍ය පීඩා වැළැක්වීමේ ප්‍රඥප්තිය දැන් එළියට අරගෙන ඒක ක්‍රියාත්මක භාවයට ගන්න කියන ඉල්ලීම තමුන්නාන්සේගෙන් මේ වෙලාවේ අපි කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ඊයේත්, පෙරේදාත් කළුතර දිස්ත්‍රික්කය ප්‍රමුඛ බස්නාහිර පළාත තුළ ඇති වුණු නාය යෑම් වර්ෂාව මත මියගිය සංඛ්‍යාව පිළිබඳවත්, ඒ වාගේම අගේනියට පත් වුණු ජනතාව, විනාශ වුණු දේපළ පිළිබඳවත් ඔබතුමාගේ මාර්ගයෙන් මේ සභාව දැනුවත් කරන්න මට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට ලැබිලා තිබෙන ප්‍රතිපාදන අනුව මේ ඇති වුණු ව්‍යසනයට අනිවාර්යයෙන්ම අපි ඉදිරිපත් වෙන්න ඕනෑ. 8 වැනි උපලේඛනයේ 154 ආ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, බස්නාහිර පළාත් සභාව. 9 වැනි උපලේඛනයේ පළමුවැනි ලැයිස්තුවේ පළාත් සභා ලැයිස්තුවේ 7 වැනි ඡේදයේ තිබෙනවා, සමාජ සේවා සහ පුනරුත්ථාපන පිළිබඳව ප්‍රතිපාදන අපට සැලසිලා. මේ පළාතේ ජනතාවට ලබා දෙන්න. ඊට පස්සේ ඒකේ 5 වැනි එකේ තිබෙනවා, පළාත් නිවාස ඉදි කිරීම් පිළිබඳව. ඒකෙත් ප්‍රතිපාදන අපට තිබෙනවා. නිවාස අලාභහානි වෙලා තිබෙනවා. දේපල විනාශ වෙලා තිබෙනවා. ඊට පස්සේ 9. කෘෂිකර්ම හා ගොවිජන සේවා පනත. ඒක යටතේ බෝග වගාවන් විශාල වශයෙන් විනාශ වෙලා තිබෙනවා. ඒවාට සහන දෙන්න අපි බැඳී සිටිනවා. අනෙක් පැත්තෙන් 11. අපේ සෞඛ්‍ය අමාත්‍යතුමාගේ විෂයය. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපට සෞඛ්‍ය ලැබිලා තිබෙනවා. අනෙක් පැත්තෙන් අරගෙන බැලුවාම මේ පනතේ තිබෙනවා මහජන සෞඛ්‍ය සේවාව 11. 13 පළාත් පාලන ආයතනවලින් සේවාවන් ලබා දෙන්න පුළුවන් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම මේ පනතෙන්ම අපට තිබෙන බලයන්.

[ ගරු කිත්සිරි කහටපිටිය ]

ඊට පස්සේ අපේ සභා රීති අනුව මේ පිළිබඳව ඔබතුමන්ලාව දැනුවත් කරලා ජනතාවට සහන ලබා දෙන වැඩ පිළිවෙළකට යන්න තමයි අපි අවස්ථාව ඉල්ලුවේ. මම ඉතාමත් සතුටු වෙනවා, අපේ රංජිත් සෝමවංශ අමාත්‍යතුමා - මේ සිද්ධිය අපට දැන ගන්න ලැබුණේ පෙරේදා රෑ 10.30 ට විතර. මට පළමුව වාර්තා වුණා බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශයේ මහගම පොලේගොඩ පැත්තෙන්. ප්‍රේමදාස කියලා අපේ හිටපු මන්ත්‍රීවරයෙක් කථා කරලා කිව්වා, මාධ්‍යවේදියෙකුගේ මළ ගෙදරක ඉන්න ගමන්ම නාය යෑමක් වුණු වාර්තාවක් ආවා කියලා. 10.30 ට විතර. අපි ඒ අවස්ථාවේ එතැනට ගියා. යනකොට විදුලිය ඇණ හිටලා තිබුණා. පස් කඳු කඩාගෙන වැටිලා ගෙවල් යට වෙලා තිබුණා. කොහොම හරි ප්‍රදේශයේ ජනතාව ඒ රෑ කළුවරේ තමන්ගේ ජීවිත පරදුවට තියලා ගිහිල්ලා බැලුවා, මිනී දෙකක් ගොඩ ගන්න පුළුවන්කම ඇති වුණා. ඊට පස්සේ තව මිනියක් හම්බ වුණා. ඒ අනුව අරගෙන බැලුවාම කළුතර දිස්ත්‍රික්කයේ මම හිතන්නේ දැනට ජීවිත විනාශ වීම් 14 ක් විතර වාර්තා වෙලා තිබෙනවා. දේපළ විනාශ වීම් අපට තවම හොයා ගන්න බැහැ. සත්තු, සිව්පාවෝ, ගෙවිතැන, වගාව, දේපළ සියල්ලක්ම විනාශ වෙලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන්, අපේ වැඩ බලන ගරු ප්‍රධාන ඇමැතිතුමාට පෙන්නුම් කළා, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් එතුමා සේවාවන් සලසන්න සාකච්ඡා ආරම්භ කරලා, මේ සභාව ඉවර වුණාම කමිටුවක් පත් කරන්න කියලා.

මම ඔබතුමාගේ මාර්ගයෙන් මෙතුමාට, අමාත්‍යවරුන්ට සහ මන්ත්‍රීවරුන්ට දැන ගැනීම සඳහා ඉල්ලීමක් කරනවා. බස්නාහිර පළාතේ හදිසි ආපදා අරමුදල මේකට යොදවන්න පුළුවන්. මහේෂ් අල්මේදා හිටපු අමාත්‍යතුමා මෙතැන හිටියා. මේ වාගේම දෙයක් ඇති වුණා. එදා හදිසි ආපදා අරමුදලෙන් කෝටි ගණනක මුදල් ප්‍රතිපාදනයක් අපි ලබාගෙන ඒ අසරණ වුණු මිනිස්සුන්ට ලබා දෙන්න වැඩ කටයුතු කළා. අද තවම අපට පළාත් සභාවට කිසිම වගකීමක්, පළාතේ ප්‍රාදේශීය ලේකම් හරහා නීති ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන්න පුළුවන්කමක් ඇති වෙලා නැහැ. මම ස්තුවන්ත වෙනවා. අපේ දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයින් හැටියට රංජිත් සෝමවංශ මැතිතුමාත්, කුමාර වෙල්ගම අපේ අමාත්‍යතුමාත්, නිර්මල කොතලාවල අමාත්‍යතුමාත්, මමත්, සාකච්ඡා කරලා මනුස්සයෝ හැටියට, ප්‍රදේශයේ ජීවත් වන ජනතාව හැටියට, මම හිතන්නේ, ඒ ජනතාවගේ අවසන් කටයුතු ක්‍රියාත්මක කරවන්න - විශේෂයෙන්ම කුමාර වෙල්ගම ගරු අමාත්‍යතුමා මම මතක් කරන්න ඕනෑ. එතුමා ලක්ෂ ගණනක මුදල් ප්‍රතිපාදනයක් තමන්ගේ පෞද්ගලික අරමුදලින් ඒ මිනිස්සුන්ට ලබා දීලා ඒ සේවාව ක්‍රියාත්මක කරන්න සැලසුම් කළා. එහෙම නම් මෙන්න මේ පෞද්ගලික වශයෙන් යන වැඩ පිළිවෙළ නතර කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ගොඩක් කාලය ගත්තා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ පළාත් සභාව, මේ පනත යටතේ තිබෙන බලතලත් එක්ක පළාතේ ජනතාව ඡන්දය දීලා මේ ආයතනය පිහිටුවලා අපි 104 දෙනෙකුව මේ සභාවට පත් කර තිබෙනවා. මේ පළාත් සභාවෙන් අය කරන බදු මුදල්වලින් ඒ ජනතාවට මූලා ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන්නය කියන එක ඉල්ලමින්, ඔබ ලබා දුන් අවස්ථාවට ස්තුතිවන්ත වෙමින් මේ පළාතේ මිය ගිය, දේපළ අහිමි වුණු ඒ ජනතාවට බස්නාහිර පළාතේ සියලු දෙනාගේම ශෝකය ප්‍රකාශ කරමින් මගේ අදහස් ප්‍රකාශ කිරීම නතර කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සෞඛ්‍ය ගරු අමාත්‍යතුමාට ඩෙංගු සම්බන්ධව කෙටියෙන් ප්‍රකාශයක් කරන්න පුළුවන්ද? මන්ත්‍රීරු තුන් දෙනෙක් කාරණා තුනක් ඉදිරිපත් කළා. ඉතාමත් කෙටියෙන් ඔබතුමා ඒ ගැන අදහසක් ප්‍රකාශ කරන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මට කෙටියෙන් ප්‍රකාශ කරන්න බැහැ. ඒක කියන්න ඕනෑ. හේතුව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කලිනුත් ප්‍රකාශ කළා නේ?

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට උත්තරයක් දෙන්න දෙන්න කෝ ඉස්සෙල්ලා. විනාඩියෙන්, ඒක කියලා නවතින්නම්. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාත්, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාත්, මේ සියලුම දෙනා ඉදිරිපත් කරපු අදහස් මම බොහොම අවංකව පිළිගන්නවා. අපි ඒවාට බොහොම විධිමත් සාකච්ඡාවක් පවත්වලා තමයි මේ තීන්දු අරගෙන තිබෙන්නේ. මේ තීන්දු ඊයේ වෙන කොටත් ක්‍රියාත්මකයි ගරු සභාපතිතුමනි. මේවා බොහොම ඇඟ ඇතුළෙන් කරන්නේ. මේවා ප්‍රකාශ කරන්න අවස්ථාවක් -

**ගරු ඇස්.කේ. කිඳෙල්පිටිය**
Hon. S.K. Kindelpitiya

ගරු ඇමතිතුමා මම කියන්නේ, සභාව ඒ පිළිබඳව දැනුවත් කිරීම සහ -

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැනුවත් කිරීමට අවස්ථාව ලැබුණේ නැහැ. ගරු සභාපතිතුමා කෙටියෙන් ප්‍රකාශ කරන්න කිව්වාම ඉතින් මම වාඩි වෙනවා.

**ගරු ඇස්.කේ. කිඳෙල්පිටිය**
Hon. S.K. Kindelpitiya

ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමාට -

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

බොහොම ස්තුතියි. සභාපතිතුමා කියන විධියට වැඩ කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී පෙරවරු තේ විවේකය සඳහා මෙම සභාව තාවකාලිකව අත්හිටුවනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.59 ට යළිත් රැස් විය.***

*Sitting, accordingly suspened untill 11.59 a.m. and then resumed.*

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 36(1) යටතේ අහන්න. ඔබතුමන්ලා කවුරුත් දන්නවා. මම පළාත් සභා මන්ත්‍රීවරයෙක් වාගේම ලංකා ගුරු සේවා සංගමයේත් ප්‍රධාන ලේකම්. මම පසුගිය අප්‍රේල් මාසේ 24 වැනිදා අශෝක විද්‍යාලයේ මතු වෙලා තිබෙන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාත් සමඟ සාකච්ඡාවක් කළා. නමුත් අද මම මේ සභාවේ ඇතුලේ ඉන්න මේ මොහොතේ, උදැසන මේ පාසලේ දැන් මේ වන කොට ගුරුවරු 30 කට ආසන්න ප්‍රමාණයක් ස්ථාන මාරු කරලා තිබෙනවා. තමන්ගේ දරුවන්ට වුණු අගතිය සම්බන්ධයෙන් දෙමව්පියන් පාසල ඉදිරිපිටට ඇවිල්ලා උද්ඝෝෂණයක් කරලා තිබෙනවා. මේ වන විට ඒ උද්ඝෝෂණයට පහර දීලා තිබෙනවා. මම සභාව ඇතුලේ ඉන්න කොට දෙමව්පියන්ට පහර දෙනවා. දැන් මේ විධියට ගියොත් එහෙම මම මේ සභාවේ ඉද්දී මගේ නිවසටත් පහර දෙන්න පුළුවන්. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මේ සම්බන්ධයෙන් වහාම අවධානය යොමු කළ යුතුයි. මොකද, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන් මන්ත්‍රීවරයෙක් ලෙසත්, ඒ වාගේම වෘත්තීය සමිතියක ප්‍රධානියකු ලෙසත් මම මතු කරපු මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කිසිදු අවධානයක් යොමු කරලා නැහැයි කියන කාරණය තමයි මට අවධාරණය කරන්න තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සියලුම මන්ත්‍රීවරුන්ට මම කාරුණිකව දැනුම් දෙනවා -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, මෙතුමා සභාවේ ඉන්දැද්දී එහෙම සිද්ධියක් වුණාය කියලා මෙතුමාගේ වරප්‍රසාදවලට හානියක් වෙන්නේ නැහැ. මෙතුමාට ඒ පිළිබඳව වගකීමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වගකීමක් නැහැ. ඇත්ත වශයෙන්ම නැහැ. ගරු මන්ත්‍රීතුමන්ලා මේ ප්‍රශ්නය පිළිබඳව -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම අද මේ සභාවේ හිටියේ නැත්නම්, මම අද ඉන්නේ - (බාධා කිරීම්) එකක් තමයි මම පසුගිය - (බාධා කිරීම්)

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මොකක්ද තිබෙන සම්බන්ධය එතකොට?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මීට කලින් මේ විධියටම ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක් කියලා වරප්‍රසාද යටතේ කරන ප්‍රකාශ ඊට කිසිම සම්බන්ධයක් නැහැ. වරප්‍රසාද ප්‍රශ්නයක් කියන්නේ ඔබතුමාගේ භාෂණ ප්‍රශ්නයක් වුණොත් විතරයි. ඔබතුමාගේ අදහස් ප්‍රකාශ කිරීමට මොකක් හරි බාධාවක් වුණොත් විතරයි මට තීන්දු ගන්න පුළුවන්. මේකට ඉඩ දෙන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මීට කලින් මේ පාසල ඉදිරිපිට උද්සෝෂණයක් වුණා. ඒ වෙලාවේ මම ඒ අවස්ථාවට සහභාගී වුණාම මේ ආණ්ඩු පක්ෂයේ අනුග්‍රහය සහිතව මැරවරයින් විසින් මට තර්ජනය කළා.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon.Ashoka Sapumal Ranwala

මේ ප්‍රශ්නය මේ සභාව තුළ සංවාදයට ලක් කළ ප්‍රශ්නයක්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මරණ තර්ජන කළා. අද මේ අවස්ථාවේ මම එළියේ හිටියා නම්, මම ඉන්නේ උද්සෝෂකයන් සමග.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මෙය සංවාදයට ලක් කරපු ප්‍රශ්නයක්. ඒකයි මේ ප්‍රශ්නය. ගරු මන්ත්‍රීවරයා සභාවේ සිටිද්දී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මොකක්ද මේ? අසෝක විද්‍යාලය කියන්නේ මේ රටේ තිබෙන ප්‍රධාන පාසලක්. පාසල විනාශ කරනවා. දෙමව්පියන්ට අයිතියක් නැද්ද පාසල පිළිබඳව උද්සෝෂණය කරන්න?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තමන්ගේ දරුවන්ට අගතියක් වුණාම අයිතියක් නැද්ද දෙමව්පියන්ට, උද්සෝෂණය කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. එක එක ප්‍රකාශ කරන්න එපා සභාවේදී.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ උද්සෝෂණයේ මම - (බාධා කිරීම්) මේ පහර දුන්නේ දෙමව්පියන්ට නොවෙයි මට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

36(1) කියවන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එහෙම වුණොත් පහර දෙන්නේ දෙමව්පියන්ට නොවෙයි මට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වාඩි වෙන්න.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon.Ashoka Sapumal Ranwala

හැන්සාඩ් එකේ තිබෙනවා මේක ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය වාද විවාදවලට යන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

සභාව නොතිබුණා නම් මම ඉන්නේ උද්ඝෝෂණය ළඟ. එහෙම නම් පහර දෙන්නේ දෙමව්පියන්ට නොවෙයි මට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න. 36(1) කියලා අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මොකක්ද මේ? අද මහ ඇමතිතුමා හිටියා නම් අහන්න තිබුණා. මහ ඇමතිතුමා අද අසෝක විද්‍යාලය සම්පූර්ණයෙන් විනාශ කරනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු මන්ත්‍රීතුමා, 36(1) මොකක්ද කියලා පැහැදිලි කිරීමක් කරන්න අපට දැන ගන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඊයේ පෙරෙයිදා (බාධා කිරීම්) ශිෂ්‍යත්වය කරන ළමයි, ඒ වාගේම සාමාන්‍ය පෙළ කරන අය, උසස් පෙළ කරන අය අද සියලු දෙනා අසරණ වෙලා තිබෙනවා. මෙහෙමද අධ්‍යාපන අමාත්‍යාංශය වැඩ කරන්නේ? මෙහෙමද ආණ්ඩුව වැඩ කරන්නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

සභාවේ හිටියා නම් කොහොමද වරප්‍රසාද කඩ වෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අද එතැන හිටියා නම්, ගුටි කන්නේ මම.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ හිටියා නම් නේ?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඔබතුමාගේ බොරු වරප්‍රසාද කඩ වීමෙන් මන්ත්‍රීවරු ගණනාවකගේ වරප්‍රසාද කඩ වෙනවා මෙතැන.

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වාඩි වෙන්න කහින්නේ නැතිව. ඉස්කෝලේ වනසනවා. පාසල වනසනවා. හිතුන හිතුන විධියට ගුරුවරු මාරු කරනවා. වාඩි වෙන්න කරුණාකරලා. (බාධා කිරීම්) මට නොවෙයි කියන්න ඕනෑ වාඩි වෙන්න කියලා. මේගොල්ලන්ට.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon.Ashoka Sapumal Ranwala

ගියවර පළාත් සභාවේ කථා කරපු නිසයි මේ පහර දීම සිද්ධ වුණේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මෙහෙමද අධ්‍යාපනය හසුරුවන්නේ? මෙහෙමද දරුවන්ගේ අනාගතය ගොඩ නගන්නේ? මෙහෙමද ආසියාවේ ආශ්චර්ය ගොඩ නගන්නේ? මෙහෙමද අධ්‍යාපනයේ කේන්ද්‍රය හදන්නේ? අපි අහන්නේ ඒකයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දෙමව්පියෝ අමාරුවේ දාලා හැංගිලා ඉන්නවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දෙමව්පියෝ අමාරුවේ දාන්නේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ඔබතුමා සභාව නිශ්ශබ්ද කරලා මෙතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න. සභාව නිශ්ශබ්ද කරන්න. ගරු සභාපතිතුමනි, සභාව නිශ්ශබ්ද කරලා මේකට පිළිතුරක් දෙන්න ඔබතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. මේ සභාවේ අනවශ්‍ය ප්‍රකාශ කරන්න ලැහැස්ති වෙන්න එපා. (බාධා කිරීම්) කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වන්න. මොකක්ද මේ කරන ක්‍රියාව. කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. මම ඉතාමත්ම කාරුණිකව ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා -

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අසෝක විද්‍යාලය ඇතුළේ ඉන්නේ නැති කරන කට්ටිය.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා නම් වරප්‍රසාද කමිටුවට යොමු කරලා අපි ඉදිරි කටයුතු කර ගෙන යා යුතුයි කියලා යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරනවා 36(1) රීතිය සම්බන්ධව. මොකද, මේ මන්ත්‍රීතුමන්ලා හැම කෙනෙක්ම 36(1) කිය කියා අනවශ්‍ය දේවල් ප්‍රකාශ කරන්නේ. එහෙම කරන්න එපා මේ සභාවේ. කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. කරුණාකර මම විශේෂයෙන්ම කියන්නේ, මේ මන්ත්‍රීවරුන්ට. 36(1) පිළිබඳව මම මේ ගරු මන්ත්‍රීවරුන්ගේ අවධානය යොමු කරනවා. 36(1) වරප්‍රසාද ප්‍රශ්න. 36(1). හැම තිස්සේම මේ 36(1) නේ කියන්නේ. (බාධා කිරීම්)

*"පළාත් සභා මන්ත්‍රීවරයකුට තම කටයුතු කර ගෙන යාමට අවහිර වන ආකාරයේ ක්‍රියාවක් හෝ බලපෑමක් ඇති වුවහොත් එය වරප්‍රසාද කඩ වීමක් ලෙස සැලකිය හැකිය."* පැහැදිලිද? පැහැදිලියි.

36(2) *"මන්ත්‍රීවරයෙකු පළාත් සභාවේදී කරන ලද කථාවක් හෝ ඉන් කොටසක් හෝ වැරදි ආකාරයට හෝ අර්ථ වෙනස් වන ආකාරයට හෝ ජනමාධ්‍ය මගින් හෝ අන් ලෙසකින් පළ කිරීම වරප්‍රසාද කඩ කිරීමක් වන්නේය."*

36(3) *"වරප්‍රසාද කඩ වීමක් සිදු වී ඇත්දැයි සොයා බැලීමට එම කාරණය සභා කටයුතු කාරක සභාවට යොමු කරලා, සභාපතිවරයාගේ නියෝගය මත ලේකම්වරයා ක්‍රියා කළ යුතුය."*

36(4) *"සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ලද දිනෙන් පසුව සභාපතිවරයාට සුදුසු යැයි හැඟෙන ආකාරයට ක්‍රියා කළ හැකිය."*

ඒක තමයි මේ 36 රීතියේ තිබෙන්නේ. අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට තැන් තැන්වල ප්‍රශ්න තිබෙන්න පුළුවන්. අපි දන්නවා ඒවා. ඔය වාගේ ප්‍රශ්න තිබෙනවා අද. මේ සභාවට අදාළ වන්නේ නැහැ. මේ 36(1) කියලා කොහේවත් තිබෙන දේවල් මෙතැනට ගේන්න එපා. ඔබතුමන්ලාගේ භාෂණ ප්‍රශ්නයක් වුණොත් මට කියන්න. එහෙම නැතිව මේ 36(1) කිය කියා හැමෝම එක එක ප්‍රකාශ කරනවා. මීට පස්සේ කාටවත් අවස්ථාව මම දෙන්නේ නැහැ. 36(1) කිය කියා අනවශ්‍ය ප්‍රකාශ කරන්න.

මීළඟට පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

36(1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට මේ රීතිවල තිබෙන ප්‍රශ්නය ඒකයි. මේ රීති වෙනස් කරන්න ඕනෑ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, දැන් ඔබතුමාම ප්‍රකාශ කළා, ජනමාධ්‍යයක යම් ප්‍රවෘත්තියක් පළ වීමෙන් මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාදයක් කැඩිලා තිබෙනවා නම්, එය ඉදිරිපත් කරන්න පුළුවන් කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යයෙන්. මම ඒ ගැන සොයලා බලනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දැන් මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. දිවයින පත්තරේ පස් වැනි මාසේ 30 වැනිදා පළ වෙලා තිබෙන ප්‍රවෘත්තියක් පිළිබඳව. ඒකෙන් මම හිතන්නේ, සියලුම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ වීමක් වෙලා තිබෙනවා. මේ මොන පුතා ද කියලා සොයා ගන්න ඕනෑ.

*"බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රී පුතෙක් රුපියල් ලක්ෂ 55 ක් දී කිරි ඉබ්බෙකු ගන්න හදලා."*

දැන් මේක පූගොඩ අධිකරණයේ විභාග වෙලා, මම හිතන්නේ ඇපත් තියලා තිබෙන්නේ. ඒ නිසා කොයි මන්ත්‍රීගේ මොන පුතා ද කියන එකයි ගැටළුව තිබෙන්නේ. ඒ නිසා මේ සමස්ත -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පත්තරේ මොකක්ද?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දිවයින පත්තරේ. පස් වන මාසේ 30 වැනිදා. (බාධා කිරීම්) පූගොඩ කියලා තිබෙන්නේ. හැබැයි, අර උපාලි ගුණරත්න මන්ත්‍රීතුමා කෑ ගහනවා.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මගේ පුතා ඇමරිකාවේ ඉන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අනික් එක ගරු සභාපතිතුමනි, මේ සභාව පාලනය කිරීම සඳහා මේ සභාවේ තියෙන තත්ත්වය පිළිබඳව මතක් කරන්නේ. දැන් අපේ ආණ්ඩුකාරවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය එක්ක අපි හතර වරක් මේ සභාව රැස්වෙලා තිබෙනවා. මේ සභාවේ, සභාවේ නායකයා, සභානායකවරයා තවම පත් කරන්න බැරි වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා. කරුණාකරලා වාඩි වෙන්න. නැහැ. නැහැ. ඒක ආණ්ඩු පක්ෂය කරයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සභානායක නැතිව කල් තියන්න පුළුවන්ද? ඇමතිවරුන්ට කල් තියන්න පුළුවන් කියලා තිබෙනවා. නමුත් මේ සභාවේ සභා නායකවරයාගේ වගකීම ගන්න පුද්ගලයෙක් අද මේ සභාවේ නැහැ. ඒ තත්ත්වය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාට 36(1) කියලා අනවශ්‍ය ප්‍රකාශ කරන්න දෙන්න බැහැ. කරුණාකරලා වාඩි වෙන්න. ඒක ආණ්ඩු පක්ෂයේ ප්‍රශ්නයක්.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මටත් වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මට නම් පුතෙක් ඉන්නවා. ඒ නිසා මට පත්තර කෑල්ල පෙන්නලා ඒ වාගේ ප්‍රශ්නයක් අහන්න පුළුවන්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක ඔබතුමාට අදාළ නැහැ නේ? ඔබතුමාට එතුමාගේ පෞද්ගලික දේවල් ඕනෑ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඔබතුමාටත් පුතෙක් නැද්ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට වැඩිය පුතා අහල් කීයක් කොටයිද? පුතා අහල් කීයක් කොටයිද ඔබතුමාට වැඩිය.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මෙතැන වරප්‍රසාද ප්‍රශ්නයක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමාගේ පෞද්ගලික ජීවිතය ගැන කථා කරන්න මෙතුමාට අයිතියක් නැහැ. මොන මෝඩ කථා ද කියන්නේ?

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

වැඩක් නැහැ නේ කථා කරලා. කවුද මෝඩයා කියලා තේරෙනවා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඔබතුමාට -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

මෙහෙම සභාවේ වරප්‍රසාද කඩ කරන්න බැහැ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා ගරු මන්ත්‍රීතුමන්ලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරයෙකුගේ (බාධා කිරීම්) -

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ඔබතුමා අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා. ඔබතුමා වැරදි ප්‍රකාශයක් කළේ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මොකක්ද අනවශ්‍ය ප්‍රකාශය?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුතෙක් නැද්ද කියන එක ප්‍රශ්නයක් නොවෙයි. එතුමාගේ පුතාද නැද්ද කියලා අපට අදාළ ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

එහෙම අහන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට පුතෙක් ඉන්න පුළුවන්. නමුත් මන්ත්‍රීවරයෙකුගේ -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමා, ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මහරගමට ගිහිල්ලා තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ මන්ත්‍රීවරුන්ට වැරදි චේතනා ආරෝපණය කරලා කථා කරන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මම අපහාසයක් කළේ නැහැ. ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම නම් ඔබතුමාත් ඉල්ලා අස් කර ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රශ්නයක් නේ ඔබතුමා ඇති කළේ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට මුකුත් ඇහුණේ නැහැ. මට මේ කියන දේවල් ඇහෙන්නේ නැහැ. ඇහෙන්නේ කොහොමද? පහක් හයක් කථා කරනවා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ඔබතුමාට ඇහුණේ නැත්නම් කැසට් එක දාලා බලන්න කෝ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ ඉන්නේ මගේ පුතා තමයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, මේක ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 36(1) -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉසුර ගරු මන්ත්‍රීතුමා, අනේ ඔබතුමා වාඩි වෙන්න කරුණාකරලා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට ගෞරව කරලා ඉඳ ගන්න කැමැතියි. නමුත් එතුමා කරපු ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඇහුණේ නැහැ, එතුමා කළ ප්‍රකාශය. අහෙන්නේ නැහැ නේ? මට ඇහුණේ නැහැ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

නැත්නම් සම්පූර්ණයෙන් හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ඇහුණේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඊට කලින් ඔබතුමා කළ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න. පෞද්ගලික මඩ ප්‍රහාර එල්ල කරන ඒවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මොකක්ද? විහිළුවක් කර ගන්න එපා. ඔබතුමා මට කරුණාකරලා සහාය දක්වන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

මම ඔබතුමාට සහාය දක්වනවා. ඔබතුමාටත් කේන්ති යනවා මම අහපු ප්‍රශ්නයට.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. 36(1) යටතේ. මොකද, මම නියෝජනය කරන්නේ කළුතර දිස්ත්‍රික්කය. එතකොට මේ කළුතර දිස්ත්‍රික්කයේ අහිංසක ජනතාවගේ ඡන්දයෙන් පත් වෙලා ආපු මට මේ වන විට මම හිතන්නේ, මේ එක එක මන්ත්‍රීවරු නටන විගඩම් නිසා විපතට පත් වෙලා සිටින ඒ ජනතාව පිළිබඳව කථා කරන්න අවස්ථාවක් නැති වෙලා තිබෙනවා. ඒ නිසා කරුණාකරලා මම මේ සියලුම මන්ත්‍රීවරුන්ට කියනවා. බස්නාහිර පළාතේ මේ වෙලා තිබෙන විපත සම්බන්ධව පොඩ්ඩක් හිතලා, මේ සභාව විහිළුවක් නොකර, මෙන්න මේ අවශ්‍ය කරුණට, මේ ආපදාවට ලක් වුණු ජනතාවට සේවය කරන්න වැඩ පිළිවෙළක් දියත් කරන්නය කියලා මම කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා ඔබතුමාට මොකක් හරි ප්‍රකාශයක් කරන්න තිබෙනවාද? මම දැක්කා ඔබතුමා කිහිප අවස්ථාවක්ම නැඟී සිටිනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මම වඩාත් කැමැතියි අපේ පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා කරපු යෝජනාවට. අපි දැන් මේ ප්‍රශ්නය අමතක කරලා අදාළ මාතෘකාවට බහිමු. ජනතාව අරහේ අසහනයෙන් ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන්වත් නිශ්ශබ්ද වන්න. සභා රීති අත්හිටුවලා යෝජනාවක් මට ඉදිරිපත් කරලා තිබෙනවා, මේ ආපදා තත්ත්වය පිළිබඳව සාකච්ඡාවක් ඉල්ලලා. අර පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ. එහෙම තියෙද්දී මේ විහිළු කථා කරන්නේ ඔක්කොම. සභාවේදී විහිළු ප්‍රකාශ කරන්නේ, 36(1) කියලා. පුතාලා නැති ප්‍රශ්නයි. ඒවා මේවා ඔක්කොම අදාළ නැහැ. මේ රටේ පුත්තු නැති වෙලා, රටේ පුතාලා දහස් ගණන් අහිමි වෙලා ඉන්නේ මේ. මිනිස්සු මැරිලා.

පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ යෝජනා දෙකක් න්‍යාය පත්‍රයට ඇතුළත් වෙලා තිබෙනවා. අජන්ත නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවත්, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවත්. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඇත්ත වශයෙන්ම මගෙන් ඉල්ලීමක් කළා, විෂය භාර ගරු ප්‍රධාන අමාත්‍යතුමා නොමැති නිසා එතුමාගේ යෝජනාව ලබන සභා වාරයට කල් තබන්නය කියලා. ඒ අනුව ඔබතුමාගේ එකඟතාවය අනුව එම යෝජනාව මම ලබන සභා වාරයට කල් තබනවා. ඒ වාගේම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාත් මට ඉල්ලීමක් කළා එතුමාගේ යෝජනාවත් ඊළඟ සභා වාරයට කල් තබන ලෙස. ඒ අනුව මම එම යෝජනා දෙකම ඊළඟ සභා වාරයට කල් තබනවා.

ඒත් එක්කම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කාර්ය පටිපාටි රීති 107 යටතේ මට රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මම එතුමාට මේ අවස්ථාවේදී අවසරය ලබා දෙනවා එම රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කරන ලෙස. ඒ සඳහා විනාඩි 50 ක කාලයක් වෙන් කිරීමට පක්ෂ නායකයින් එකඟ වුණා. ඒ නිසා විනාඩි 50 කට සීමා කරන්න. මොකද, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාත් සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කරීමට යෝජනාවක් මා වෙත ඉදිරිපත් කර තිබෙනවා. එය විවාද කරන්න පැය භාගයක කාලයක් වෙන් කර තිබෙන නිසා ඉතාමත් ඉක්මණටම හැකි තරම් කාලය සීමා කරලා අපි විවාද කරමුයි කියලා මම ඔබතුමන්ලාට යෝජනා කරනවා. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

## රීති අංක 107 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 107

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, "*රීති අංක 107 යටතේ - 8(5), 8(6), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීති අත්හිටුවිය යුතු යැයි*" යෝජනා කරනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS' MOTION:

# පළාතේ ආපදාවට පත් ජනතාවට සහන සැලසීම
PROVIDING RELIEF TO PEOPLE OF THE PROVINCE WHO FACED DISASTER SITUATION

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, *"දිවයින තුළ විශේෂයෙන් බස්නාහිර පළාත තුළ වර්ෂාව කාලයේ ඇති වන ජලය බැස යාමේ විධිමත් ක්‍රමවේදයක් නොමැතිකම හා ස්වභාවික ජලය බැස යාමේ මාර්ග අවහිර කරමින් හා හදිසි නාය යාම් හේතුවෙන් 20 කට ආසන්න පිරිසකට ජීවිත අහිමි වී ඇති අතර, දහස් ගණනින් ජනතාව ආපදා තත්ත්වයට පත්ව ඇත.*

*මේ හේතුවෙන් ඉදිරියටත් මෙවැනි තත්ත්ව වලක්වා ගැනීම මෙන්ම ආපදාවට පත්ව ඇති ජනතාවට කඩිනම් සහන සැලසීම පළාත් සභාව මෙන්ම මධ්‍යම රජය කඩිනම් පියවර ගත යුතු යැයි මෙම ගරු සභාව යෝජනා කරයි."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[ අ.භා. 12.16 ]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, අපි ඉතාමත් සතුටු වෙනවා. මේ සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත අපට මෙම යෝජනාව ඉදිරිපත් කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව. බස්නාහිර පළාත තුළ මේ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව මීට කලිනුත් අපේ මන්ත්‍රීතුමන්ලා, අමාත්‍යතුමන්ලා අපි සාකච්ඡා කරලා, මේ සභාවට යෝජනාවක් කරන්න තීරණය කළා. බස්නාහිර පළාත තුළ ජීවත් වන ජනතාවට මෙවැනි හදිසි ආපදා අවස්ථාවකදී මුහුණ දීමට සිද්ධ වීම තුළ, මේ පළාත් සභාවේ අපට තිබෙන බලතල අනුව, අමාත්‍යාංශ අනුව, මේ පළාතේ ජනතාවට අපි ලබා දිය යුතු සේවාව මොකක්ද කියන එක පිළිබඳව සාකච්ඡා කරලා, වැඩ බලන මහ ඇමතිතුමාත්, අපේ අමාත්‍ය මණ්ඩලයේ ඇමතිතුමන්ලාත් අපිත් නොයෙකුත් සාකච්ඡා මට්ටමින් තීරණ අරගෙන සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා තමයි අපි මේ යෝජනාව අපි ඉදිරිපත් කරන්නේ. අද අපි දකිනවා, මේ පළාතේ ජීවත් වන ජනතාව මේ පළාත් සභාව ස්ථාපිත කරන්න තමන්ට උරුම ඡන්දය පාවිච්චි කරලා, ගරු මන්ත්‍රීවරුන් පත් කරලා ඒ තුළින් මේ සභාවේ නීති හදලා තියෙනවා. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ලැබුණු 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලතල අනුව බස්නාහිර පළාත් සභාව බිහි කර ගෙන අපි මේ සේවාවන් ලබා දීමේ වැඩ පිළිවෙළ පළාතේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනවා. අද මේ ගැටළුව ඇති වුණාම - අපේ ප්‍රධාන අමාත්‍යතුමා මම හිතන්නේ, විදේශ ගත වෙලා. වැඩ බලන අපේ ප්‍රධාන අමාත්‍යවරයා හැටියට උපාලි කොඩිකාර අමාත්‍යතුමා සමග මේ කරුණු ගැන අපි සාකච්ඡා කළාම, එතුමාට යම් යම් යෝජනා ඉදිරිපත් වන කොට, මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමේ ගැටළු, නීති ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙලා තියෙනවා. අද මේ පළාතේ ජනතාව වෙනුවෙන් සේවාව කරන්න තිබෙන කොට අපට එවැනි ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මම කල්පනා කළා, මේ අසරණ වූ ජනතාවගේ ජීවිතවලට මුදලින් අපි කෝටි ගණනින් ලබා දුන්නත්, ඒ අයගේ ජීවිත, ඒ අයට අහිමි වුණු, අම්මලා, තාත්තලා, දුවලා, පුතාලා මුදල්වලින් අපට අරගෙන දෙන්න බැහැ. නමුත් අපට තිබෙන යුතුකමක් තමයි මේ ජනතාවගේ විනාශ වුණු ජීවිතය ඉක්මණටම යථා තත්ත්වයට පත් කිරීමයි. අපේ සම්ප්‍රදායන්, අපේ ක්‍රමවේදයන් අනුව මිය ගිය අය භූමදානය කරලා මේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරවීම පිළිබඳව, මේ පළාතේ ජනතාව වෙනුවෙන් අපි ලබා දිය යුතු සේවාව පිළිබඳව කඩිනමින් ගත යුතු ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක අපි ජනතාවට දැනුම් දෙන්න ඕනෑ.

මේ විනාශ වුණු ජීවිත දිහා අරගෙන බැලුවාම අපි දැක්කා අගලවත්ත ප්‍රදේශයේ කිතුල්ගොඩ කන්දක් නාය ගොසින් ඒ පස් කන්දට යට වෙලා අම්මයි දුවලා දෙන්නයි ජීවිතක්ෂයට පත් වෙනවා. තාත්තයි පුතයි විතරක් ඉතිරි වෙනවා, එකම පස් කන්දට යට වෙලා. ඒ තාත්තාවයි

පුතාවයි අපි ඊයේ ගිහිල්ලා හම්බ වුණා. ඔවුන්ගේ කතාව ඇහුවාම - ඒ කථාව තුළ කියවෙන්නේ, මෙවැනි අසරණ තත්ත්වයක් ස්වභාව දහමෙන් ඇති වීම පිළිබඳව එතුමන්ලා පුද්ගලයින්ට දෝෂාරෝපණ නගන්නේ නැහැ. නමුත් ඒ විනාශයට පත් වුණු දෙයට සහන සැලසීමක් අපේ යුතුකමක් හැටියට සළකලා පළාත් සභාවෙන් අපේ ජනතාවට සහන ලබා දිය යුතුයි. මේ පළාත් සභාවෙන් අපි ලබා දිය යුතු සහනයන්, ඒ සඳහා වූ ක්‍රමවේදය, අවශ්‍යතාවය, ලබා දිය යුතු ආකාරය මොකක්ද කියන එක අපි තීරණය කරන්න ඕනෑ.

එහෙම නම් මම ගරු ඔබතුමාගේ මාර්ගයෙන් ගරු සභාවේ අපේ සියලුම මන්ත්‍රීතුමන්ලාට, අමාත්‍ය මණ්ඩලයට ඉල්ලීමක් කරන්න ඕනෑ. මේ කළුතර දිස්ත්‍රික්කයේ තමයි වැඩි වශයෙන් විපතට පත් වුණු, අසරණ වුණු මිනිස්සු සිටින්නේ. ජීවිත අහිමි කර ගත් අය සිටින්නේ. ගෙවල් දොරවල් නැති කර ගත් අය සිටින්නේ. සත්තු සිව්පාවෝ අහිමි වුණේ. විපතට පත් අයගේ මිනිය තියා ගන්න බැරි තත්ත්වයට, එතුමන්ලාගේ ගෙවල් විනාශ වෙලා අසරණ තත්ත්වයකට පත් වෙලා සිටිනවා. එක පැත්තකින් ඒ අයට ඒක මානසික ප්‍රශ්නයක්. අනික් පැත්තෙන් අරගෙන බැලුවාම, මේ යට වෙලා විනාශ වුණු හැම ගෙයක්ම ආර්ථික අතින් ශක්තිමත් මිනිස්සු ජීවත් වෙන පවුල් නොවෙයි මේකට ගොදුරු වෙලා තිබෙන්නේ. එදා වේල - කම්කරු වෘත්තියේ යෙදිලා, කුලී වැඩක් කර ගෙන දුෂ්කර ප්‍රදේශයක කඳුවල තිබුණු ගෙවල් තමයි විනාශ වෙලා තිබෙන්නේ. එහෙම නම් මම ඔබතුමාගේ මාර්ගයෙන් යෝජනා කරන්න කැමැතියි, අපේ අමාත්‍ය මණ්ඩලයට. මේ අයගේ අවසන් කටයුතු කිරීම සඳහා. මිය ගිය අය - බොරු කරන්න බැහැ කාටවත්. ඒ ගම්වල මිනිස්සු දන්නවා. මරණ පරීක්ෂණ වාර්තා තිබෙනවා. ඒවා අරගෙන අඩුම තරමින් ඒ ආදාහන කටයුත්ත ක්‍රියාත්මක කරවා ගන්න, මේ පළාතේ ජනතාව වෙනුවෙන් එකතු කර ගන්නා බදු අරමුදල්වලින් අඩුම ගණනින් රුපියල් ලක්ෂයක හරි මුදලක් ලබා දීලා ඉක්මණට ඒ අයට මේ සහනය සලසා දෙන්න. එම සහනය බස්නාහිර පළාතෙන් ලබා දෙන්නය කියන යෝජනාව ඔබතුමාගේ මාර්ගයෙන් මේ සභාවට ඉදිරිපත් කරමින්, ඒ සහනයවත් ඉක්මණට මේ පළාත් සභාවෙන් අපි සියලු දෙනාගේම අනුමැතිය තුළ ලබා දීමට මේ යෝජනාව ස්ථිර කර ගෙන කටයුතු කරන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 12.23 ]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මෙම හදිසි ආපදා තත්ත්වයෙන් විපතට පත්ව ජීවිත හානි වූ අයට, තුවාල වූ අයට, දේපළ හානි වූ අයට බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන් අපගේ ශෝකය පළ කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හදිසි ආපදා තත්ත්වයට අපි මුහුණ දෙන්නේ, 2010 වර්ෂයේ මෙවැනි ආපදාවකට මුහුණ දුන්නාට පස්සෙයි. දේශගුණික විපර්යාසයන්හි ප්‍රතිඵලයක් විධියට දිගු නියඟයකින් පස්සේ නිරිත දිග මෝසම් සුළං ආරම්භ වීමක් සිදු වුණොත්, අනිවාර්යයෙන්ම මෙවැනි තත්ත්වයකට අපේ රට මුහුණ දීම ඉතිහාසය පුරාම සිදු වුණු දෙයක්. අපි දන්නවා, නිරිත දිග මෝසම් සුළං එන්නේ දිගු නියඟයක් තිබුණාම. ඉන්දියානු සාගරයේ ජලය වාෂ්ප වෙලා වලාකුළු සෑදීම සිද්ධ වෙලා නිරිත දිග මෝසම් සුළංවලදී සමස්ත ඉන්දියානු සාගරයේම ජල වාෂ්ප වලාකුළු විධියට මේ රටට අරන් එන නිසා මෙවැනි තත්ත්වයන්ට අපි මුහුණ දෙමින් හිටියා. නමුත් 2010 වර්ෂයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවත්, සුළු වාරිමාර්ග දෙපාර්තමේන්තුවත්, ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරිය සහ පහත් බිම් සංවර්ධන මණ්ඩලය ඒකාබද්ධ වැඩ පිළිවෙළක් දියත් කිරීමෙන්, අපේ රටේ, විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ගං වතුර තත්ත්වය සෑහෙන දුරට පාලනය කරන්න පුළුවන් වුණා. නමුත් දැඩි නියඟයක් හමාර කරමින් ඇති වුණු මේ තත්ත්වය හමුවේ අපේ ජනතාව ආපදාවට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය දින දෙකේදී අපේ හමුදාවන්, ඒ වාගේම දිසා ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සිට ගම් මට්ටමේ සිටින ග්‍රාම නිලධාරීන් දක්වා සමස්ත රාජ්‍ය යාන්ත්‍රණය මේ ආපදා ක්‍රියාවලියෙන් ජනතාවට වන හානිය අවම කිරීමටත්, ඒ වාගේම ජනතාවට අවශ්‍ය මූලික පහසුකම් සපයන්නත් යුහුසුළුව කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම මේ වන විට මේ ආපදා තත්ත්වය පහ වුණාට පස්සේ අපට සිදු වෙලා තිබෙන හානි බලලා, වගා හානි, දේපළ හානි, ජීවිත හානිවලට වන්දි ගෙවීමට කටයුතු කිරීමට අපට අවස්ථාව තිබෙනවා. විශේෂයෙන්ම 2010 වර්ෂයට ප්‍රථම පළාත් සභාව විධියට මෙවැනි කාරණා සම්බන්ධයෙන් අපි සෘජුව මැදිහත් වෙලා තිබෙනවා. නිවාස අමාත්‍යාංශය සහ සමාජ සේවා අමාත්‍යාංශය යටතේ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආපදා කළමනාකරණ නමින් වෙනම අමාත්‍යාංශයක් බිහි වීමෙන් පස්සේ මධ්‍යම ආණ්ඩුවෙන් අපෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. ආපදා කළමනාකරණ ක්‍රියාවලියට පළාත් සභාවේ මැදිහත්වීමක් කරන්න එපා. එහෙම වුණොත් ද්විත්වකරණයක්, එකම කාරණයට රජයේ මුදල්, නැත්නම් මේ මහජනතාවගේ මුදල් දෙවරක් වැය වීමේ අවදානමක් තිබෙනවා. ඒ නිසා සම්බන්ධීකරණය කිරීමේ බාධා මතු වන නිසා ආපදා කළමනාකරණයට මධ්‍යම ආණ්ඩුවට කළමනාකරණය කිරීමට අවස්ථාව සලසලා, සහාය දීම පමණක් - අරමුදල් වෙන් කිරීම අවශ්‍ය නැහැ. සහාය දීම පමණක් පළාත් සභාවෙන් බලාපොරොත්තු වෙනවාය කියන කාරණය ඉදිරිපත් වුණා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අපි සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සියලුම පක්ෂ නායකයන් වාඩි වෙලා පළාත් සභා මට්ටමෙන් මොනවාද කරන්න පුළුවන් කියලා දිගු සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවේ කරුණුත්, මේ සභාවේ මතු වන කරුණුත් සියල්ලම සැලකිල්ලට අරගෙන මේ සභාව අවසන් වූ වහාම අමාත්‍ය මණ්ඩලය රැස් වෙලා බස්නාහිර පළාත් සභාව විධියට අපට මේ වෙනුවෙන් කුමන දායකත්වයක් දැක්විය හැකිද යන්න ගැන අද අපි තීරණය කරන්න බලාපොරොත්තු වෙනවාය කියන කාරණය මේ ගරු සභාවට දැනුම් දෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.27 ]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. මේ ඇති වෙලා තිබෙන ආපදා තත්ත්වයෙන් වැඩිපුර පීඩාවට පත් වෙලා තිබෙනවා කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව. පළමු කොටම මේ ගංවතුර සහ නායයාම්වලින් ජීවිත අහිමි වූ ඒ අයගේ පවුල්වලට අපගේ ශෝකය කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දන්නවා, මීට වසර ගණනාවකට පෙර මීට වඩා බරපතළ නායයාමක් අපට අහ ගන්න ලැබුණා, අගලවත්ත ආසනයේ දොළහේන ප්‍රදේශයෙන්. මීට වඩා පවුල් ගණනාවක් ආපදාවට ලක් වුණා. නමුත් මෑත කාලයේ සිදු වුණු ආපදා තත්ත්වයන්හිදී ජනතාව බලාපොරොත්තු වන ආකාරයට ආණ්ඩුව පැත්තෙන් මැදිහත් වීම ප්‍රමාණවත් නැහැයි කියන එක මේ ආපදාවේදීත් වාර්තා වුණා. විශේෂයෙන්ම බුලත්සිංහල ආසනයේ කුඩලිගම ප්‍රදේශයට අඩු තරමින් සුළු වැස්සකින් පවා යට වන බව දැන දැනත්, ඒ ප්‍රදේශයේ ජනතාවට එහා මෙහා යන්න තරම් බෝට්ටුවක්වත් නැහැ. (බාධා කිරීමක්) එක් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ළඟ තමයි ඒ බෝට්ටුව තියෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

තෙල් නැහැ.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඔව්. ඔහු ඒක තියා ගෙන ඉන්නවා. තෙල් නැහැ. අඩු තරමින් ජනතාවට අවශ්‍ය කරන ආහාර පාන ටික ගෙනියන්නවත් ක්‍රමවේදයක් තිබුණේ නැහැ. දැන් උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා කිව්වා, පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට විශේෂ වගකීමක්, අනික් පැත්තෙන් හැකියාවක් තිබුණා, මේ ආපදා තත්ත්වයට මැදිහත් වෙන්න. හැබැයි, පසුගිය කාලයේ කරපු වෙනස්කම් නිසා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට මේ බලතල සියල්ල පවරා ගෙන පළාත් සභා මන්ත්‍රීවරු මේ ක්‍රියාවලියෙන් ඉවත් කිරීම නිසා අද අසරණ භාවයට පත් වෙලා තිබෙන්නේ ජනතාව. ඒ වාගේම මේ ආපදාවෙනුත් පස්සේ මේ කොතරම් සාකච්ඡා කළත්, ඒ ජනතාවට තමන්ගේ ජීවිත යථා තත්ත්වයට පත් කර ගන්න අවශ්‍ය කරන සේවාවවත් ලැබෙන එකක් නැහැයි කියලා මම හිතනවා,. ඒ නිසාම අපි අද මේ සියලු පක්ෂ එකතු වෙලා රීති අත්හිටුවලා මේ යෝජනාව ගත්තා වාගේම මම කැමැතියි, බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු විධියට අපි හැම දෙනාම මේ පීඩාවෙන් දුකට පත් වුණු මේ ජනතාවට සහනයක් දෙන්න. අපි හිතන්නේ, ආණ්ඩුවේ

[ ගරු නලින්ද ජයතිස්ස ]

සහනාධාර ලැබෙන කොට ගොඩක් කල් යාවි. එහෙම තමයි මීට ඉස්සෙල්ලාත් සිද්ධ වුණේ. ඒ නිසා මේ වෙලාවේදී වගකිවයුතු මහජන නියෝජිතයෝ විධියට පක්ෂ භේදයකින් තොරව අපට පුළුවන් නම් අපේ මේ මාසේ වැටුපෙන් රු. 10,000/- ක් මේ ජනතාව වෙනුවෙන් ආපදා කළමනාකරණ අරමුදලට වෙන් කරන්න, මිය ගිය පවුල්වල අයට ලබා දෙන්න. මම හිතන්නේ ඒක අපට පළාත් සභාවක් හැටියට කරන්න පුළුවන් ක්ෂණික සහනයක්. අර ආණ්ඩුවෙන් ලබා දෙන සොච්චම පස්සේ ලබා දේවි. මම හිතන්නේ, කිසිම මන්ත්‍රීවරයෙකුට ඒකට විරුද්ධ වෙන්න සදාචාරාත්මක හැකියාවක් නැහැ. හෘද සාක්ෂියට එකඟ වන එකක් නැහැ. අපි අපේ එක මාසයක වැටුපෙන් පමණක් රු. 10,000/- ක් මේ වෙනුවෙන් වෙන් කරලා, ඒ මිය ගිය ජනතාවට ලබා දෙමුයි කියන යෝජනාවත් ඉදිරිපත් කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි

[ අ.භා. 12.30 ]

**අශෝක සපුමල් රන්වල**
Hon. Ashoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මේ මොහොත වන විට ස්වභාවික විපත්තියක් නිසා බස්නාහිර පළාතේ ගම්පහ, කොළඹ, කළුතර දිස්ත්‍රික්කවල ජනතාව ඉතාමත් බරපතළ අපහසුතාවයන්වලට, තමන්ගේ එදිනෙදා ජන ජීවිතයේ බිඳ වැටීම්වලට ඒ වාගේම විදුලිය විසන්ධි වීම් සහ විදුලිය බිඳ වැටීම්වලට ලක් වී තිබෙනවා. ප්‍රධාන කොටම ඒ සියලු දෙයටම අමතරව මනුස්ස ජීවිත අහිමි වීම සහ ඒ දේපළ අහිමි වීමකට මුහුණ දීලා තිබෙනවා. ඉතාමත් බරපතළ ශෝචනීය තත්ත්වයක්. උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා ප්‍රකාශ කළ ආකාරයට මේ දැඩි නියඟයකට පස්සේ එන වර්ෂා කාලයක් තමයි. හැබැයි, අපි දන්නවා ඉතිහාසය තුළම මෙවැනි වර්ෂාවන් රටට අත්පත් වෙනවා. ඉතිහාසයේ අත්පත් වෙලා තියෙනවා. අපේ මුතුන් මිත්තන් මෙවැනි වර්ෂාවක් අවස්ථාවේදී කොහොමද මුහුණ දුන්නේ කියලා අපට ඉතිහාසයක් තිබෙනවා. අපි හොඳටම දන්නවා. කැලණි ගඟ අසබඩ ජීවත් වන මිනිස්සු විධියට. කැලණි ගඟෙන් වතුර බස්සන්නේ කොහොමද? ඇළවේලිවලින් ජල රැඳවුම් ප්‍රදේශ හරස් නොකර ඒ ජලය කැලණි ගඟට බැස යන්නේ කොහොමද කියලා. මේ මොහොත වන විටවත් කැලණි ගඟේ පිටාර මට්ටමෙන් ප්‍රදේශ යට වෙලා නැහැ. යට වෙලා තියෙන්නේ, වැහි ජලය කැලණි ගඟට බැස යන්න බැරි වීම නිසා. බොහෝ විට කළුතරත් ඉතාම ස්වල්ප ප්‍රදේශයක් විතරයි කළු ගඟේ පිටාර මට්ටමින් යට වෙලා තිබෙන්නේ. මේ අවස්ථාවේදී මේ සිද්ධ වෙලා තිබෙන්නේ, ගංගාවලට ජලය බැස යන ඇළ වේලි, මං මාවත්, ඒ වාගේම රැඳවුම් ප්‍රදේශ අවහිර කිරීමේ ප්‍රතිඵලයක් විධියට තමයි ජනතාවට මෙවැනි ශෝචනීය ඉරණමකට ගොදුරු වෙන්න සිදු වෙලා තිබෙන්නේ. අපි දන්නවා. නුවර කොළඹ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම, පළල් කිරීමේ වැඩ පිළිවෙළ තුළ නිසි පරිදි ක්‍රමානුකූලව වතුර බැස යාම සඳහා අවශ්‍ය පහසුකම් නොසැදීම නිසා අද වන කොට තුන් කාලේ ගල් කියුබ් දෙසීය, තුන්සීය ප්‍රමාණයක් දෙපස තිබෙන ඇළවේලි හරහා ගලාගෙන ගිහිල්ලා වෙල්වල තැන්පත් වෙලා තිබෙනවා.

මම හිතන්නේ තව මාස කිහිපයක් යනකොට මහ කන්නයට පසු යල කන්නයට මේ ගොවි තැන් කටයුතු කරන්න බැරිව ගොවියෝ ඉතා බරපතළ අසීරු තත්ත්වයකට මුහුණ දෙනවා. මේ වන කොට ඒ ගල් උඩින් නැවත සැරයක් අර පස් සෝදාගෙන ඇවිල්ලා සම්පූර්ණයෙන්ම වෙල් ගොඩ වෙන තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම බියගම ප්‍රදේශයේ, ගෝනහේන ප්‍රදේශයේ හදිසියේ පාරක් කිසිම සොයා බැලීමකින් තොරව කාපට් කිරීමේ ප්‍රතිඵලයක් විධියට ප්‍රදේශයේ ගෙවල් රාශියක් අද යට වෙලා තිබෙනවා. මේක දිගින් දිගටම මධ්‍යම පරිසර අධිකාරිය හරහා සිදු කරලා තිබෙනවා. මේ මොහොත වන කොට ගෝනහේන විද්‍යාලයේ විදුහල්පති ජගත් මහත්මයාගේ ගෙදර පවා අඩි 03 ක් පමණ ජලයෙන් යටවන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ සියල්ලම ස්වාභාවික විපත්තියක් නිසාම නොවෙයි. මිනිස් ක්‍රියාකාරකම් නිසා ඒ ස්වභාවික විපත්තිය අවම කර ගන්න පාවිච්චි කරපු අවම මිනිස් ක්‍රියාකාරකම් බරපතළ විධියට උත්සන්න කිරීමේ ප්‍රතිඵලයක් විධියට ජන ජීවිතය ඇද වැටිලා තිබෙනවා.

නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ විධියටම අද වන කොට දිගින් දිගටම වන්දි මුදල් ලබා ගැනීමේ පරමාර්ථය ඒ ජනතාවට දෙනවාට වාඩා ක්ෂණික අවශ්‍යතාවයක් විධියට මේ මොහොතේ ජීවිත අහිමි වීමට උත්තරයක් අවශ්‍යයි. ඒ වාගේම තමන්ගේ දේපළ හදිසියේ

අහිමි වීම නිසා ඒ දේපළ සඳහා යම් මට්ටමකට සහනයක් ලබා දීම ක්ෂණික වැඩ පිළිවෙළක් විධියට අපට අවශ්‍යයි. ඒ වාගේම මේ මොහත වන විට තමන්ගේ එදිනෙදා ජීවිතය ගෙන යන්න බැරිව, තමන්ගේ ජීවනෝපාය අහිමි වුණු ධීවර ජනතාවට, ගොවි ජනතාවට ක්ෂණික වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මෙන්න මේ ක්ෂණික අවශ්‍යතාවයට මැදිහත් වීම බස්නාහිර පළාතේ ප්‍රධාන වගකීම බවට බස්නාහිර පළාත් සභාවේ යුතුකමක් බවට පත් වෙලා තිබෙනවා. මේ යුතුකම ඉෂ්ට කිරීම සඳහා ඊට අදාළ අමාත්‍යාංශ පහක් අපට තිබෙනවා. ඒ අමාත්‍යාංශ හරහා ක්ෂණික වැඩ පිළිවෙළක් සූදානම් කරලා ජනතාව පත් වෙලා තිබෙන අසීරුතාවයන්වලට විසඳුම් සෙවිය යුතුයි. එයටත් අමතර වශයෙන් ජල රැඳවුම් ප්‍රදේශවලට - Water retention area අවහිර කරලා තිබෙන්නේ කුමන ප්‍රදේශවලද? ඒ අවහිර කිරීම් නිසා ජලය රඳවාගන්න බැරිව ක්ෂණිකව පිටාර මට්ටම් බවට පත් වෙන්නේ කුමන ප්‍රදේශද? ඒ නිසා ගෙවල් යටවීම්වලට ක්ෂණිකව භාජනය වෙන්නේ කොහොමද කියලා විද්‍යානුකූල පදනමක් මත පිහිටලා විසඳුම් සොයන්න මේ පළාත් සභාවේ පරිසර අමාත්‍යාංශය හරහා, කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ක්ෂණික වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මෙන්න මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන මේ මොහොතේ මේ ජනතාව මුහුණ දෙන ක්ෂණික ආපදාවන්ට උත්තයක් මේ අමාත්‍යාංශ හරහා දෙන එක අපේ යුතුකමක්. ඒක නිසා නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාවට මාගේත් පූර්ණ කැමැත්ත ඉදිරිපත් කරමින් මාසික වැටුපෙන් රුපියල් 10,000/- ක මුදල් ප්‍රමාණයක් ඒ අවතැන් වූ ජනතාවට, විපතට පත් වූ ජනතාවට විශේෂයෙන්ම මරණයක් සිදු වූ නිවසකට ලබා දීමට විධිමත් වැඩ පිළිවෙළක් සකසා දෙන්න කියමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

[ අ.භා. 12.35 ]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වන විට කළුතර දිස්ත්‍රික්කයේ ඉතාමත්ම වැඩි ජීවිත සංඛ්‍යාවක් නැතිවෙලා තිබෙනවා වාගේම ඇතැම් ප්‍රදේශවල මේ වන විට ඇති වෙලා තිබෙන හදිසි ආපදා තත්ත්වය උඩ මම හිතන්නේ ඒ ජනතාව ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි ඒ සියලු දෙනාටම අපේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ ශෝකය සහ කනගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

මම හිතන්නේ, දැන් තමයි අපි නිවැරදිවම මේ මාතෘකාව කථා කරන අවස්ථාව බවට පත් වෙලා තිබෙන්නේ. මම හිතන්නේ මම මීට ඉස්සෙල්ලා කිව්වා වාගේ අපි, අපේ වගකීම සහ යුතුකම් කොටස මනාව තේරුම් ගන්නේ නැතිව, මේ ආපදා තත්ත්වයවත් හරියට වටහා නොගෙන, ඒ ජීවිත හානි වුණු ජනතාව පිළිබඳවවත් පුංචි තැකීමක්වත් තකන්නේ නැතිව සමහර ගරු මන්ත්‍රීවරු මේ පළාත් සභාවේ හැසිරුණු ආකාරය පිළිබඳව ඇත්ත වශයෙන්ම මම මන්ත්‍රීවරයෙක් හැටියට මගේ කනගාටුව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා. ඊළඟට ගත්තාට පස්සේ සමහර අවස්ථාවලදී මට පෙනෙනවා, කථා කරන සමහර මන්ත්‍රීවරුන්ගේ කථාත් එක්ක බලන කොට ඒ අය පටු දේශපාලන වාසිය සඳහා කථා කරන මන්ත්‍රීවරුන් බව අපට දැනෙනවා. ඒක මම හිතන්නේ, අනිවාර්යයෙන් ඔබ සියලු දෙනාට දැනෙනවා. එක එක නම් වශයෙන් අපි නම් කරලා කියන්න ඕනෑ නැහැ, ඒ මන්ත්‍රීවරු කවුද කියන එක. ඒ නිසා අපට තිබෙන්නේ, මේ රුපියල් දහ දාහක් නොවෙයි. අපට පුළුවන් නම් මුළු වැටුපම හරි මේ අහිංසක මිය ගිය ජනතාවට ලබා දීලා සහන ලබා දෙන්න මම හිතන්නේ ඉතාමත්ම වටිනවා. ඒ නිසා මේ රු. 10,000/- විතරක් නොවෙයි. අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට, ක්ෂණිකව ඒ හානිය සිදු වුණු වෙලාවේ ඉඳලාම ඒ ජනතාවත් එක්ක ඉඳගෙන, ඒ ජනතාවට රාජ්‍ය මට්ටමෙන්, ප්‍රධාන රජයක් හැටියට ප්‍රධාන රජයේ ආධාර, ඒ වාගේම පළාත් සභාවේ සහයෝගය, පෞද්ගලික මට්ටමින් සහයෝගය ලබා දෙමින් ඉන්න මොහොතක තමයි මම හිතන්නේ රු. 10,000/- ක් ගැන කථා කරන්නේ. ඒ නිසා එම මන්ත්‍රීවරුන් දෙපළටම මම කියනවා, අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපි කැමැතියි රුපියල් 10,000/- ක් නොවෙයි මේ සම්පූර්ණ වැටුපම වුණත් පරිත්‍යාග කරන්න. ඒ අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්න ජනතාව දිහා අරගෙන බැලුවාට පස්සේ.

ඊළඟ කාරණය තමයි. මම හිතන්නේ අද වන කොට මේ මරණ සංඛ්‍යාව 20 කට ආසන්න වුණාට මීට වඩා වැඩි තත්ත්වයක් උදා වෙනවා. මොකද, අදත්, හෙටත් මේ තත්ත්වය බොහොම දරුණු විධියට පවතිනවා. ඒක නිසා මේ සම්බන්ධව මම හිතන්නේ එක අමාත්‍යාංශයක් නොවෙයි. සමාජ සේවා අමාත්‍යාංශය විතරක් නොවෙයි. නිවාස අමාත්‍යාංශය විතරක් නොවෙයි. අපේ පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ එකතු වෙලා යම්කිසි කඩිනම් වැඩ පිළිවෙළක් දියත් කරනවා නම් ඉතාම හොඳයි කියලයි

[ ගරු පියල් නිශාන්ත ]

මම අදහස් කරන්නේ. ඒ නිසා විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා. පෞද්ගලික මට්ටමින් තම තමන්ගේ ප්‍රතිරූප ගොඩ නගන්නේ නැතිව, අපි සාමූහිකව එකතු වෙලා පළාත් සභාවක් හැටියට අපේ දායකත්වය ඒ අහිංසක ජනතාවට ලබා දෙන්න කටයුතු කරන්න කියන යෝජනාව කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[ අ.භා. 12.38 ]

**ගරු ඇස්.කේ. කිඳෙල්පිටිය**
Hon. S.K. Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ අද මේ සභාවට උදෑසන පැමිණි විගසම මතු වුණු කාරණය, සාකච්ඡාවට ලක් වුණු කාරණය තමයි මේ ඇති වෙලා තිබෙන ස්වභාවික ව්‍යසන තත්ත්වය. විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කයේ ඇති වෙලා තිබෙන තත්ත්වය. මිය ගිය පුද්ගලයින්, ඒ වාගේම ඔවුන්ගේ පවුල්වල තත්ත්වය පිළිබඳව දීර්ඝ වශයෙන් අපේ මන්ත්‍රීවරු සාකච්ඡා කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දැක්කා පසු අවස්ථාවේදී සාකච්ඡා කරන කොට, අදහස් හුවමාරු කර ගන්න කොට මේ පළාත් සභාවට මෙවැනි ස්වභාවික ව්‍යසනයකදී ක්‍රියාත්මක වෙන්න බැරිද කියලා. එක අවස්ථාවකදී අපි දැක්කා. අපට කරන්න පුළුවන්ද? බැරිද? හැකියාවක් තිබෙනවාද? කියන ප්‍රශ්නය ඔබ තමුන්නාන්සේලාගේ මුහුණුවල.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපව ජනතාව පත් කරලා එව්වේ ජනතාව වෙනුවෙන් සේවය කරන්න. ජනතාවට ආපදාවක් සිද්ධ වුණු අවස්ථාවකදී ජනතා නියෝජිතයෝ හැටියට මේ සභාවට යමක් කරන්න බැරි නම්, මේ ජනතා නියෝජිතයන්ට යමක් කරන්න බැරි නම් අපි මේ සභාවේ ඉඳීමෙන් වැඩක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක අයිති මහ ආණ්ඩුවටද? එහෙම නැත්නම් ආපදා කළමනාකරණයටද? එහෙම නැත්නම් සමාජ සුභ සාධනයටද? නැත්නම් ප්‍රාදේශීය පරිපාලනයට ද කියන එක නොවෙයි ප්‍රශ්නය තියෙන්නේ. ඒක ජනතාවට වැදගත් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනතාව බලාගෙන ඉන්නේ, මේ වාගේ අවස්ථාවකදී ඔවුන් වෙනුවෙන් අපි මොනවාද කරන්නේ කියලා. ජනතාව අපව පත් කරලා එවන්නේ ඔවුන් වෙනුවෙන් පෙනී සිටින්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා, ජීවිත විශාල ගණනක් නැති වෙලා තිබෙනවා. උන් හිටි තැන් නැති වෙලා තිබෙනවා. ඒ නිසා මේ පළාතේ ජනතාව වෙනුවෙන්, ඒ දුකට පත් ජනතාව වෙනුවෙන් කරන්න බොහෝ දේවල් අප සතුව තිබෙනවා. කළ හැකි බොහෝ දේවල් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා කළුතර දිස්ත්‍රික්කයට විශාල හානියක් සිද්ධ වෙලා තිබෙනවා. මේ ප්‍රදේශවල ජීවත් වෙන්නේ, බොහොම අමාරුවෙන් එදා වේල හම්බ කර ගෙන ජීවත් වන ජනතාව. විශේෂයෙන් වතුකරයක් තිබෙනවා. ඒ වතු සේවකයන් ඉන්නවා. ඔවුන් වතුවල සේවය කරන්නේ. මේ දුප්පත් ජනතාව වෙනුවෙන් අපට සමහර වෙලාවට විකල්ප ස්ථාන ලබා දෙන්න වෙයි. ඒ විතරක් නොවෙයි. ඔවුන්ගේ නිවාස යළි පිළිසකර කරලා දෙන්න වෙයි. ඒ විතරක් නොවෙයි. මරණයට පත් වූ අය ඉන්නවා. ඔවුන් වෙනුවෙන් යම් ආධාර මුදලක් දෙන්න වෙයි. ඒ වාගේම ඔවුන්ගෙන් යැපුණු පවුල් ඉන්නවා. ඒ පවුල් වෙනුවෙන් අපට යම් දෙයක් කරන්න වෙයි. ඒ නිසා අධ්‍යාපනය ලබන ළමයි ඉන්නවා. ඔවුන්ගේ අධ්‍යාපන කටයුතුවලට අපට සහාය දෙන්න පුළුවන්. ඒ වාගේම විදුලිය බිඳ වැටීම්, ජලය සැපයීම්, විශේෂයෙන් පානීය ජල සැපයීම් ඇණ හිටලා තිබෙනවා. ඉතින් මෙවැනි කටයුතු දිහා බැලුවාම මම හිතන්නේ නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මධ්‍යම ආණ්ඩුවෙන් අපට මේවා කෙරෙන කල් බලාගෙන ඉන්න පුළුවන් කියලා. මේ මධ්‍යම ආණ්ඩුවේ යාන්ත්‍රණය කොයි විධියට පල්ලෙහා මට්ටමට ක්‍රියාත්මක වෙයිද කියලා මම දන්නේ නැහැ. ඒ පිළිබඳව අපට විශ්වාසය තියන්න බැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. විශේෂයෙන් පළාත් සභා ක්‍රමය මේ රටේ බිහි වෙන්නේම බලය බෙදා ගන්න මිසක් බදා ගන්න නොවෙයි. කියනවා නම්, මධ්‍යම ආණ්ඩුවට මේ කාරණය විතරක් ඉතිරි කරන්න කියලා. එහෙම නම් මේ හදන්නේ, බලය බෙදා ගන්න නොවෙයි බදා ගන්න. පළාත් සභාවේ නියෝජිතයෙක් හැටියට මම මේ සභාවට යෝජනා කරනවා. ඒ බලය බදා ගැනීමේ යාන්ත්‍රණයෙන් මිදිලා, බලය බෙදා ගැනීමේ යාන්ත්‍රණයට ගිහිල්ලා මේ විපතට පත් ජනතාව වෙනුවෙන් මේ පළාත් සභාවෙන් කළ හැකි දේ, උපරිමයෙන් කරන්න අපි සියලු දෙනා කැප වෙමුයි කියලා. බොහොම ස්තූතියි.

[ අ.භා. 12.43 ]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වෙලාවේදී අපි විශේෂයෙන්ම මේ ව්‍යසනයට පත් වුණු සියලුම දෙනාට අපේ කනගාටුව, ශෝකය ප්‍රකාශ කරනවා. ඇත්තටම සතුටු වෙනවා. මේ ගංවතුරෙන් යට වුණු, ව්‍යසනයට පත් වුණු අයට රජය විසින් මේ කාලය තුළ කරන්නා වූ සේවාව පිළිබඳව. මොකද, අපේ ප්‍රදේශය ගත්තාම මිල්ලනිය, බණ්ඩාරගම උදාහරණයකට ගත්තාම මේ වන විට ප්‍රාදේශීය ලේකම්වරුන්ට නියෝග කරලා, වියළි සලාක ආදී සියල්ල මේ වන කොට දෙමින් පවතිනවා.

ඒකත් එක්කම මම කථා කරන්නේ, අර සියලුම මන්ත්‍රීවරුන් කිව්වා වාගේ මේ සියල්ල කඩිනම් වෙන්න ඕනෑ. කඩිනම් වෙන ගමන් මම ඉල්ලන එකම දේ තමයි, මේ පළාත් සභාවේ අපි මෙයිට ඉස්සෙල්ලාත් ගං වතුරක් ගලපු වෙලාවේදී අපි මේ විධියටම කථා කළා. ඒ අයට ඒ වියළි සලාක හරි මොනවා හරි එදා දුන්නා. පසුව අපට මේක අමතක වෙලා ගියා. දැන් ආපහු මේක අපට මතක් වුණා. මම දකිනවා. මම ඊයේ ගිය සමහර තැන්වල - ගං වතුරයි වැහි වතුරයි කියන්නේ දෙකක්. වැහි වතුරෙන් යට වුණු අයත් හිටියා. මොකද, ඒ වහින වතුර ටික බහින්නේ නැතිව. ඒවා බැලුවාම ඒ කාණු පද්ධති සියල්ල අවහිර වෙලා. ඒක ගංවතුර නොවෙයි. ඒක වැහි වතුර. ගං වතුර කියන්නේ, ගඟක් උතුරලා එන එකත් එක්ක. මේ වැස්සත් එක්ක. අරක එහෙම නොවෙයි. අරක ඒ පළාත් පාලන ආයතන හෝ වෙන ආයතනවලින් ඒ ඇළ වේලි සුද්ධ නොවීම නිසා සිදුවන්නක්. ඉතින් මම ඉල්ලන්නේ, මේකට පළාත් සභාවේ වෙනම කමිටුවක් දාලා, මේ ගං වතුරෙන් යට වුණු, වැහි වතුරෙන් යට වුණු තැන්වලට ගිහිල්ලා, මේවා සොයලා බලලා නැවත ඒවා යට නොවෙන්න මේකට විසඳුමක් දෙන්නය කියලයි. අපට ගොඩක් දේවල් පාලනය කරන්න පුළුවන්. උදාහරණයක් හැටියට මම ඊයේ ගියා අළුබෝමුල්ල කුරුස හන්දියේ සමරනායක මාවත කියන ප්‍රදේශයට. ඒ ප්‍රදේශයට ගියාම ගෙවල් දහයක්, පහළොවක් යට වෙලා. යට වෙලා තිබෙන්නේ ගඟකින් එහෙම වතුර ඇවිල්ලා නොවෙයි. ඒ ප්‍රදේශයේ තියෙන වතුර බැහැගෙන යන්න කාණු පද්ධතිය නැති නිසා.

**ගරු උදාර රත්නායක**
Hon. Udara Rathnayake

ක්‍රමවත් කාණු පද්ධතියක් හදලා නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ නිසා මම පළාත් සභාවෙන් ඉල්ලා සිටින්නේ, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වෙල්වල ගෙවල් හදලා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේ වාගේ දේවල් පිළිබඳව කමිටුවක් පත් කරලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ආණ්ඩුව වග කියන්න ඕනෑ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

කමිටුවක් පත් කරලා මෙන්න මේවාට විසඳුම් දෙන්නය කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වෙල්වල ගෙවල් හදලා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේවා මේ විහිළුවට ලක් කරන්න ඕනෑ දේවල් නොවෙයි. මෙතුමන්ලාට අද ගං වතුරට යට වීමත් විහිළුවක් වෙලා. අද ගං වතුරෙන් ජනතාව මැරෙන එකත් විහිළුවක් වෙලා. මේක විහිළුවක් නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ආශ්චර්ය.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ආශ්චර්ය හින්දා තමයි, අපේ ප්‍රදේශවල ගත්තාම අද ගෙවල් 19 යි බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ

[ ගරු ලලිත් එල්ලාවල ]

යට වෙලා තිබෙන්නේ. මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගෙවල් 50 යි යට වෙලා තිබෙන්නේ. මෙයිට ඉස්සෙල්ලා ගං වතුරක් ගැලුවාම ගෙවල් සිය දහස් ගණනක් යට වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැහැ. එහෙම කවදාවත් යට වුණේ නැහැ. බොරු.

**ගරු එම්. ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. M. Ifthikaar Jemil Marikkar

අගලවත්තේ ගොඩක් ගෙවල් යට වෙලා තිබෙනවා මන්ත්‍රීතුමා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා බාධා කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

බොරු කියන්නේ නැහැ. තමුන්නාන්සේ දැන් මාත් එක්ක එන්න යන්න පෙන්නන්න. තමුන්නාන්සේලා ඒ තැනකටවත් ගිහිල්ලා නැතිවයි මේ කථා කරන්නේ.

**ගරු එම්. ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. M. Ifthikaar Jemil Marikkar

ගිහිල්ලා ඉන්නේ මන්ත්‍රීතුමා. එහෙම කථා කරන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලා මාත් එක්ක එන්න පෙන්වන්න. එදා ඒවා දහස් ගණන් යට වන ප්‍රදේශ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මයික්‍රෆෝනය භාවිතා කරලා බාධා කරන්න එපා. මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

සිය දහස් ගණන් යට වන තැන්වල - අද බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගෙවල් 19 යි යට වෙලා තිබෙන්නේ. මිල්ලනියේ 50 යි යට වෙලා තිබෙන්නේ. ඒකට හේතු තමයි අපේ රජය කලින් ඇළ වේලි විශාල ප්‍රමාණයක් හැදුවා. (බාධා කිරීම්) ඒ විධියට කළ නිසා - (බාධා කිරීම්) තමුන්නාන්සේලා ඇවිල්ලා බලන්න යට වුණේ නැද්ද කියලා. කොයි කාලේද? (බාධා කිරීමක්) තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලේද? මේ කළුතර දිස්ත්‍රික්කයට අඩියක් තියලා නැතිව කථා කරන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මූලාසනය අමතන්න. ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න. ගරු මන්ත්‍රීතුමන්ලා, මේක විහිළුවක් නොවෙයි. මේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඒකමතික තීන්දුවක් අරගෙන, අත්‍යවශ්‍ය යෝජනාවක් නිසා මේ රැස්වීමෙන් පස්සේ තීන්දුවක් ගන්න අදහස් ටිකක් මේ බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා මේක විහිළුවකට ගන්න එපා. මේ අදහස් සියල්ලම අවශ්‍යයි අපේ ඊළඟ සාකච්ඡාවට. ඒ නිසා ඒ ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. ඔබතුමා කථා කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඇත්තටම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒකත් එක්කම මම ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීන් පස්සේ මේ වෙලාවේදී ගෙවල් කඩා වැටීම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වෙලාවකදී අපේ සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් රු. 20,000 ක්, 30,000 ක්, 50,000 ක් දෙන්න නොවෙයි. වැඩ පිළිවෙළක් හදන්න. සමහර තැන්වල, ඒ අයට ඒ තිබෙන තැන්වල නැවත ගේ හදා ගන්න බැහැ. ක්ෂණිකව ඒ අයට ඉඩමක් ලබා දීලා සම්පූර්ණයෙන් රජයෙන් ගේ හදලා දෙන්න වැඩ පිළිවෙළක් හදලා, ඒ අයට පදිංචි වෙන්නම ගෙයක් හදලා දෙන්න පුළුවන් මට්ටමට රේඛීය අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා එහෙම වැඩ පිළිවෙළකට යන්න කියන එක මම ඉල්ලා සිටිනවා. නැත්නම් අපට අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ රුපියල් 10,000 ක් නොවෙයි. අපි මේ වෙනුවෙන් අපේ මාස දෙක තුනක පඩිය වුණත් පිරිනමන්න සූදානම්. මේක ඉවරයක් වෙනවා නම්. එහෙම ගැටළුවක් නැහැ. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ රු. 10,000 දුන්නාය කියලා මේ අයට ගැවෙන්නවත් මදී. මේ අයට එක වේලක් කන්නත් මදී. ඒ නිසා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇයි කිව්වේ 2500 න් කන්න පුළුවන් කියලා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

රු. 10,000/- නොවෙයි. මම ඉල්ලා සිටින්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අයට ඉඩමක් ලබා දෙන්න. මේ අයට නිවස තනා දීමේ වැඩ පිළිවෙළකට යන්නය කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[ අ.භා. 12.50 ]

**ගරු අරුණ දීපාල් කටුවාවලගේ**
Hon. Aruna Deepal Katuwawalage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී ඔබතුමා මූලාසනයේ සිටීම වැදගත් වෙනවා. හේතුව, කළුතර දිස්ත්‍රික්කයේ කෙනෙක් විධියට කළුතර දිස්ත්‍රික්කයේ වැඩිම හානියට පත් වෙලා තිබෙන කාරණය පිළිබඳව සංවේදීව, හොඳින්ම මේ කාරණය මේ ප්‍රශ්නයේ බැරෑරුම්කම ඔබතුමාට දැනෙනවා ඇති. ඊයේ අලුයම පමණ වන තෙක් මේ ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමාත් අපි දැක්කා අගලවත්ත, මතුගම, බුලත්සිංහල ආදී ප්‍රදේශවල මේ වෙලා තිබෙන හානිය සම්බන්ධයෙන්, ඒ ජනතාව අතරට ගිහිල්ලා, මේ කාරණය පිළිබඳව සොයලා බලලා ඒ ජනතාවට යම් අස්වැසිල්ලක් වෙන්න පුළුවන් නම් ඒ කාරණයට මූලික වෙන්න, ඒ කාරණයට දායක වෙන්න අපට අවස්ථාව ලැබුණු නිසා, මේ කාරණය ඇස් දෙකින් දැක්ක නිසා, ඒ කාරණය පිළිබඳව බරපතළතාවය දැක්ක කෙනෙක් විධියට මේ කරුණු කියන්න අවස්ථාව ලැබීම පිළිබඳව සතුටක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගං වතුරත්, වැහි වතුරත් ඒ වාගේම අක්‍රමවත් පාලනයකින් තොරව වතුර බැස යාමට තිබුණු මාර්ග ඇහිරීම නිසාත් මේ කාරණය සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම නාය යෑම් නිසා පවුල් කිහිපයක් හානියට පත් වෙලා, ඒ අයගේ මරණ කිහිපයක් සිද්ධ වෙලා, ඊයේ හවස් වෙන කොට වැලිපැන්න ප්‍රදේශයෙන් තවත් මරණ දෙකක් වාර්තා වෙලා සම්පූර්ණ මරණ සංඛ්‍යාව කළුතර දිස්ත්‍රික්කයේ 14 ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්තත්, මතුගමත්, බුලත්සිංහලත් කියන ආසන තුනේ බරපතළ තත්ත්වයේ හානියකට පත් වෙලා තිබෙනවා වාගේම ඊට අමතරව මගේ මිත්‍ර ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේ මං ජීවත් වන, එතුමා ජීවත් වන බණ්ඩාරගම ආසනයත් විශාල වශයෙන් යම් ගං වතුර හානි කර තත්ත්වයන්ට පත් වෙලා තිබෙනවා. මීට ප්‍රථම අවස්ථාවලදී යට නොවුණු ස්ථාන මේ වෙලාවේදී යට වෙලා තිබෙනවා. ඒ වාගේම උඩුවර, තලහිටිය, බෙිගමුව ආදී ප්‍රදේශ පවා ගං වතුරෙන් යට වීම සඳහා ඉතාමත් ආසන්න මට්ටමට පැමිණිලා තිබෙනවා. ඒ නිසා ගං වතුරෙන් යට වෙලා ඉන්න උදවියට යම් සහනදායි තත්ත්වයන් සහ ප්‍රතිකර්ම යොදනවා වාගේම, ආසන්න වශයෙන් වැස්ස තවමත් අඩු වෙලා නැති නිසා, මේ පවත්නා කාලගුණික තත්ත්වය එලෙසම පවතින නිසා අවධානම ආසන්නයට ඇවිල්ලා ඉන්න බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාශයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, උඩුවර තලහිටිය, බෙිගමුව, ගල්පාත, යටවර ආදී කළු ගඟ ආශ්‍රිතව ජීවත් වන උදවිය වෙනුවෙන් යම් ආරක්ෂිත වැඩ පිළිවෙළක් ගත යුතුව තිබෙනවා. මේ අවදානම - අද රාත්‍රියේ හෝ හෙට රාත්‍රියේ මේ වර්ෂාව පැවතුනොත් එහෙම ඒක කළුතර දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි. රත්නපුර දිස්ත්‍රික්කයේ වහින කොට ඒ රත්නපුර වැහි වතුර බලපානවා, කළුතර දිස්ත්‍රික්කයේ කළු ගඟ ආශ්‍රිතව ජීවත් වන උදවියට. ඒ නිසා අන්න ඒ අවධානම මත ආසන්නයේ ඉන්න උදවිය පිළිබඳවත් කල්පනා කරන්නය කියලා මේ පළාත් සභාවේ ගරු ඇමතිවරුන්ට, මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට මගේ ගෞරවනීය ඉල්ලීම කරනවා.

ඒ වාගේම මේ අවස්ථාවේදී ඉතාමත්ම ගෞරවයෙන් සඳහන් කරන්න ඕනෑ. 1936 දී පැලවත්ත ප්‍රදේශයට ගං වතුර ආවාට පස්සේ - පැලවත්ත ප්‍රදේශය 1936 ට පස්සේ යට වෙලා තිබෙන්නේ, මේ වැහි වතුරට. පැලවත්ත නගරයේ අඩි 13 ක් 12 ක් උඩට වතුර ඇවිල්ලා තිබෙනවා. සමහර වෙළඳසැල් සම්පූර්ණයෙන්ම ඇතුළේ තිබුණු භාණ්ඩත් එක්ක ගහගෙන ගිහිල්ලා තිබෙනවා. මේ සා විශාල හානියක් වෙලා තිබෙන මේ ප්‍රදේශයේ යම් යම් උදවිය ඇවිල්ලා ආහාර ද්‍රව්‍ය, වියළි ආහාර ද්‍රව්‍ය ආදී දේවල් දුන්නත් අපි දැක්ක බරපතළ තත්ත්වය තමයි ඊයේ රාත්‍රිය වන විට මේ අයට පානීය ජල පහසුකම් නැතිකම විශාල ගැටළුවක් වෙලා තිබෙනවා. ආහාර වේලක් නැතිව වේලක්, දෙවේලක් ඉන්න පුළුවන්කම තිබුණත් ඒ මිනිස්සුන්ට ඇඳිවත පමණක් ඉතිරි වෙලා ඉන්න මිනිස්සු තමයි ඉන්නේ. තමන්ගේ ගෙදර තිබුණු සියලු සකල මනාව,

[ ගරු අරුණ දීපාල් කටුවාවලගේ ]

හරි හම්බ කරපු සියලු දේ වතුරත් එක්ක ගිහිල්ලා තියෙන්නේ. ජීවිතය වතුරත් එක්ක ගිහිල්ලා තිබෙන්නේ. අනාගතය වතුරත් එක්ක ගිහිල්ලා තියෙන්නේ. ඒ මිනිස්සුන්ට පානීය ජල පහසුකම් ඉතාමත්ම කඩිනමින් ලබා දිය යුතු තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා පානීය ජල පහසුකම් ලබා දීම සඳහා බෝතල් කළ වතුර, කඩිනමින් කළුතර දිස්ත්‍රික්කයේ මේ ප්‍රදේශයන්වලට යවන්න ක්‍රමවේදයක් ලබා දෙන්නය කියන එක මම මේ සභාවෙන් ඉල්ලනවා.

ඒ වාගේම ගං වතුර බැහැලා යන කොට තමන් පාවිච්චි කරපු ළිඳේ වතුර ටික පාවිච්චි කරන්න බැරි තත්ත්වයට පත් වෙනවා. ඒ නිසා ඒ ළිං ඉහලා, යථා පරිදි, යථා තත්ත්වයට පත් කර ගන්න ක්‍රමවේදයක් මේ පළාත් සභාව මඟින් සකස් කළ යුතු වෙනවා. ඒ සඳහා යාන්ත්‍රණයක් ප්‍රාදේශීය සභාව හරහා, වෙනත් ආයතන හරහා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මේ තත්ත්වයන් දෙක මැඩ පවත්වන්නට, ඒ තත්ත්වය සකස් කර ගන්න වාර්තා කළ යුතු වෙනවා. අපේ හිතවත් උදය ගම්මන්පිල ගරු ඇමතිතුමා සඳහන් කළා වාගේ වැහි කාලය ආවේ නියං කාලය ඉවර වෙලා. එහෙම නම්, මේ කියන විධියට හොඳ පූර්ව සූදානමක් ආණ්ඩුවටත්, පළාත් සභාවටත් කල් ඇතිව කර ගන්න තිබුණු අවස්ථාවක් මග හැරිලා තිබෙනවාය කියන කාරණය කල්පනා කරන්න ඕනෑ. කාලයක් නියං තිබිලා තමයි එතුමාගේ ජල චක්‍රය අනුව, වැසි චක්‍රය අනුව වැස්සේ. ඒ නිසා හොඳින්ම මේක පාලනය කර ගන්න තිබුණු තත්ත්වයක් තිබුණා. මේ ලෙස පූර්ව සූදානමක් තිබුණා නම්. ඒ නිසා හැමදාම වතුර ආවාට පස්සේ ඒ මිනිස්සුන්ට සහන සොයනවාට වැඩියට මෙය අවම කිරීමට සහ පාලනය කිරීමට ක්‍රමවේදයක් සකස් කරන්නය කියන ඉල්ලීම කරමින් අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. මේ කාරණයට මැදිහත් වෙන්නය කියන ඉල්ලීමත් එක්ක.

[ අ.භා. 12.55 ]

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා අපේ උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාටත්, අපේ පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීතුමන්ලාටත්. මේ කාරණාවේ ප්‍රායෝගික පුද්ගලයා මම. හේතුව, මම තමයි මේ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙන්නේ. පෙරත් එහෙම තමයි. ගං වතුර. බොහොම වැදගත් කරුණු රාශියක්, අදහස් දැක්වූවා. ඒ සියල්ලම ඉතාම නිහතමානීව පිළිගන්නවා. රජය පැත්තෙනුත් මම ස්තුතිවන්ත වෙනවා කලින් කිව්වා වාගේ, අතිගරු ජනාධිපතිතුමාට. වෙනදාට වඩා කලින් - පාන්දර තුනටත් දුරකථනයට මහනුවර ඉඳලා ආමන්ත්‍රණය කළා. ඒ වාගේම අපට අවශ්‍ය පහසුකම් ලබා දුන්නා. මහින්ද අමරවීර ගරු අමාත්‍යතුමා ස්ථාන කීපයකට අපිත් එක්ක ගියා. සහයෝගයන් දුන්නා. ඒ වාගේම මේ වන විට දැනුත් මහ ලොකුවට වහිනවා. දැනුත් වහිනවා. පෙරේදා මිලි ලීටර් 447 ක වර්ෂාපතනයක් පතිත වෙලා තිබුණා. ඒ පතිත වීමත් එක්ක තමයි අපට ලොකු හානියකට මුහුණ දෙන්න සිද්ධ වුණේ. දැන් විශේෂයෙන් වර්තමාන තත්ත්වයත් එක්ක බැලුවොත් මම හිතනවා මේ කියපු බොහෝ දේවල් අපට ප්‍රායෝගිකව ඉෂ්ට කරන්න වෙනවා. දැනට පිසූ ආහාර නම් පළමුවැනි ආහාර වේලේ ඉඳලාම අපි දෙනවා. ඒ වාගේම වියළි ආහාර නම් තවම පිළිවෙළක් කර ගන්න බැරිව ගියා. ඒක අපි පිළිගන්න ඕනෑ. මම දැනුත් දුරකථනයෙන් කථා කළා. හිටපු ටික වෙලාවේ. බෝට්ටු කිහිපයක අඩුවක් තිබෙනවා. හුඟක් බෝට්ටු ලැබිලා තිබෙනවා. ඒ වුණාට බෝට්ටු කිහිපයක අඩුවක් තිබෙනවා. ඒකත් මම හිතනවා, මේ මන්ත්‍රීතුමන්ලා කාටත් අපට උදව් කරන්න පුළුවන් වෙයි. වියළි ආහාර දෙන තරමක්, ඇඳුම් පැළඳුම් දෙන තරමක්, අධ්‍යාපන උපකරණ දෙන තරමක් මේ වැඩ පිළිවෙළේ පසු විපරමක් හැටියට මන්ත්‍රීතුමන්ලා හුදෙක් පුද්ගලිකව ගිහින් දෙන්න එපා. ප්‍රාදේශීය ලේකම්තුමා අමතන්න කියලයි මම කියන්නේ. මේ කාරණාව දන්න නිසා. විශේෂයෙන් වලල්ලාවිට, අගලවත්ත, පාලින්ද නුවර, බුලත්සිංහල, මදුරාවල මතුගම සහ තවත් බොහොම ආසන්න ජල ගැලීම් ටිකක් තිබෙනවා. ඉතින් අපි දන්නවා. දේශපාලඥයන් හැටියට අර ලකුණු දා ගැනීමේ ක්‍රමවේද භාවිතා කරනවා. බඩු ලොරි ගෙනි යනවා. පොත් ලොරි ගෙනි යනවා ඇති. ඇඳුම්නුත් ගෙනියනවා ඇති. ගමට ගියාම අත්පුඩියක් ගහලා, මල් මාලයක් දාලා පිළිගන්නවා. ඉතින් එතැන ඉන්න අය බෙදා ගත්තාම - මේක අපහාස කරනවා නොවෙයි. එහෙම කියන්න හොඳම නැහැ. හැබැයි, ඒ ගංවතුර බැහැලා ගියාම සමහර ගෙවල්වල කිරි පැකට් 25 ක් 30 ක් තිබෙනවා. හාල් කිලෝ මිටි කිහිපයක් තිබෙනවා. ඇත කෙළවරේ කොස්ගුලන, වලකඩ, මෝල්කාවේ, ඉඟුරු දළුවේ, පැලෑඳ, අද්දරගොඩ, කළුගල, අතලේ වැහැලා වතුර පිරුණු තැන්වලට එහෙම යන්නේ නැහැ. ඒ නිසා ඒවාට විධිමත්

ක්‍රියාමාර්ග අපි එහේ හදලා තිබෙනවා, කළුතර මහ දිසාපතිතුමාත් එක්ක. කළුතර දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම විධිමත් ක්‍රියාමාර්ග සැලසුම් සකස් කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලා මම විශ්වාස කරනවා මේකට දායකත්වය දෙයි කියලා. මම ආරාධනා කරනවා. දැන් මම තව මොහොතකින් අගලවත්ත බලා යනවා. මට මගේ ගමනට එකතු වෙන්න නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාත්, සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාත් එක හඬින්ම එකඟ වුණා. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කොහොමටත් එනවා. ඒ වාගේම අනෙකුත් කථා කරපු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට අපි ආරාධනා කරනවා. සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමාටත්. මම හිතන්නේ, හර්ෂණත් කථා කළා නේද? හර්ෂණත් එනවා නම් හොඳයි. හර්ෂණ රාජකරුණා අපේ ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ - ආණ්ඩු පක්ෂයේ කියලා කියැවෙන්නේ. මේ පැත්තට එනවා නම් හොඳයි. විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාත්, ඔය ඔක්කොමත් එනවා නම් හොඳයි. නඩේ ගුරා මම. එක්ක ගෙන යනවා. දැන් මම යන කොට යන්න පුළුවන්. මම වාර්තාවක් ඉදිරිපත් කරනවා ඔබතුමන්ලාගේ දැන ගැනීම සඳහා. ඊයේ වෙන කොට කළුතර විපතට පත් පවුල් 40 යි. මදුරාවල 120 යි. කළුතර පවුල් 40 ට 160 ක් සාමාජිකයෝ. මදුරාවල පවුල් 120 යි. සාමාජිකයෝ 500යි. අගලවත්ත 250 යි. සාමාජිකයෝ 1000 යි. බණ්ඩාරගම පවුල් 19 යි. සාමාජිකයෝ 77 යි. පාලින්ද නුවර පවුල් 150 යි. සාමාජිකයෝ 400 යි. පානදුර 100 යි. සාමාජිකයෝ 500 යි. මතුගම 171 යි. සාමාජිකයෝ 954 යි. දොඩංගොඩ 4 යි. සාමාජිකයෝ 20 යි. බේරුවල නැහැ. බේරුවල නැති වුණත් අපට උදව් කරන්න කථා කළා අපේ -

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඉන්නවා. ප්‍රාදේශීය ලේකම්තුමාට කථා කළා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හොඳයි. අපි ඒ කටයුතුවලටත් මැදිහත් වෙනවා. වාර්තා වෙලා නැහැ. මම විශ්වාස කරනවා, තිබෙනවාය කියලා. වලල්ලාවිට පවුල් 300 යි. සාමාජිකයන් 1000 යි. මිල්ලනිය 50 යි. සාමාජිකයෝ 200 යි. ඉංගිරිය 02 යි. සාමාජිකයෝ 08 යි. බුලත්සිංහල 74 යි. සාමාජිකයෝ 296 යි. සමස්තය පවුල් 1280 යි. සාමාජිකයෝ 5116 යි. ඉතින් දැන් මේ තත්ත්වය වැඩි වෙනවා. මේ තත්ත්වය වැඩි වෙන්නේ -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු ඇමතිතුමා ගම්පහත් ඔය වාගේ තත්ත්වයක් තමයි තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හොඳයි. මම පිළිගන්නවා. මම සන්තෝෂ වෙනවා. දැන් ඔබතුමාට පුළුවන් ගම්පහ දිසාපති රත්නසිරි මහත්මයාත් එක්ක - අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ. යන කොට මහ දිසාපතිතුමා හමු වෙන්න. මම ඕනෑ නම් දුරකථන ඇමතුමක් දෙන්නම්. රත්නසිරි මහත්තයා හමු වෙන්න. එහේ වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. දැන් තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමන්ලාට මෙතැනින් බැහැර වෙලා තමන්ගේ අදාළ ප්‍රාදේශීය ලේකම්තුමා හමු වෙන්න. ප්‍රාදේශීය ලේකම්තුමා ළඟ තිබෙනවා අපි හදපු වැඩ පිළිවෙළ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේක ප්‍රායෝගික කරන්න මේ කියන්නේ. වෙන මොකකටවත් නොවෙයි. ඔබ යන, ඔබ ගෙනියන ඕනෑ දෙයක් අරගෙන කරුණාකරලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යන්න. එතැන තිබෙන සැලසුම අනුව කටයුතු සාර්ථකව ඉටු වෙනවා. බෙදීම අඩු තැන් තිබෙනවා. නොලැබුණු අය ඉන්නවා. ඒ තැන් සොයාගෙන යන්න පුළුවන්. ඉතින් ඒ විධියට බඩු දෙනවා නම්, මුදල් හදල් දෙනවා නම් රු. 10,000/- ක් හරි, කීයක් හරි දෙනවා නම් අපි ඒ සියල්ල සන්තෝෂයෙන් භාර ගන්නවා. මම හිතනවා නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා මාත් එක්ක යන කොට මුදල් අරගෙන යාවි. ඒක මටත් හයියක්. (බාධා කිරීමක්) යන කොට දෙමු ඉතින්. ඩොක්ටර් කෙනෙක් නේ? ඒ නිසා යන කොට දෙන්න පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට තිබෙනවා මේ පසු විපරම්. ඉතින් මාර්ග ප්‍රශ්න ගොඩක් තිබෙනවා. අපි පිළිගන්නවා. මහා දැවැන්ත ගං වතුරක්. ඉතින් මාර්ග හදන්න අපි ඉක්මණින් කටයුතු කරනවා. මාර්ග සම්බන්ධයෙන් හොඳ ඇමතිවරයෙක්. වැඩ පිළිවෙළක් තිබෙනවා අපේ. ඒ වාගේම නිවාස සම්බන්ධව. විශේෂයෙන් කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා මේ ගැන අවධානය කළා. අපි මේ සාකච්ඡාවෙන් පස්සේ අපේ කැබිනට් මණ්ඩලය තීන්දුවකට එනවා. මේ සම්බන්ධව විධිමත් තීන්දු වගයක් ගන්න. නැවත නිවාස ගොඩ නගලා දෙන්න. දරුවන්ගේ පොත්පත් ටික දෙන්න. දරුවන්ගේ

[ ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා ]

ඇඳුම් පැළඳුම් ටික දෙන්න. ගෙදර තිබුණු ජීවනෝපාය කඩා වැටිලා නම් ඒකට උදව් කරන්න. සෞඛ්‍ය පැත්තෙන් මටත් වගකීමක් තිබෙනවා. මම ඊයේම මහ දිසාපතිතුමාත් එක්ක කථා කරලා ඒකට වැඩ පිළිවෙළක් හැදුවා. අපි සියලු රෝහල්, සියලු වෛද්‍ය කාර්ය මණ්ඩල, සියලු PHI මහත්තුරු සූදානම් කරලා තිබෙන්නේ. අපට වතුර මෝටර්වල පොඩි අඩුවක් තිබුණා. ඊයේ රෑ 9.30 ට පමණ කථා කරලා මහින්ද සමරසිංහ ඇමතිතුමායි මමයි ඒකත් විසඳගත්තා. අපි කළුතර ඒ වැඩ පිළිවෙළ කරනවා. ඔබතුමන්ලාටත් පුළුවන් ගම්පහ සහ කොළඹ - මේ පිළිබඳ යථා අවබෝධය ඇති වෙන්න දිසාපතිතුමා හම්බ වෙන එක හොඳයි කියන එකයි කියන්නේ. ඒ වැඩ පිළිවෙළට අපි දායකත්වය දෙන්න පුළුවන්. බොහොම ස්තුතියි. මම ආරාධනා කරනවා වටගල ගරු මන්ත්‍රීතුමාට. සපුමල් රන්වල අපේ හිටපු මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා. ඒ වාගේම නලින්ද නෝද කහටපිය ගරු මන්ත්‍රීතුමා. අපේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා. දැන් මම යනවා. මගෙත් එක්ක යන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansa - Minister

මගෙත් එක්ක යමු. බොහොම ස්තුතියි.

[ අ.භා. 01.03 ]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අපේ දිස්ත්‍රික්කය ඉතාම ඛේදජනක අවස්ථාවකට පත් වුණු වෙලාවක්. ඒ වෙනුවෙන් කථා කරන්න අවස්ථාවක් ලබා දීම ගැන සතුටු වෙනවා. අද බස්නාහිර පළාතටම මේ ඛේදවාචකය බලපා තිබෙන අතර, වැඩිම ව්‍යසනයක් වෙලා තිබෙන්නේ කළුතර දිස්ත්‍රික්කයටයි කියන එක මම මතක් කරන්න කැමැතියි. ඒ වාගේම අද කිහිප දෙනෙක් කථා කළා. විශාල වශයෙන් නාය යෑම්වලට ලක් වෙලා තිබෙනවා. නාය යෑම් තුනක්. ජීවිත 14 ක් නැති වෙලා තිබෙනවා. මම ඊයේත් බලන්න ගියා. අඹගහකන්ද ගහගෙන ගිහිල්ලා, මහගම ප්‍රදේශයේ පවුල් තුනක් නැති වෙලා තිබෙනවා. විශාල ප්‍රමාණයක් අවතැන් වෙලා තිබෙනවා. ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. මම ගිය ප්‍රදේශවලට නම් ඊයේ වනකොටත් පිසූ ආහාර ලැබිලා නැහැ. ඊයේ රාත්‍රියේ ලැබිලාත් නැහැ. දවල් ලැබිලාත් නැහැ. ගරු ඇමැතිතුමනි, ඔබතුමා කිව්වාට රජය මඟින් පිසූ ආහාර ලබා දෙන්න කටයුතු කළා කියලා, මම ඊයේ මහගම ප්‍රදේශයේ රාත්‍රියේත් හිටියා. කිසිම තැනකට ඊයේ වනකල් පිසූ ආහාර ලැබිලා නැහැ. ඒ නිසා -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansa - Minister

හුඟක් එහෙම ලබා දීලා තිබෙනවා. මම ඔබතුමාටත් ආරාධනා කරනවා නොලැබුණු තැනක් තිබෙනවා නම් අපි දෙමු.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මහගම ප්‍රදේශයටම ලැබිලා නැහැ. ඒකයි මම කිව්වේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අදහස් ප්‍රකාශ කරන්න. බාධා කරන්න එපා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රාත්‍රී සහ දවල් දෙකටම ආහාර ලැබිලා නැහැ. ඉතින් ඒ නිසා ඒ පිළිබඳව සොයා බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ අයට ආහාර ප්‍රශ්න තිබෙනවා. උඩ තට්ටුවල -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansa - Minister

සොයා බලන්න -

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මට කථා කරන්න ඉඩ දෙන්න ගරු ඇමැතිතුමා

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansa - Minister

අපි සූදානම් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා බාධා කරන්න එපා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

- තට්ටු උඩ ගෙවල්වල. ඉතා අපහසුතාවයෙන් ජීවත් වන අයට සහයෝගයක් දිය යුතුයි කියලා අපි යෝජනා කරනවා. ඒ වාගේම අද වනකොට පානදුර - රත්නපුර පාර, ඉංගිරිය ප්‍රදේශයෙන් වාහන ගමන් කරන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඔබතුමාත් මමත් එකම ආසනයක් නියෝජනය කරන්නේ. අද ඉංගිරිය ප්‍රදේශයේ නිවාස දෙකයි කියලා අපේ ඇමැතිතුමා දත්ත සැපයුවා. නමුත් මම වගකීමක් ඇතිව කියනවා, ගෙවල් 450 කට වැඩිය ඉංගිරිය ප්‍රදේශයේ සම්පූර්ණයෙන් යට වෙලා තිබෙනවා කියලා. ඌරුගන, නම්පාන, අක්කර විස්ස, වගවත්ත වාගේ ප්‍රදේශවල. ඒ ප්‍රදේශ සම්පූර්ණයෙන් යට වෙලා. අද උදේ මම එනකොට ඉංගිරිය හොරණ පාරේ වාහන එන්න බැරි තත්ත්වයක් තිබෙනවා.

ඒ නිසා හිතනවාට වැඩිය විශාල වශයෙන් ගං වතුරෙන් යට වුණු ප්‍රමාණය වැඩියි. ඒ වාගේම අවාසනාවන්ත ලෙස ජීවිතක්ෂයට පත් වුණු පවුල් ගැන අපි ඉතාම කනගාටු වෙනවා. ඒ අය ජීවත් වුණු නිවසේ තමන්ගේ මිනිය තියා ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. අනුන්ගේ නිවෙස්වල ඒ අයගේ මිනිය තියාගෙන ඉන්නේ. ඒ පවුල්වල අය ඉතාම අසරණ තත්ත්වයට පත් වුණු වෙලාවක් මේ. ඒ ගැන විශේෂ අවධානය යොමු කරලා කටයුතු කරන්න රජය මැදිහත්වීම ගැන ස්තුතිවන්ත වෙනවා. කොහොම වුණත් අපි ඒ ප්‍රදේශයට ගියාම අපට දැනගන්න ලැබුණේ, රජය මගින් අවමංගල්‍ය කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් සපයා නැතුව ඇමැතිවරයෙක් ඇවිල්ලා මුදල් දීලා ඒ ගැන කටයුතු කළාය කියන එක තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට දැන ගන්න ලැබුණේ. මුදල් නැති නිසා. ඒ නිසා මම හිතනවා, මෙවැනි වෙලාවක ප්‍රාදේශීය ලේකම්වරයෙකුට අවශ්‍ය බලය පැවරීමක් නැහැ. ඒ අයට සම්පූර්ණ හැකියාව තිබෙනවා, හදිසි ආපදා වෙලාවක මුදල් වියදම් කිරීමේ බලය ඉබේම ලැබිලා තිබෙනවා. ඒ නිසා ඒ අයගේ ක්‍රියාකාරීත්වය ගැන සතුටු විය නොහැකි කියන එක මම මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාට යොමු කරනවා. පාරවල් සඳහා පස් කැපීම මේ නාය යෑමට විශාල හේතුවක් වෙනවා කියන එක. අපි දන්නවා අධිවේගී මාර්ගය සකස් කරද්දී විශාල කඳු සම්පූර්ණයෙන් කපලා පස් ඉවත් කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ඔබතුමා හොරණ ඉඳලා මහගමට ගියොත් සිය පොළකට වැඩිය පාරවල්වලට කඳු කඩාගෙන වැටිලා තිබෙනවා. පස් ගන්න විශාල වශයෙන් පාර අයිනේ කඳු කපලා තිබෙනවා. අවශ්‍ය ප්‍රමාණයට වැඩිය අඩි 30, 25, 15, 10 කපපු තැන් සිය පොළක් විතර කඩාගෙන වැටිලා තිබෙනවා. මේවා නාය යෑමේ සාධකවලට බලපානවා. කොන්ත්‍රාත්කරුවෝ පස් කපන්න තැනක් අහු වුණාම කොහෙන් හරි පස් කපලා පුරවාගෙන ගිහිල්ලා සල්ලි ගන්නවා මිසක් ඒ ගැන බලන්නේ නැහැ. මම හිතන්නේ ලෝකේ Balance එක පවත්වාගෙන යා යුතුයි. කඳු පල්ලම් තිබෙන එක ස්වභාවික දෙයක්. මම හිතන්නේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා එකඟ වෙයි. අද කඳු ඉවත් කිරීම, නාය යෑමට ලක් වීමට විශාල සාධකයක් වෙලා තිබෙනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා මහගහ තවත් කඳු තුනක් නාය යෑමේ අවධානමට ලක් වෙනවා කියලා නම් කරලා තිබෙනවා. පවුල් විශාල ගණනක් ජීවත් වෙනවා. හැකි ඉක්මණින් ඒ අයට සුදුසු ස්ථාන ලබා දීලා, නිවාස හදලා දීලා ඉවත් නොකර - ඒ අයත් මේ වාගේ තත්ත්වයකට පත් වුණොත් අපට ඒ වගකීම භාර ගන්න වෙනවා. මම ඔබතුමාට යෝජනා කරනවා. ඒ අයට නිවාසයක්, ඉඩමක් දුන්නාට යන්න බැහැ. අපේ අක්කර හතර පහ වගා කරපු දේපළ තිබෙනවා. ඒවාටත් සරිලන විධියේ යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් යන්න කැමැතියි කියන එකයි ඔවුන්ගේ අදහස වන්නේ. ඒ නිසා හොඳ සමීක්ෂණයක් කරලා විධිමත් වැඩ පිළිවෙළක් කරලා ඒ අය ඉවත් නොකළොත් මේ වාගේ ඛේදවාචකයකට පත් වුණොත් එහෙම, අපි දැනුවත්ව එහෙම වුණොත් එහෙම අපි සාමූහික වගකීමක් භාරගත යුතු අවස්ථාවක් වෙනවා. පසුව කනගාටු වෙනවාට වැඩිය දැන ගත්තු දේවල්වලට නිසි පිළියම් යෙදීම ඉතා වැදගත් කියන එක විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊයේ රාත්‍රී වනකොටත් සමහර ප්‍රදේශවල විදුලිය තිබුණේ නැහැ. විදුලිය ලබා දීමටත් - විශාල වශයෙන් ගොවිතැන්

[ ගරු පී.ඩී. අබේරත්න ]

කරලා ජනතාව ජීවත් වන ප්‍රදේශ. ඒ අයගේ වගා පාළු වෙලා තිබෙනවා. ඔබතුමා වගාවලටත් වන්දියක් දීමේ වැඩ පිළිවෙළක් යොදලා ඒ අය සෑම කෙනෙකුටම සහනයක් ලබා දෙන්න වැඩ පිළිවෙළක් යොදයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම පළාත් සභාවට මේ තිබුණු අවස්ථාව නොලැබීම අපට වුණු පාඩුවක් හැටියට අපි දකිනවා. මම යෝජනා කරනවා, දෙපාරක් ගියත් පළාත් සභාවට ආධාර ලබා දීමේ වැඩ පිළිවෙළක් අපටත් තිබිය යුතුයි. ව්‍යවස්ථාවෙන් කියනවා. ඒක මධ්‍යම රජය බලෙන් අරගත්තු දෙයක්. එය අපි ප්‍රඥප්තියක් මාර්ගයෙන්වත් සකස් කරලා හදිසි ආපදාවක් වුණු වෙලාවක මේ පළාත් සභාවත් ජනතාවට අවශ්‍ය උපකාර කිරීමේ අවස්ථාව සලසා ගැනීම අපි කාගේත් වගකීමක් වෙනවා. ඒක නිසා පක්ෂ විපක්ෂ අපි කවුරුත් එකතු වෙලා ප්‍රඥප්තියක් මාර්ගයෙන් හරි ඒ බලය ලබාගෙන මේ වාගේ ආපදාවලට උදව් කිරීමට වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි කියන එක යෝජනා කරනවා. ඒ ගැන අවධානය යොමු කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අද මෙවැනි විශාල ව්‍යසනයක් වුණු වෙලාවේ ඔබතුමන්ලා රුපියල් ලක්ෂය බැගින් දෙන්න කථා කළා. මම හිතන්නේ ලක්ෂයක් දෙන එක ප්‍රශ්නයක් නැහැ. මීට ඉස්සෙල්ලාත් නිවසක් විනාශ වුණු වෙලාවක ලක්ෂයක් දීලා තිබෙනවා. ඒ නිසා ඊට වැඩි මුදලක් හරි ගෙවන්න අවස්ථාව සලසා ගන්න පුළුවන්කම තිබෙනවා. අද තිබෙන මුදලකට අනුව ගෙයක් කැඩුණු කෙනෙකුට ලක්ෂයක් දීලා ගෙයක් හදා ගන්න පුළුවන්කමක් නැති බව ඔබතුමන්ලා අපි කවුරුත් පිළිගන්න දෙයක්. ඒ නිසා අද විශාල විනාශයකට පත් වෙලා තිබෙන වෙලාවේ ලක්ෂයක් වාගේ මුදලක් දීම මම හිතන්නේ, ගෙයක් කැඩුණු කෙනෙකුට ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ වාගේම ජීවිතයක් හානි වනකොට ලක්ෂයක් දෙනවා කියන එක ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ නිසා ජීවිතයක් හානි වුණු පවුලකට අඩුම වශයෙන් ලක්ෂ 05 ක්වත් ලබා දිය යුතුයි කියන යෝජනාව මම තමුන්නාන්සේ මාර්ගයෙන් කරන අතර, නිවසක් සාදා ගැනීමට ලක්ෂ 2 ½ ක මුදලක්වත් ලබා දීලා ඒ අයගේ ජීවිතය නැවතත් ගොඩ නඟා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන හැටියට ඉල්ලමින් මගේ ශෝකය සහ පළාත් සභාවේ ශෝකය හානියට පත් වූ සෑම පවුලකටම යොමු කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[ අ.භා. 01.09 ]

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අද අපේ කළුතර දිස්ත්‍රික්කයට විශේෂ කොට රටටම බලපා තිබෙන කාලගුණ වෙනස් වීම තුළින් ඇති වෙලා තිබෙන වර්ෂාව අනුව, විශේෂයෙන්ම අපේ බස්නාහිර පළාත් සභාව තුළ කළුතර දිස්ත්‍රික්කයේත්, කොළඹ දිස්ත්‍රික්කයේ සමහර ප්‍රදේශවලටත් මේ ආපදාව බලපා තිබෙනවා. ඒ අනුව අද මන්ත්‍රීවරු විශේෂයෙන්ම -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් විධියටත් මතු කරන්න පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි හරවත්, වැදගත් සංවාදයකදී ආණ්ඩු පක්ෂයේ පුටු හිස් වෙලා. මන්ත්‍රීවරු 07 දෙනෙක් පමණයි ඉන්නේ. ඒ හත්දෙනාගෙන් එක්කෙනෙක් හිටියත් නෑ වාගේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි තත්ත්වයක් තුළ -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

හයාමාරයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

හයාමාරයි. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

වැඩ බලන මහ ඇමැතිතුමා කථා කරන වෙලාවේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ සම්බන්ධව සාකච්ඡා කරනවා ඇති. ගරු ඇමැතිතුමා කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

ගරු ඇමැතිතුමා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

විශේෂයෙන්ම අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවලා මේ යෝජනාව ගෙනැල්ලා සභාවේ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයෙත් ගරු මන්ත්‍රීවරු 11 දෙනෙක් මේ විවාදයට සහභාගී වෙලා තිබෙනවා. දැන් කථා කරලා විතරක් අපට මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කමක් නැහැ. සභාව ඇතුළේ විවේචනය කරලා, වැරැදි පෙන්නලා, කරුණු පෙන්වලා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කමක් නැහැ. වර්ෂාව කියන එක කොයි මොහොතේ, කොයි වෙලාවේ, කොයි ආකාරයෙන් ලැබෙනවාද කියලා අපට කියන්න පුළුවන්කමකුත් නැහැ. ඒ නිසා අපි හිතපු නැති වෙලාවක මෙවැනි වර්ෂායක් ඇති වෙලා කළුතර දිස්ත්‍රික්කයේ වැඩි පිරිසකට මෙවැනි ආපදාවක් ඇති වෙලා තිබෙන වෙලාවක මම වැඩ බලන මහ ඇමැතිවරයා හැටියට මේ වනකොට නිලධාරීන් සියලු දෙනාම කැඳවලා, සාකච්ඡා කරලා මේ කරුණු අරගෙන නැවත අපේ අමාත්‍ය මණ්ඩලය කැඳවලා සාකච්ඡා කරලා නිලධාරීන් එක්ක කථා කරලා දෙන්න පුළුවන් සහන මේ අයට ලබා දෙන්නේ කොහොමද කියලා තමයි අපි බලන්න ඕනෑ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය යටතේ මේ තිබුණු බලතලත් එක්ක ඒකරාශී කරලා අපට ගෙනැල්ලා තිබෙන නීතිරීතිත් කල්පනා කරලා, මේ සියල්ලම එකට එකතු කරලා අපි මේ නීතිරීති කෙසේ වෙතත් අසරණ ජනතාවට වෙලා තිබෙන අකරතැබ්බය නිසා -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේ ගණපූරණය නොමැති බව -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මට බාධා කරන්න එපා. මට කථා කරන්න -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගණපූරණය නැතුව කාටද කථා කරන්නේ. මේ සභාවේ ගණ පූරණය නැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

ඔබතුමා මගේ කාලය නාස්ති කරන්න එපා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභාවේ ගණ පූරණය නැතුව මෙතුමාට තනියම කථා කරන්න බැහැ. මෙපමණ වැදගත් සංවාදයකදී ගණපූරණයක් නැතුව කොහොමද මේ සභාව ගෙනියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***පළාත් සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනීගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණය ඇති විය.***
*Provincial council counted, and a Quorum not being present, Division bells were ordered to be rung,*
*Later, a Quorum being present;*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් සභාවේ ගණපූරණය සම්පූර්ණයි. උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමා ඔබතුමා කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනැල්ලා ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරු 11 දෙනෙක් කථා කරලා - කථාවට වඩා ඕනෑ ක්‍රියාවලිය. අසරණ වුණු මිනිස්සු තමයි දැන් මේ ගැන දුකෙන් ඉන්නේ. ඇතුළේ ඉන්න අය නොවෙයි. මෙතැන කථා කරලා, කයිවාරු ගහලා යන අය නොවෙයි. ඒ නිසා අපේ යුතුකමක් තිබෙනවා ආණ්ඩුවක් හැටියට අතිගරු ජනාධිපතිතුමා මේ වනකොට ත්‍රිවිධ හමුදාව මේකට යොදවලා අවශ්‍ය කරන අංශ ඔක්කෝම යොදවලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට උපදෙස් දීලා, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාට උපදෙස් දීලා අපට කථා කරලා අපේ සමාජ සේවා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුව, සමෘද්ධි දෙපාර්තමේන්තුව, පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මේ අංශ සියල්ලක්ම මේ වනකොට ආපදාවට ලක් වෙලා තිබෙන, ගංවතුරෙන් හානි වෙලා තිබෙන ජනතාව වෙනුවෙන් සේවය කරන්න කටයුතු කරලා තිබෙනවා.

[ ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා ]

බස්නාහිර පළාත් සභාවක් හැටියට අපේ අමාත්‍ය මණ්ඩලය සභා රැස්වීමෙන් පසුව එකතු වෙලා අපේ නිලධාරීන් එකතු වෙලා ජනතාවට දෙන්න පුළුවන් සහන මොනවාද කියලා තෝරා බේරාගෙන අද හවස් වනකොටම මේ කටයුත්ත කරන්න අපි සූදානම් වෙනවා. ඒ නිසා අපි සතුටු වෙනවා, මෙතැන කථා කරලා අපට පොඩි ශක්තියක් දීම සම්බන්ධව. ඒ වාගේම අපි මේ කට්ටියට කියනවා. ගමට බැහැලා, කොට කලිසම ඇඳලා, ඒ මිනිස්සු ළඟට ගිහිල්ලා, ඒ මිනිස්සුන්ගේ දුක සැප බලන්න. අපේ පැත්තේ ගංවතුරක් වුණා නම්, අද මම මේ සභාවට එන්නෙත් නැහැ. මම කොට කලිසම ගහලා, ඒ මිනිස්සුන්ට පාන් ටික දීලා, බත් ටික උයලා දීලා වැඩ කටයුතු සංවිධානය කරනවා. දැන් මේ -

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මේ ඔබතුමාගේ පළාත නෙවෙයිද? වැඩ බලන මහ ඇමැති නේ? බස්නාහිර පළාත නේ මේ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

එතකොට අද මේ -

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

වැඩ බලන මහ ඇමැති නේ? බස්නාහිර පළාත නේ මේ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

මේ රට විනාශ කරපු, ගිනි තියපු -

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මේ දකුණු පළාත් සභාවේ වැඩ බලන මහ ඇමැතිද?

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා සහ වැඩ බලන ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister and Acting Chief Minister

කට්ටිය, මේවා ගැන දුක් වෙන්න එපා. රටේ රාජ්‍ය නායකයා හැටියට ඒ දිස්ත්‍රික්කයේ ඉන්න අමාත්‍යවරු ඉන්නවා. අපේ එකළොස් දෙනෙක්, දොළොස් දෙනෙක්. ඒ අය ඔක්කෝම මේ වනකොට ඒ අයට සහන ලබා දීමේ ක්‍රියාවලියේ යෙදිලා සිටිනවා. ඒ නිසා අපි පළාත් සභාවක් හැටියටත්, වැඩ බලන මහ ඇමැතිවරයා හැටියටත්, අපේ මන්ත්‍රී කණ්ඩායමේ වගකීම හැටියටත්, අපේ ඇමැතිවරුන්ගේ වගකීම හැටියටත් ඒ වගකීම සම්පූර්ණයෙන් අපි කරට අරගෙන නිලධාරීන් එක්ක එකතු වෙලා අපි මේ කටයුතු කරනවා කියන එක මතක් කරමින් මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට මගේ ගෞරවනීය ස්තුතිය සහ භක්තිය පුද කරමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා.

[ අ.භා. 01.19 ]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉතාමත් සන්තෝෂ වෙනවා පළාත් සභාවේ විවාදයක් ඇති කරමින් මේ විපතට පත් වූ ජනතාවට සහන සලසන්න ආණ්ඩු පක්ෂ, විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීවරුන් එකතු වෙලා අදහස් ඉදිරිපත් කිරීම පිළිබඳව. ඔබතුමාගේ මාර්ගයෙන් මම ඉල්ලා සිටින්නේ, මේ පළාත් සභාව හදිසි අවස්ථා අරමුදල කියන එක උපයෝගී කරගෙන අද ඇති වෙලා තිබෙන තත්ත්වයට ජනතාවට සහන ලබා දෙන්න පුළුවන් ආකාරයට එම පනතෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරවලා මේ ජනතාවට ඒ සහනය, සේවාව ලබා දෙන්න වැඩ කටයුතු කරන්න කියන මූලික ඉල්ලීම තමයි අපේ බලාපොරොත්තුව. ඒ නිසා මම ස්තුතිවන්ත වෙනවා මේ සභාව නියෝජනය කරමින් අදහස් ප්‍රකාශ කරපු මන්ත්‍රීවරු සියලු දෙනාට.

ඒ වාගේම මගේත් අප සියලු දෙනාගේත් ශෝකය පවුල්වලට පිරිනමන ගමන්ම වැඩ බලන ගරු ප්‍රධාන අමාත්‍යතුමා කිව්වා වාගේ අපේ අදහස් අරගෙන සාකච්ඡා කරලා කඩිනමින් පළාත් සභාවෙන් මේ පළාතේ ජනතාවට ලබා දිය යුතු සේවාව - එතුමන්ලාගේ බදුවලින් ලබා දෙන සේවාව දැනුවත් කරන්න වැඩ කටයුතු කරලා ඒවා ක්‍රියාත්මක කරන්න කියන එක ඉල්ලමින් අවස්ථාව ලබා දීම පිළිබඳවත් සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ අදහස් ප්‍රකාශ කළ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. හේතුව මම නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ මේ හදිසියේ වුණු තත්ත්වය නිසා ඔබ සියලු දෙනාම හොඳ වටිනා කියන අදහස් ඉදිරිපත් කළා. මේ සියලු අදහස් එකතු කරගෙන හොඳ තීන්දුවක් මේ සභාවෙන් පස්සේ ගනියි කියන එක මම විශ්වාස කරනවා. ඒ වාගේම මේ යෝජනාව පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බෙදීමක් නැහැ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සඳහා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

## රීති අංක 31(ආ) යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 31(b)

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම පාරිතෝෂිකය යනු ඔවුන් දශක කිහිපයක් තිස්සේ භුක්ති විඳි ප්‍රමුඛතම අයිතිවාසිකමකි. මෙම අයිතිය 1947 නිකුත් කරන ලද ආඥාවකින් තහවුරු කර ඇත. එපමණක් නොව 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 (1) හා (2) වගන්ති මගින් එය ඒකාබද්ධ අරමුදලේ වැය බරක් විය යුතු බවද තහවුරු කර ඇත. එමෙන්ම පාරිතෝෂිකය යනු යම් කෙනෙකුගේ යහපත් රාජ්‍ය සේවාව වෙනුවෙන් රජය විසින් ඔහුට දෙනු ලබන නිත්‍ය මුදලකින් යුත් තෑග්ගකි.*

*ඒ අනුව වසර 30, 35 රාජ්‍ය සේවාවේ නියුතු වූවකුට මෙය ත්‍යාගයක් ලෙස ලබා දෙන්නක් ලෙස සැළකුවත්, මෙලෙස ලබා දෙන පාරිතෝෂිකයෙන් යම් මුදලක් නැවත අයකර ගැනීම සඳහා වූ ක්‍රමවේදයක් කාලයක් තිස්සේ ක්‍රියාත්මක විය. ඒ අනුව ලබාගන්නා මුදලින් 50% ක් 60% ක් අතර මුදලක් නැවත අය කරන අතර 40% ත් 50% ත් අතර මුදලක් ඇත්ත පාරිතෝෂිකය (නිත්‍ය ත්‍යාගය) ලෙස විශ්‍රාමිකයාට හිමි විය.*

*ඒ අනුව විශ්‍රාමිකයාට මෙතෙක් ලැබූ පාරිතෝෂිකය වෙනුවට එය බැංකු ණයක් ලෙස ලබා දීමටත් ඔවුනගෙන් අය නොවී ඔවුන්ට ඇත්ත පාරිතෝෂිකය ලෙස ලැබුණු 40% ත් 50% ත් අතර මුදල සම්පූර්ණයෙන් අය කර ගනිමින් ඔවුන් සදාකාලිකවම බැංකුවේ ණයකරුවකු බවට පත් කරන 04/2014 චක්‍රෙල්ඛයත්, 04/2014 (සංශෝධන 1) චක්‍රෙල්ඛයත් වහා අහෝසි කළ යුතු බවත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට දැන් විය යුතු යැයි මේ සභාව යෝජනා කර සිටී.*

*එලෙසින්ම මේ වන විට විශ්‍රාම ගොස් පාරිතෝෂිකය ලබා ගැනීම සඳහා වසරකට වැඩි කාලයක සිට බලා සිටින විශ්‍රාමිකයින්ට පාරිතෝෂිකය නොගෙවා ඒ වෙනුවෙන් ඔවුන්ගේ විශ්‍රාම වැටුපෙන් මුදල් අය කිරීම ද නතර කළ යුතු බවටත් යෝජනා කර සිටී.*

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipunaarachchi

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ යෝජනාව සම්බන්ධව කාලය විනාඩි 30 කට සීමා කරනවා. ආණ්ඩු පක්ෂයට සහ විපක්ෂයට විනාඩි 15 බැගින් වෙන් වෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේ අපේ මන්ත්‍රීවරු විශාල පිරිසක් රට තුළ ඇති වෙලා තිබෙන ආපදා තත්ත්වය නිසා තමන්ගේ ප්‍රදේශවල ජනතාව වෙනුවෙන් ඒ ප්‍රදේශවලට ගිහිල්ලා තිබෙන අවස්ථාවකදී සභාවේ ගණපූරණය පිළිබඳව ප්‍රශ්නයක් පැන නැඟෙනවා. ඒ නිසා ගණපූරණය පිළිබඳව විමසා සිටින ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

# 12 (1) රීතිය යටතේ කල් තැබීම
ADJOURNMENT UNDER RULE NO. 12(1)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ වනතුරුත් සභාවේ ගණ පූර්ණය සම්පූර්ණ වී නොමැති නිසා, 12 (1) රීතිය යටතේ *"මම දැන් මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.29 ට, 2014 ජූනි මස 17 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 01.29 p.m till 9.30 a.m. on 17.06.2014*